ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත

---

[සහතිකය සටහන් කළේ 2009 අප්‍රේල් මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අප්‍රේල් මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු. 76.00 යි. තැපැල් ගාස්තුව : රු. 17.50 යි

# 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත

[සහතිකය සටහන් කළේ 2009 අප්‍රේල් මස 08 වන දින]

එල්. ඩී.—ඕ. 57/2006.

**ශ්‍රී ලංකාව තුළ විදුලි බලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, සැපයීම සහ භාවිතය විධිමත් කිරීමේ විධිවිධාන සැලැස්වීම සඳහා ද ; 2002 අංක 28 දරන විදුලිබල ප්‍රතිසංස්කරණ පනත සහ (205 වන අධිකාරය වූ) විදුලිබල පනත ඉවත් කිරීම සඳහා ද ; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

අනාගතයේ දී වැඩිවන විදුලිබල ඉල්ලුමට මුහුණදීමේ හැකියාවක් ශ්‍රී ලංකාව තුළ ඇති කරලීමේ අදහස ඇතිව විදුලිබලය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කරනු ලැබ ඇති හෙයින් ද : පූර්විකාව.

තව ද, ශ්‍රී ලංකාව තුළ විදුලි බලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, සැපයීම සහ භාවිතය විධිමත් කිරීම සහ වෙනත් සම්බන්ධිත ඇතැම් කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම මගින් මෙම ප්‍රතිපත්තිය බලාත්මක කිරීම අවශ්‍යව ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

## I වන පරිච්ඡේදය

## ප්‍රාරම්භය

2. (1) මේ පනතේ විධිවිධානවල පරිපාලන කටයුතු (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පිරිනමන ලද හෝ පවරන ලද සියලු බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුතු ය. පනතේ පරිපාලන කටයුතු.

(2) මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පිරිනමන ලද හෝ පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා

CM 0011353—500 (02/2010)

මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතින් කොමිෂන් සභාවට දී ඇති හෝ පවරා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට අමතරව වන අතර, ඒවායේ බලහීන කිරීමක් වශයෙන් නොවන්නේ ය.

## II වන පරිච්ඡේදය

## කොමිෂන් සභාවේ කර්තව්‍ය

කොමිෂන් සභාවේ කර්තව්‍ය.

**3**. (1) කොමිෂන් සභාවේ කර්තව්‍ය විය යුත්තේ ශ්‍රී ලංකාව තුළ විදුලිබල කර්මාන්තය සඳහා ආර්ථික, තාක්ෂණික හා ආරක්ෂක නියාමක වශයෙන් ක්‍රියා කිරීම සහ—

(අ) ශ්‍රී ලංකාව තුළ විදුලි බලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, සැපයීම සහ භාවිතයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම ;

(ආ) මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති කාරණාවලට අදාළව බලපත්‍ර දීමේ, නියාමනය කිරීමේ හා පරීක්ෂා කිරීමේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකාව තුළ විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදාහැරීම, සැපයීම සහ භාවිතයට අදාළ පරිචය සංග්‍රහ සහ මේ පනත යටතේ ඒ සම්බන්ධයෙන් පනවන ලද අනෙකුත් අවශ්‍යතා නියාමනය කිරීම හා ක්‍රියාත්මක කිරීම ;

(ඇ) බලපත්‍රලාභීන් විසින් කලින් කල වැඩි දියුණු කරනු ලැබිය යුතු යයි නියමිත යම් තාක්ෂණික හා කාර්යාත්මක සංග්‍රහ සහ ප්‍රමිති අනුමත කිරීම ;

(ඈ) ස්වකීය පාරිභෝගිකයන්ට වඩාත් ලාභදායක සහ කාර්යක්ෂම සේවයක් ලබාදීම සහතික කිරීමේ අරමුණින් බලපත්‍රලාභීන් හා වෙනත් විදුලිබල ව්‍යාපාරවලින් අයකරනු ලබන ගාස්තු සහ වෙනත් අයකිරීම් නියාමනය කිරීම ;

(ඉ) මේ පනතේ 23 සිට 29 දක්වා වූ වගන්ති යටතේ හා I වන හා II වන උපලේඛනවලින් උද්ගතවන පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් හා වගකීම් දැක්වෙන ප්‍රකාශයක් සම්ප්‍රේෂණය කිරීම සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විමසීමෙන් පසුව පළ කිරීම ;

(ඊ) ශ්‍රී ලංකාව තුළ විදුලි බලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදාහැරීම, සැපයීම හා භාවිතයට අදාළ තොරතුරු එකතු කිරීම හා වාර්තාගත කිරීම ;

(උ) විදුලි බලය සැපයීමේ හා මාගත සේවාවන් පිළිබඳ ආරක්ෂාව, තත්ත්වය, අඛණ්ඩතාව හා විශ්වාසනීයතාවයට අදාළ තාක්ෂණික හා වෙනත් ප්‍රමිති සකස් කිරීම හා බලාත්මක කිරීම ;

(ඌ) විදුලි බලය කාර්යක්ෂම ලෙස භාවිත කිරීම හා සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම ;

(එ) මේ පනත බලාත්මක වීමෙන් මාස තුනක් ඇතුළත, මේ පනත මගින් හෝ ඒ යටතේ කොමිෂන් සභාව වෙත පවරන ලද කර්තව්‍යවලට අදාළ මහා පරිචය පිළිබඳ වූ සංග්‍රහයක් ඇතුළත් නියාමන සංග්‍රහයක් පිළියෙල කිරීම සහ ඉනික්බිතිව, කලින් කල එය ප්‍රතිශෝධනය කිරීම ;

(ඒ) මේ පනතින් පවරන ලද හෝ වෙන් කර දෙන ලද කර්තව්‍යවලට අදාළ වූ කිසියම් කාරණයක් නියාමන සංග්‍රහයෙහි නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමා තුළ දී සහ ආකාරයෙන් නොනවත්වා කරගෙන යාම ;

(ඔ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ තීරණ මගින් බලපෑම් සිදු වන බව සලකන හෝ සිදුවීමට හැකි යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක්, කොමිෂන් සභාව උචිත යයි සලකන තාක් ප්‍රමාණයට විමසා බැලීම ;

(ඕ) කොමිෂන් සභාවේ කර්තව්‍ය ඵලදායී ලෙස ඉටු කර ගැනීමට උචිත යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන ආනුෂංගික හෝ උපයෝගී වන සියලු පියවර ගැනීම.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය මගින් කොමිෂන් සභාව වෙත ප්‍රදානය කර ඇති බලපත්‍ර ලබාදීමේ කර්තව්‍ය ඉටු කිරීමේ දී සියලු අවස්ථාවන්හි දී ම ශ්‍රී ලංකාව පුරා සම්බන්ධීකරණය කරන ලද, කාර්යක්ෂමවත් සහ ලාභදායී විදුලිබල සැපයුම් පද්ධතියක් සපයනු ලබන බවට සහ පවත්වාගෙන යනු ලබන බවට, කොමිෂන් සභාව සහතික කළ යුතු ය.

4. (1) මේ පනත මගින් හෝ ඒ යටතේ කොමිෂන් සභාව වෙත පවරන ලද කර්තව්‍ය ඉතාමත්ම සුදුසු යයි කොමිෂන් සභාව සලකන ආකාරයකින්,— අරමුණු

(අ) විදුලි බලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදාහැරීම හා සැපයීමෙහි හෝ ඒ හා සම්බන්ධ වාණිජ කටයුතුවල නිරතව සිටින තැනැත්තන් විසින් කාර්යක්ෂමතාව, ආර්ථිකය හා ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම මගින් විදුලි බලය සැපයීමට අදාළ පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ;

(ආ) ශ්‍රී ලංකාවේ විදුලි බලය සඳහා වූ සියලු ඉල්ලීම් ලබාදීම සුරක්ෂණය කිරීම සඳහා ;

(ඇ) කාර්යක්ෂම ලෙස ක්‍රියා කරන බලපත්‍රලාභීන්ට ස්වකීය බලපත්‍ර මගින් බලය දී ඇත්තා වූ හෝ නියම කරනු ලැබ ඇත්තා වූ කටයුතු කරගෙන යාමට මුදල් ආධාර දීමේ රැකවරණය ලබාදීම සඳහා ;

(ඈ) පරිශ්‍රවලට සපයන ලද විදුලි බලය කාර්යක්ෂම ලෙස භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ;

(ඉ) විදුලි බලය උත්පාදනය කිරීමෙන්, සම්ප්‍රේෂණයෙන්, බෙදා හැරීමෙන්, සැපයීමෙන් හෝ භාවිතයෙන් උද්ගත වන අනතුරුවලින් මහජනයා ආරක්ෂා කිරීම සඳහා ;

(ඊ) මධ්‍යම පරිසර අධිකාරිය විසින් හෝ අදාළ වූ විටෙක පළාත් සභාවක් විසින් හෝ කොමිෂන් සභාව වෙත දැනුම් දෙන ලද පාරිසරික අරමුණු සම්බන්ධයෙන් වූ යම් මහ පෙන්වීමක් ක්‍රියාත්මක කිරීම සඳහා ; සහ

(උ) උචිත අවස්ථාවක දී තරගකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ද,

කොමිෂන් සභාව විසින් ඉටුකරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ "පාරිභෝගික අයිතිවාසිකම්" යන්නට, වර්තමාන හා අනාගත පාරිභෝගිකයන්ගේ,—

(අ) විදුලි බලය සැපයීම පිළිබඳව අයකරනු ලබන මිල ගණන් හා වෙනත් නියමයන් ;

(ආ) විදුලි බලය සැපයීමට පවත්නා ප්‍රමාණය සහ එහි අඛණ්ඩතාව ;

(ඇ) සපයනු ලබන විදුලි බලය සැපයීම් සේවාවන්හි තත්ත්වය ; සහ

(ඈ) ඔවුන්ගේ පරිශ්‍රවලට ඇතුල්වීම සඳහා මේ පනත යටතේ පිරිනැමුණු අයිතිවාසිකම් කිසිවක් ක්‍රියාත්මක කිරීම,

පිළිබඳ අයිතිවාසිකම් ඇතුළත් වේ.

අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු පොදු ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ.

5. (1) විදුලිබල කර්මාන්තය සම්බන්ධයෙන් වූ පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සකස් කිරීම පිණිස අමාත්‍යවරයාට බලය තිබිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සකස් කිරීමේ දී, අමාත්‍යවරයා විසින් අනෙකුත් කාරණා අතර, පහත සඳහන් කාරණා සැලකිල්ලට ගනු ලැබිය යුතු ය :—

(අ) (i) ග්‍රාමීය ප්‍රදේශ ද ඇතුළත්ව, විවිධ භූගෝල විද්‍යාත්මක ප්‍රදේශ සම්බන්ධයෙන් ; සහ

(ii) විවිධ සමාජ, ආර්ථික කණ්ඩායම් සම්බන්ධයෙන්, අවශ්‍යතා ඇතුළුව, ශක්තිමත් ආර්ථික වර්ධනයක් සඳහා ජාතික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකිවනු පිණිස ශ්‍රී ලංකාවෙහි විදුලිබල අවශ්‍යතා ;

(ආ) නව විදුලිබල උත්පාදනය සඳහා ඉන්ධන විවිධත්වය සහ වරණීය ඉන්ධන ;

(ඇ) (අ) ඡේදයේ දක්වන ලද අවශ්‍යතා සපුරාලීමේ දී ප්‍රමුඛතාවන් සහ අරමුණු ;

(ඈ) තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා පහසුකම් සැලැස්වීමට විදුලිබලය සැපයීම සම්බන්ධයෙන් වන මිල ප්‍රතිපත්තිය ;

(ඉ) ඉහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ අමාත්‍යවරයා විසින් අනුමතය සඳහා කැබිනට් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද මාර්ගෝපදේශ සඳහා වූ සියලු සංශෝධන සඳහා ද කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලබා ගැනීම අවශ්‍ය වේ.

6. (1) මේ පනතේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් විදුලි පරීක්ෂකවරු පත් කරනු ලැබිය හැකි ය. විදුලි පරීක්ෂකවරු.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විදුලි පරීක්ෂකවරයකුගේ කාර්යය විය යුත්තේ—

(අ) විදුලි බලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදාහැරීම හෝ සැපයීම සඳහා බලපත්‍රයක් මගින් බලය දී ඇත්තා වූ හෝ බලපත්‍රයක් ලබා ගැනීමේ නියමයෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ තැනැත්තකුට අයත් විදුලි මාර්ග හා විදුලි පිරියත සෝදිසි කිරීම හා පරීක්ෂා කිරීම ;

(ආ) ඒ තැනැත්තන් විසින් විදුලි බලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම හෝ සැපයීම පරීක්ෂා කිරීම ;

(ඇ) යම් පාරිභෝගිකයකුගේ පරිශ්‍රයක ඇති රැහැන් හෝ පිරියත මේ පනතින් පනවනු ලැබ ඇති යම් නියමයක් අනුව ඒ රැහැන්

හෝ පිරියත මගින් විදුලි බලය සැපයීම කරනු ලැබ ඇත්දැයි නිසැකව දැනගැනීමේ කාර්යය සඳහා, සෝදිසි කිරීම හා පරීක්ෂා කිරීම යම් පාරිභෝගිකයකුට අවශ්‍ය වුවහොත් සහ අවශ්‍ය වූ විටෙක ඒ රැහැන් හා පිරියත සෝදිසි කිරීම හා පරීක්ෂා කිරීම ;

(ඈ) නියෝග මගින් හෝ කොමිෂන් සභාව විසින් එසේ නිශ්චය කර ඇත්නම් ඔහු හෝ ඇය වෙත පනවනු ලැබිය හැකි වෙනත් යම් කර්තව්‍ය කිරීම.

(3) (අ) විදුලි පරීක්ෂකවරුන්ට නියම කරනු ලැබූ කාර්යය කිසිවක් කළයුතු ආකාරය හා වේලාවන් නියම කරමින් ;

(ආ) විදුලි බලය උත්පාදනය කිරීමට, සම්ප්‍රේෂණය කිරීමට, බෙදා හැරීමට හෝ සැපයීමට බලපත්‍රයක් මගින් බලය දී ඇත්තා වූ හෝ බලපත්‍රයක් ලබා ගැනීමේ නියමයෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ තැනැත්තන් විසින්—

(i) වාර්තා හෝ වෙනත් තොරතුරු විදුලි පරීක්ෂකවරුන් වෙත සැපයිය යුතු බවට ; සහ

(ii) පරිශ්‍රවලට ප්‍රවේශ වීමට සහ විදුලි පිරියත හා වෙනත් පහසුකම් භාවිත කිරීමට විදුලි පරීක්ෂකවරුන්ට අවසර දිය යුතු බවට,

ඒ තැනැත්තාට නියම කරමින් ;

(ඇ) විදුලි පරීක්ෂකවරුන්ට ගෙවිය යුතු යම් ගාස්තුවක් වේනොත් ඒ ගාස්තු ප්‍රමාණය හා ඒ ගාස්තු ගෙවිය යුත්තේ කවර තැනැත්තන් විසින් ද යන්න නියම කරමින් ;

(ඈ) විදුලි පරීක්ෂකවරුන්ගේ කටයුතු විගණනය කිරීම සඳහා කාර්ය පරිපාටියක් නියම කරමින් ;

(ඉ) කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි අවස්ථානුගත කරුණු අනුව, විදුලි බලය සැපයීමට ඇති බැඳීමෙන් බලපත්‍රලාභියකු මුදාහැරිය හැකි අවස්ථා නියම කරමින් ; සහ

(ඊ) විදුලි පරීක්ෂකවරයකු හා පාරිභෝගිකයකු හෝ බලපත්‍රලාභියකු අතර ආරාවුල් තීරණය කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය දක්වාලමින්,

නියෝග සාදනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ විදුලි පරීක්ෂකවරුන් විසින් ලබා ගන්නා ගාස්තු කිසිවක් කොමිෂන් සභාවේ අරමුදලට බැරකරනු ලැබිය යුතු ය.

## III වන පරිච්ඡේදය

### I වන කොටස

### බලපත්‍ර දීම

7. (1) යම් තැනැත්තකු විසින්—

බලපත්‍ර රහිතව විදුලි බලය සැපයීම ආදිය තහනම් කිරීම.

(අ) විදුලි බලය උත්පාදනය කිරීම ;

(ආ) විදුලි බලය සම්ප්‍රේෂණය කිරීම ; හෝ

(ඇ) යම් පරිශ්‍රයකට සැපයීමක් ලබාදීමේ හෝ යම් පරිශ්‍රයකට සැපයීමක් ලබාදීමට හැකි කරවීමේ කාර්යය සඳහා විදුලි බලය බෙදාහැරීම සහ සැපයීම හෝ විදුලි බලය බෙදා හැරීම හෝ සැපයීම,

මේ පනත යටතේ දෙන ලද බලපත්‍රයක් මගින් ඔහුට බලය දෙනු ලැබ ඇත්නම් හෝ 10 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමෙන් ඔහු නිදහස් කරනු ලැබ ඇත්නම් මිස, කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ එකකට නොඅඩු වන හා රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට සහ වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද තවදුරටත් කරගෙන යනු ලබන අවස්ථාවක, එම වරද එසේ තවදුරටත් කරගෙන යනු ලබන එක් එක් දවස සඳහා, එකී වරද කරනු ලැබීමේ දී පනවනු ලැබූ දඩ මුදලට සමාන අමතර දඩ මුදලකින් දඬුවම් කිරීමට යටත් වන්නේ ය.

(3) යම් තැනැත්තකුට එරෙහිව (2) වන උපවගන්තිය යටතේ නඩු පවරා ඇති අවස්ථාවක, ඒ උපවගන්තිය යටතේ නියම කර ඇති දණ්ඩනයට අමතරව, වරදකරු කරනු ලැබූ තැනැත්තාට (1) වන උපවගන්තිය යටතේ කරගෙන යාම තහනම් කර තිබෙන ක්‍රියාකාරකම, ඒ සඳහා ඒ උපවගන්තියෙන් නියමිත බලපත්‍රයක් ලබාගන්නා තෙක් කරගෙන යාමෙන් වළකින ලෙස, අධිකරණය විසින් ඒ තැනැත්තාට වැඩිදුරටත් ආඥා කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නීති කෘත්‍ය කිසිවක් කොමිෂන් සභාවේ ලිඛිත අනුමතය ඇතිව හැර, පවරනු නොලැබිය යුතු ය.

විදුලිබලය සැපයීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියකට සහභාගී වීම.

8. යම් තැනැත්තකුට විදුලිබලය උත්පාදනය කිරීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියකට සහභාගි වීමට හැකියාව තිබුන ද, 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ උත්පාදන බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකමක් ලැබීමට නම්, එවැනි තැනැත්තකු එම උපවගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවයට අනුකූල වීම අවශ්‍ය වන්නේ ය.

11 වන වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමේ සුදුසුකම්.

9. (1) පහත දැක්වෙන තැනැත්තන් අතුරින් යම් තැනැත්තකු හැර, වෙනත් කිසිම තැනැත්තකු උත්පාදන ධාරිතාව මෙ.වො. 25 ඉක්මවා සහ අභිබවා, ශ්‍රී ලංකාව තුළ විදුලිය උත්පාදනය කිරීම පිණිස, උත්පාදනය කිරීමේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසු නොවන්නේ ය :—

(අ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලය ;

(ආ) පළාත් පාලන ආයතනයක් ; හෝ

(ඇ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, භාණ්ඩාගාර ලේකම්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි කොටස් ප්‍රමාණයක් දරනු ලබන, රජය, රාජ්‍ය සංස්ථාවක්, රජය විසින් කොටස්වලින් සියයට පනහකට වඩා වැඩි කොටස් ප්‍රමාණයක් දරනු ලබන සමාගමක් හෝ එවැනි සමාගමක පාලිත සමාගමක්.

(2) 1969 අංක 17 දරන ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලය හැර, වෙනත් කිසිම තැනැත්තකු සම්ප්‍රේෂණ බලපත්‍රයක් නිකුත් කරනු ලැබීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

(3) පහත දැක්වෙන තැනැත්තන් අතුරින් යම් තැනැත්තකු හැර, වෙනත් කිසිම තැනැත්තකු බෙදා හැරීමේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස සුදුසු නොවන්නේ ය :—

(අ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලය ;

(ආ) පළාත් පාලන ආයතනයක් ;

(ඇ) ආණ්ඩුව විසින් සියයට පනහට වැඩි කොටස් ප්‍රමාණයක් දරනු ලබන, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද, යම් සමාගමක් ; හෝ

(ඈ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් සමිතියක්.

නිදහස් කිරීම.

10. (1) විදුලි බලය උත්පාදනය කිරීම හෝ බෙදා හැරීම සඳහා වූ බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් නිදහස් කිරීම, ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම විසින් උත්පාදනය කරනු ලැබිය හැකි හෝ බෙදාහරිනු ලැබිය හැකි විදුලිබල ප්‍රමාණය හෝ ආකාරය සැලකිල්ලට ගනිමින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරන ලද එබඳු සෑම නිදහස් කිරීමක් ම, ඒ නියමයේ සඳහන් කරනු ලැබිය හැකි යම් ප්‍රමාණයකට, යම් කොන්දේසිවලට යටත්ව සහ යම් කාලපරිච්ඡේදයක් සඳහා විය යුතු ය.

බලපත්‍ර සඳහා වූ ඉල්ලීම.

11. 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, විදුලි බලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම හෝ බෙදාහැරීමේ බලපත්‍රයක් සඳහා හෝ එවැනි යම් බලපත්‍රයක් දීර්ඝ කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම, කොමිෂන් සභාව වෙත ලිඛිතව කරනු ලැබිය යුතු අතර, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියක යම් තොරතුරු, ලේඛන හා යම් ගාස්තුවක් ද සමග එවනු ලැබිය යුතු ය.

බලපත්‍ර ප්‍රදානයට පෙරාතුව කාර්ය පටිපාටිය.

12. (1) 11 වන වගන්තිය යටතේ වන ඉල්ලීමක් ලැබුණු විටෙක සහ ඉල්ලා ඇති බලපත්‍රය හෝ දීර්ඝ කිරීම ප්‍රදානය කිරීමට කොමිෂන් සභාව අදහස් කරන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්,—

(අ) එසේ කිරීම සඳහා වූ සිය අදහස පිළිබඳ දැන්වීමක්, උචිත යයි කොමිෂන් සභාව සලකන යම් ආකාරයකින්, බලපත්‍රය හෝ දීර්ඝ කිරීම මගින් බලපෑම් ඇති විය හැකි තැනැත්තන්ගේ අවධානයට යොමු කිරීම සඳහා පළ කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) දැන්වීමේ පිටපතක් අමාත්‍යවරයා වෙත ඔහුගේ හෝ ඇයගේ දැනගැනීම සඳහා යවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම දැන්වීමකින් ම,—

(අ) දැන්වීමෙහි දක්වා ඇති තැනැත්තන් වෙත ඒ කාර්යය සඳහා බලපත්‍රය හෝ දීර්ඝ කිරීම ප්‍රදානය කිරීමට කොමිෂන් සභාව යෝජනා කරන බව ප්‍රකාශ විය යුතු ය ;

(ආ) ඒ බලපත්‍රය හෝ දීර්ඝ කිරීම ප්‍රදානය කිරීමට යෝජනා කිරීමේ හේතු ප්‍රකාශ විය යුතු ය ; තව ද

(ඇ) යෝජනාව සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නියෝජන ඉදිරිපත් කළ හැකි කාල පරිච්ඡේදය (දැන්වීම පළ කළ දින සිට දින විසි අටකට නො අඩු) සඳහන් කළ යුතු ය.

බලපත්‍ර ප්‍රදානය කිරීම.

**13.** (1) කොමිෂන් සභාව විසින්—

(අ) 12 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමට පිළිතුරු වශයෙන් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද යම් නියෝජන කිසිවක් සලකා බැලීමෙන් පසුව;

(ආ) බලපත්‍ර හෝ දීර්ඝ කිරීම මගින් බලය ලද කටයුතු කර ගෙන යාම සඳහා මූල්‍යමය හා තාක්ෂණික හැකියාව ඉල්ලුම්කරුට ඇති බවට සෑහීමට පත්වීමෙන් පසුව; සහ

(ඇ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව:—

(i) යම් තැනැත්තකුට බලය දෙමින්—

(අ) හඳුනා ගත් උත්පාදන පිරියතකින් විදුලි බලය උත්පාදනය කිරීම සඳහා ( මේ අනුච්ඡේදය යටතේ දෙනු ලබන බලපත්‍රයක් මෙහි මින් මතු "උත්පාදනය කිරීමේ බලපත්‍රයක්" ලෙස හඳුන්වනු ලැබේ) ; නැතහොත්,

(ආ) බලපත්‍රයෙහි සඳහන් බලයලත් ප්‍රදේශයෙහි (විදුලි බලය තොග වශයෙන් ලබාගෙන විකිණීම) විදුලි බලය සම්ප්‍රේෂණය කිරීම සඳහා (මේ අනුච්ඡේදය යටතේ ප්‍රදානය කරනු ලබන බලපත්‍රයක් "සම්ප්‍රේෂණය කිරීමේ බලපත්‍රයක්" ලෙස මෙහි මින් මතු හඳුන්වනු ලැබේ) ; නැතහොත්,

(ඇ) බලපත්‍රයෙහි සඳහන් බලයලත් ප්‍රදේශය තුළ යම් ස්ථානයකට සැපයීමක් කිරීමේ කාර්යය සඳහා විදුලි බලය බෙදාහැරීම හා සැපයීම හෝ බෙදාහැරීම හෝ සැපයීම

හැකිකරවීම සඳහා (මේ අනුඡේදය යටතේ ප්‍රදානය කරනු ලබන බලපත්‍රයක් "බෙදාහැරීමේ බලපත්‍රයක්" ලෙස මෙහි මින් මතු හඳුන්වනු ලැබේ.)

බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය ; නැතහොත්,

(ii) මේ පනත යටතේ ප්‍රදානය කරන ලද උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදාහැරීමේ බලපත්‍රයක කාලය දීර්ඝ කිරීම, ඒ දීර්ඝ කිරීමේ සඳහන් කාලපරිච්ඡේදය සඳහා කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ බලපත්‍රයක් හෝ දීර්ඝ කිරීමක් ප්‍රදානය කරනු ලැබූ වහා ම, කොමිෂන් සභාව විසින් අවස්ථාවෝචිත පරිදි, එය ප්‍රදානය කරනු ලැබූ තැනැත්තන්, එය ප්‍රදානය කරන ලද කාර්ය, ඒ බලපත්‍රයේ හෝ දීර්ඝ කිරීමේ නියම හා එය ප්‍රදානය කරන ලද්දේ කවර කොන්දේසිවලට යටත්ව ද යන බව ඇතුළුව, ප්‍රදානය කරන ලද බලපත්‍රය හෝ දීර්ඝ කිරීම පිළිබඳ විස්තර දැක්වෙන නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කිරීමට කොමිෂන් සභාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) තැනැත්තකු වෙත සම්ප්‍රේෂණය කිරීමේ බලපත්‍රයක් හා—

(අ) උත්පාදනය කිරීමේ බලපත්‍රයක් ; හෝ

(ආ) බෙදා හැරීමේ බලපත්‍රයක්,

යන දෙකම ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

(4) තැනැත්තකු වෙත උත්පාදනය කිරීමේ බලපත්‍රයක් සහ බෙදා හැරීමේ බලපත්‍රයක් යන දෙක ම ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

14. (1) මේ පනත යටතේ ප්‍රදානය කරනු ලබන සෑම උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ බලපත්‍රයක් ම හා එහි දීර්ඝ කිරීමක් ම,— බලපත්‍රයේ ආකෘතිය.

(අ) ලිඛිතව විය යුතු ය ;

(ආ) බලපත්‍රයේ හෝ දීර්ඝ කිරීමේ නියමයන්ට අනුකූලව කලින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ ඇත්නම් හෝ පවාරණය කරනු ලැබ ඇත්නම් මිස, බලපත්‍රයේ හෝ දීර්ඝ කිරීමේ සඳහන් කාල පරිච්ඡේදය සඳහා නොකඩවා බලාත්මක විය යුතු ය ; සහ

(ඇ) කොමිෂන් සභාවේ කැමැත්ත නොමැතිව පවාරණය කිරීමේ හැකියාව නොතිබිය යුතු ය.

(2) උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ බලපත්‍රයක් හෝ එම බලපත්‍රය දීර්ඝ කිරීමක් ප්‍රදානය කිරීමෙන් පසුව, හැකි ඉක්මණින්, කොමිෂන් සභාව විසින් එහි පිටපතක්—

(අ) අමාත්‍යවරයා වෙත, ඔහුගේ හෝ ඇයගේ දැනගැනීම සඳහා ; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, එම බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ දීර්ඝ කිරීම මගින් බලපෑම් සිදු විය හැකි වෙනත් යම් බලපත්‍රලාභියකු වෙත,

යවනු ලැබිය යුතු ය.

බලපත්‍රවල සාමාන්‍ය කොන්දේසි.

15. (1) උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ බලපත්‍රයක—

(අ) මේ පනතේ 3 වන වගන්තිය මගින් කොමිෂන් සභාව වෙත පැවරී ඇති කර්තව්‍ය සැලකිල්ලට ගනිමින්, කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකන (බලපත්‍රය මගින් බලය දී ඇති කටයුතුවලට අදාළ වන හෝ නොවන) යම් කොන්දේසි ;

(ආ) බලපත්‍රය මගින් හෝ ඒ යටතේ කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ප්‍රමාණයක හෝ ප්‍රමාණවල ගෙවීම්, බලපත්‍රය ප්‍රදානය කරනු ලැබූ විට ගෙවීම හෝ බලපත්‍ර කාලය තුළ දී කාලීන ගෙවීම් හෝ කොමිෂන් සභාවට ගෙවීමට නියම කෙරෙන කොන්දේසි ;

(ඇ) මේ පනතේ 31 වන හා 32 වන වගන්තිවල විධිවිධානවලට අතිරේකව—

(i) බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් වේලාවන්හි දී හා යම් අවස්ථානුගත කරුණු අනුව, බලාත්මකවීමේ හා බලාත්මකවීම නතරවීමේ ; හෝ

(ii) නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් වේලාවන්හි දී හා යම් අවස්ථානුගත කරුණු අනුව, බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ආකාරයකින් විකරණය කළ යුතු කොන්දේසි සමඟ කොන්දේසි පැනවීම සඳහා වූ විධිවිධාන ද ;

(ඇ) ඒකාධිකාරී තත්ත්වය හෝ වෙනස් තරඟ විරෝධී චර්යා අනිසි ලෙස යෙදීම තහනම් කිරීමට අදාළ කොන්දේසි ; සහ

(ඉ) ස්වකීය ගනුදෙනුකරුවන්ට වඩාත් ලාභදායි හා කාර්යක්ෂම සේවයක් සලසන බවට සහතික වීම උදෙසා, බලපත්‍රලාභියාගේ අරමුදල් සහ වත්කම් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට අදාළ කොන්දේසි,

ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(2) උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ බලපත්‍රයක ඇතුළත් කොන්දේසිවල—

(අ) බලපත්‍රයේ සඳහන් කරනු ලබන යම් කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරනු ලබන යම් තීරණයක්, නියමයක්, විධානයක් හෝ නිගමනයක් බලපත්‍රලාභියා පිළිපැදිය යුතු බව අනිවාර්ය කෙරෙන ;

(ආ) බලපත්‍රයේ සියලු නියමයන්ට අනුකූලව බලපත්‍රලාභියා කටයුතු කළ යුතු බව අනිවාර්ය කෙරෙන ;

(ඇ) කොමිෂන් සභාව විසින් නිශ්චය කිරීම සඳහා ඇතැම් කරුණු බලපත්‍රලාභියා විසින් යොමු කළ යුතු බව අනිවාර්ය කෙරෙන ;

(ඈ) බලපත්‍රය යටතේ කළ යුතු ඇතැම් දේ හෝ බලපත්‍රයට අනුකූලව එළඹුණු ඇතැම් කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම් කොමිෂන් සභාව විසින් අනුමත කිරීම සඳහා බලපත්‍රලාභියා විසින් යොමු කළ යුතු බව අනිවාර්ය කෙරෙන ;

(ඉ) බලපත්‍රලාභියා විසින් හෝ අනුබද්ධිත යම් තැනැත්තකු විසින් නිශ්චිත ව්‍යාපාරික අයිතිවාසිකම්වල අයිතිය සීමා කෙරෙන ; සහ

(ඊ) බලපත්‍රලාභියා වෙනත් තැනැත්තන් සමඟ ගිවිසුම්වලට ඇතුළත් විය යුතු බව අනිවාර්ය කෙරෙන,

නියමයන් ඇතුළත් විය හැකි ය.

(3) බලපත්‍රයක යම් කොන්දේසියක් ප්‍රකාර, කොමිෂන් සභාව විසින් ලබා ගත් යම් මුදලක් කොමිෂන් සභාවේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

උත්පාදනය කිරීමේ බලපත්‍රවල විශේෂ කොන්දේසි.

**16.** 15 වන වගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, උත්පාදනය කිරීමේ බලපත්‍රලාභියකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක—

(අ) යම් කොන්දේසියක් මේ පනතේ විධිවිධාන කිසිවකට අනනුකූල නොවන තාක් දුරට, මේ පනත යටතේ බලපත්‍රලාභියකු වෙත පවරන ලද කර්තව්‍ය ඉටු කළ යුත්තේ කෙසේ ද යන්න නියම කෙරෙන ;

(ආ) බලපත්‍රලාභියා විසින් උත්පාදනය කරන ලද විදුලි බලය, අනන්‍ය වශයෙන් සම්ප්‍රේෂණ බලපත්‍රලාභියකුට පමණක් විකිණිය යුතු බවට බලපත්‍රලාභියාට නියම කෙරෙන ;

(ඇ) තත් කාලයේ බලපවත්නා සියලු පාරිසරික නීති පිළිපැදිය යුතු බවට බලපත්‍රලාභියාට නියම කෙරෙන ;

(ඈ) තැනැත්තන්, පැළෑටි හා උපකරණ තුවාලවීමෙන් හා හානි සිදුවීමෙන් ආරක්ෂාකර ගැනීම සඳහා හැකි සියලු පියවර ගත යුතු බවට බලපත්‍රලාභියාට නියම කෙරෙන ;

(ඉ) අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි කොමිෂන් සභාව සලකන, උත්පාදන පද්ධතියට අදාළ යම් තාක්ෂණික හෝ ක්‍රියාකාරීත්ව සංග්‍රහ ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යා යුතු යයි බලපත්‍රලාභියාට නියම කෙරෙන ; සහ

(ඊ) විදුලි කම්බි, කේබල පිරියත හා ඉන්ධන හැසුරුම් පිරියත හා ආශ්‍රිත උපකරණ වැඩිදියුණු කිරීම හා පවත්වාගෙන යාම නියම කෙරෙන,

කොන්දේසි ඇතුළත් විය යුතු ය.

සම්ප්‍රේෂණ බලපත්‍රවල විශේෂ කොන්දේසි.

**17.** 15 වන වගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැති ව, බලපත්‍රලාභියකු වෙත නිකුත් කරන ලද සම්ප්‍රේෂණ බලපත්‍රයක,—

(අ) මේ පනත යටතේ බලපත්‍රලාභියකු වෙත පැවරී ඇති කර්තව්‍ය මේ පනතේ යම් විධිවිධානයකට අනනුකූල නොවන තාක් දුරට යම් කොන්දේසියක් බලපත්‍රලාභියා කෙසේ ඉටු කළ යුතු ද යන බව නියම කෙරෙන ;

(ආ) බලපත්‍රලාභියාගේ සම්ප්‍රේෂණ පද්ධතිය වැඩි දියුණු කිරීමට සැලසුම් කිරීම සඳහා සහ සාධාරණ වූ අනාගත ඉල්ලුමට මුහුණ දීමට, නව උත්පාදන පිරියත වැඩිදියුණු කිරීම සලසා ගැනීම සඳහා අනාගත ඉල්ලුම කලින් සිතා ගැනීමට බලපත්‍රලාභියාට නියම කෙරෙන ;

(ඇ) විදුලි බලය සහ වෙනත් භාණ්ඩ සහ සේවාවන් වඩාත් ලාභදායී සහ වාසිදායක කොන්දේසි මත හා වඩාත් විනිවිද පෙනෙන සුළු ආකාරයට මිල දී ගන්නා ලෙස, බලපත්‍රලාභියාට නියම කෙරෙන ;

(ඈ) විදුලි බලය තොග වශයෙන් විකිණීම සඳහා බලපත්‍රලාභියා විසින් අය කරනු ලැබිය හැකි අය ක්‍රමය හා උත්පාදනය කිරීමේ බලපත්‍රලාභීන් හා බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් සම්ප්‍රේෂණ පද්ධතිය පාවිච්චි කිරීම සඳහා වූ ගාස්තු වක්‍ර ඇති කිරීමට අදාළ වන ;

(ඉ) බලපත්‍රලාභියාගේ ව්‍යාපාරයේ විවිධ කොටස් සම්බන්ධයෙන් වෙනම ගිණුම් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රලාභියාට නියම කෙරෙන සහ ඒ කොටස් අතර තිරස් සහනාධාර තහනම් කෙරෙන ;

(ඊ) කොමිෂන් සභාව අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි සලකන සම්ප්‍රේෂණ පද්ධතියට (ජාලක සංකේතයක් ඇතුළුව) අදාළ යම් තාක්ෂණික හෝ ක්‍රියාකාරීත්ව සංග්‍රහ ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම කළ යුතු යයි බලපත්‍රලාභියාට නියම කෙරෙන ;

(උ) විදුලි රැහැන් හෝ විදුලි පිරියත හෝ ඒ දෙකම වැඩිදියුණු කිරීම හා පවත්වාගෙන යාම කළ යුතු යයි බලපත්‍රලාභියාට නියම කෙරෙන ;

(ඌ) විනිවිද පෙනෙන උත්පාදනය කිරීමේ යැවුම් ආකෘතියක් වැඩිදියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රලාභියාට නියම කෙරෙන ; සහ

(එ) ස්වකීය විදුලි උත්පාදන ප්‍රසම්පාදනයට අදාළ සියලු තොරතුරු මහජනතාවගේ යහපත පිණිස ප්‍රකාශයට පත් කරන ලෙස බලපත්‍රලාභියාට නියම කෙරෙන,

කොන්දේසි ඇතුළත් කරනු ලැබිය යුතු අතර, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ සම්ප්‍රේෂණ පද්ධතියට සම්බන්ධ වී ඇත්තා වූ සහ සම්ප්‍රේෂණ බලපත්‍රයෙහි

හඳුනාගෙන ඇත්තා වූ ද ඇතැම් පාරිභෝගිකයන්ට, ඒ බලපත්‍රයේ ඇතුළත් තොග විකිණීම්වලට අදාළ යම් වැඩිදුර කොන්දේසිවලට යටත්ව, තොග වශයෙන් විදුලි බලය විකිණීම සඳහා සම්ප්‍රේෂණය කිරීමේ බලපත්‍රලාභියාට අවසර දෙන කොන්දේසි ද එහි ඇතුළත් කරනු ලැබිය හැකි ය.

බෙදා හැරීමේ බලපත්‍රවල විශේෂ කොන්දේසි.

18. 15 වන වගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, බලපත්‍රලාභියකු වෙත නිකුත් කරන ලද බෙදාහැරීමේ බලපත්‍රයක—

(අ) මේ පනත මගින් හෝ යටතේ බලපත්‍රලාභියකු වෙත පැවරී ඇති කර්තව්‍ය, යම් කොන්දේසියක් මේ පනතේ යම් විධිවිධානයකට අනනුකූල නොවන තාක් දුරට බලපත්‍රලාභියා කෙසේ ඉටු කළ යුතු ද යන බව නියම කෙරෙන ;

(ආ) පාරිභෝගික ආරක්ෂාව සඳහා කොමිෂන් සභාව අවශ්‍ය යයි සලකන, පහත දැක්වෙන දේවලට අදාළ විධිවිධානය ද ඇතුළු යම් විධිවිධාන ඇතුළත් පාරිභෝගික ප්‍රශ්න හා සම්බන්ධ පරිචය සංග්‍රහ පළ කිරීම සහ ඒවා අනුගමනය කිරීම කරනු ලැබිය යුතු යයි බලපත්‍රලාභියාට නියම කෙරෙන—

(i) අලුත් විදුලිබල සැපයුමක් ලබා දීම සඳහා හෝ දෝෂයක් පිළිබඳව දැනුම්දීමෙන් පසු සැපයුම නැවත ලබා දීම සඳහා අවශ්‍ය උපරිම කාලසීමාව ;

(ii) (i) වන අනුඡේදයේ සඳහන් යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීමට බලපත්‍රලාභියා අපොහොසත්වීම හේතුකොට ගෙන ගණුදෙනුකරුවකුට දැරීමට සිදු වූ යම් අලාභයක් සඳහා වන්දි ගෙවීම ;

(iii) පාරිභෝගිකයන් විසින් බිල්පත් ගෙවනු ලැබීම ;

(iv) පාරිභෝගිකයන්ට කරනු ලබන සැපයීම් විසන්ධි කිරීම ;

(v) වැඩිහිටි හා ආබාධිත තැනැත්තන්ට සේවා සැපයීම ;

(vi) පාරිභෝගිකයන් විසින් කාර්යක්ෂම ලෙස විදුලි බලය භාවිත කිරීම ;

(vii) පාරිභෝගික පැමිණිලි මෙහෙයවීම ;

(viii) කොමිෂන් සභාව විසින් ඇති කරන ලද විදුලි බලය නැවත විකිණීම සඳහා උපරිම ගාස්තුවලට අනුකූලව බලපත්‍රලාභියා විසින් කටයුතු කිරීම සොයා බැලීම ;

(ix) මෙතෙක් විදුලි බලය ලබා දී නැති භූගෝලීය ප්‍රදේශවලට සහ අපේක්ෂිත පාරිභෝගිකයන්ට සේවා සැපයීම ; සහ

(x) වරප්‍රසාද නොලත් පාරිභෝගික කණ්ඩායම්වලට ඒව සහනදායි අයකිරීම් ලබා දීම.

(ඇ) අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි කොමිෂන් සභාව සලකන, විදුලි බලය බෙදා හැරීම් ජාලයට අදාළ තාක්ෂණික හා කාර්යාත්මක සංග්‍රහ ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම කළ යුතු යයි බලපත්‍රලාභියාට නියම කෙරෙන ; සහ

(ඈ) විදුලි මාර්ග හෝ විදුලි පිරියත හෝ දෙකම වැඩිදියුණු කිරීම හෝ පවත්වාගෙන යාම කළ යුතු යයි බලපත්‍රලාභියාට නියම කෙරෙන,

කොන්දේසි ඇතුළත් කරනු ලැබිය හැකි ය.

19. (1) යම් පැවරුමකට බලය දෙමින් වූ කොන්දේසියක් බලපත්‍රයක ඇතුළත් වී ඇත්නම්, බලපත්‍රයකට සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් පැවරුමක් කිරීමේ හැකියාවක් නොමැත. බලපත්‍ර පැවරුම.

(2) කොමිෂන් සභාවේ සහ අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මිස, බලපත්‍රයකට පැවරුමක් ලබාගැනීමේ හැකියාව නොමැති විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ස්වකීය අනුමතය දිය යුතු ද යන බව තීරණය කිරීමේ දී කොමිෂන් සභාව විසින්, අනුරූපී බලපත්‍රයක් හෝ අනුරූපී බලපත්‍රයක කොටසක් පැවරුම්ලාභියාට ප්‍රදානය කළ යුතු ද යන බව තීරණය කිරීමේ දී අදාළ කරනු ලබන උපමානය ම අදාළ කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ අනුමතය පැවරුම්ලාභියා—

(අ) පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව සහ අමාත්‍යවරයා විසින් සලකන බලපත්‍රයේ කොන්දේසිවල යම් වෙනස් කිරීමකට හෝ වැඩිදුර කොන්දේසි පැනවීමට එකඟ වෙමින් ; සහ

(ආ) අවශ්‍ය යැයි කොමිෂන් සභාව සහ අමාත්‍යවරයා විසින් සලකන කොන්දේසිවල යම් අවස්ථානුගත හෝ ආනුෂංගික විකරණය කිරීමකට යටත්ව,

දෙනු ලැබිය හැකි ය.

(5) පැවරුම්ලාභියා විසින් ඇතැම් නිශ්චිත කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට යටත්ව, පැවරුමකට බලය දෙමින් වූ කොන්දේසි බලපත්‍රයක ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(6) බලපත්‍රයේ පැවරුමක් හෝ අදහස් කරන ලද පැවරුමක්—

(අ) බලපත්‍රයේ පැවරුම් හැකියාව නොමැති නම් ;

(ආ) පැවරුමෙන් හෝ අදහස් කරන ලද පැවරුමෙන් බලපත්‍රයේ කොන්දේසියක් කඩවේ නම් ; හෝ

(ඇ) පැවරුමකට හෝ අදහස් කරන ලද පැවරුමකට පෙරාතුව, (2) වන උපවගන්තිය යටතේ කැමැත්ත දී ඇත්තා වූ කොන්දේසියක උල්ලංඝනය කිරීමක්, තිබුණේ වී නම්,

බලරහිත වන්නේ ය.

(7) අමාත්‍යවරයා විසින්, මේ වගන්තියේ (2) සහ (4) වන උපවගන්ති යටතේ සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, ඒ එක් එක් කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි යම් උපමානවලට අනුව, ක්‍රියා කළ යුතු ය.

බලපත්‍ර ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

**20**. (1) (2) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් කොමිෂන් සභාවට කරන ලද යම් නියෝජනයක් සැලකිල්ලට ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ඒ බලපත්‍රයේ ඇතුළත් ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳ නියමයන්ට අනුකූලව උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට පෙරාතුව, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් සහ ප්‍රත්‍යාදිෂ්ට කිරීමෙන් බලපෑමකට ලක් විය හැකි තැනැත්තන්ගේ අවධානයට යොමු කිරීම සඳහා උචිත යයි කොමිෂන් සභාව සලකන වෙනත් යම් ක්‍රම මගින් දැන්වීමෙහි සඳහන් බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට යෝජනා කරන බව, එසේ කිරීමට යෝජනා කිරීමට හේතු සහ ඒ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට එරෙහිව කොමිෂන් සභාව වෙත නියෝජන ඉදිරිපත් කළ හැකි කාල පරිච්ඡේදය නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

නිදහස් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම.

**21**. (1) 10 වන වගන්තිය යටතේ නිදහස් කිරීමක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියක ලිඛිතව කොමිෂන් සභාව වෙත කරනු ලැබිය හැකි අතර, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු, ලේඛන හා ගාස්තු සමග එවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් 12 වන වගන්තියේ (1) සහ (2) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් 10 වන වගන්තිය යටතේ නිදහස් කිරීමක් ලබා දීමට පෙරාතුව, (2) වන උපවගන්තියට අනුව කොමිෂන් සභාව විසින් පළකරන ලද දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් කොමිෂන් සභාව වෙත කරන ලද යම් නියෝජනයක් සලකා බැලිය යුතු ය.

22. (1) කොමිෂන් සභාව විසින් (2) වන උපවගන්තිය යටතේ පළකරන ලද දැන්වීමකට පිළිතුරු වශයෙන් කරන ලද නියෝජන කිසිවක් සලකා බැලීමෙන් පසුව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, නිදහස් කිරීම ලබා දෙන ලද්දේ යම් නියමයක යම් විධිවිධානයකට අනුකූලව ද, ඒ විධිවිධානයට අනුකූලව, නැතහොත්, නිදහස් කිරීම නොකඩවා පවත්වාගෙන යාම නුසුදුසු යයි කොමිෂන් සභාවට පෙනී යන්නේ නම්,— නිදහස් කිරීම් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හා ඉල්ලා අස්කර ගැනීම.

(අ) 10 වන වගන්තිය යටතේ තැනැත්තකුට හෝ තැනැත්තන් ගණයකට ලබා දෙන ලද නිදහස් කිරීමක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) 10 වන වගන්තිය යටතේ නිදහස් කිරීමක්, ප්‍රදානය කරන ලද ගණයේ තැනැත්තන් අතුරින් යම් තැනැත්තකුට ලබා දෙන ලද නිදහස් කිරීමක් ඉල්ලා අස් කර ගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නිදහස් කිරීමක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ ඉල්ලා අස් කර ගැනීමට පෙරාතුව, කොමිෂන් සභාව විසින් බලපෑමකට පත් තැනැත්තන්ගේ අවධානයට යොමු කිරීම සඳහා උචිත යයි කොමිෂන් සභාව විසින් සලකන යම් ආකාරයකින් පළ කරනු ලබන දැන්වීමක් මගින්, දැන්වීමෙහි සඳහන් නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ ඉල්ලා අස් කර ගැනීමට යෝජනා කරන බව, එසේ කිරීමට හේතු සහ ඒ යෝජිත ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ ඉල්ලා අස් කිරීමට එරෙහිව නියෝජන ඉදිරිපත් කළ හැකි කාල පරිච්ඡේදයක් සඳහන් කරමින් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

## බලපත්‍රලාභීන්ගේ බලතල හා කාර්ය

23. මේ කොටසේ විධිවිධාන උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ බලපත්‍රයක කොන්දේසි හීන කිරීම සඳහා නොව, ඊට අතිරේකව විය යුතු ය. මේ කොටසේ විධිවිධාන කොන්දේසිවලට අතිරේකව විය යුතු බව.

සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ගේ කාර්යය.

**24**. (1) සම්ප්‍රේෂණ බලපත්‍රලාභියකු විසින්—

(අ) කාර්යක්ෂම, සම්බන්ධීකරණ, විශ්වාසවන්ත හා පිරිමැසුම්දායක සම්ප්‍රේෂණ පද්ධතියක් වැඩිදියුණු කර, පවත්වාගෙන යා යුතු ය ;

(ආ) පාරිභෝගිකයන්ට ආරක්ෂාකාරී, විශ්වාසවන්ත හා පිරිමැසුම්දායක විදුලිය සැපයීමක් සහතික වශයෙන් ම කළ හැකි වන පරිදි, විදුලි බලය තොග වශයෙන් ලබාගෙන බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට විකිණිය යුතු ය ; තව ද,

(ඇ) විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික විය යුතු ය.

(2) මේ පනතේ 6 වන, 25 වන, 26 වන, 27 වන, 28 වන, 29 වන, 40 වන, 41 වන, 42 වන, 54 වන සහ 56 වන වගන්ති සහ I වන, II වන සහ III වන උපලේඛන, බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් විදුලි බලය සැපයීමට අදාළ වන්නාක් මෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව සම්ප්‍රේෂණ බලපත්‍රලාභියකු විසින් තොග වශයෙන් විදුලි බලය විකිණීම සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ කාර්යය.

**25**. (1) බලපත්‍රලාභියාගේ බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් මේ කොටසේ විධිවිධානවලට යටත්ව මේ කොටස යටතේ හෝ 54 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග කිසිවකට සහ (මේ පනතේ II වන උපලේඛනයෙහි දක්වා ඇති පරිදි) විදුලි බලය සැපයීම් සංග්‍රහයට යටත් ව,—

(අ) ඒ පරිශ්‍රවලට විදුලි බලය සන්ධි කිරීම, සැපයීම හා පවත්වාගෙන යාම ; සහ

(ආ) ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි තාක් දුරට විදුලි මාර්ග, විදුලි පිරියත හෝ ඒ දෙකම සැපයීම,

කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රලාභියා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් විදුලි බලය බෙදා හැරීම් පද්ධතියට යම් පරිශ්‍රයක් සන්ධි කිරීමේ දී හෝ බලපත්‍රලාභියා විසින් කරනු ලබන විදුලි බලය සන්ධි කිරීම් හෝ සැපයීම් පිළිබඳ නියමයන්හි යම් අයුතු මනාපයක්, අයුතු වෙනස්කමක් හෝ විශේෂයක් සිදුකිරීම, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් වළක්වාලිය යුතු ය.

(3) බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ බල ප්‍රදේශයේ—

(අ) බලපත්‍රලාභියාගේ යම් බෙදා හැරීමේ මාර්ගයක සිට මීටර් පණහක් ඇතුළත පිහිටියා වූ ; හෝ

(ආ) ඒ පරිශ්‍රවල අයිතිකරු හෝ පදිංචිකරු විසින් සපයන ලද හා බහාලන ලද විදුලි රැහැනක් මගින් එවැනි යම් විදුලි මාර්ගයකට සන්ධි කළ හැක්කා වූ ද,

යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් (1) වන උපවගන්තිය යටතේ වූ සැපයීමක් ලබා ගැනීම සඳහා ඒ බෙදා හැරීමේ බලපත්‍රලාභියා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(4) යම් පරිශ්‍රයකට විදුලි බලය සැපයීමක් සම්මත අයකුම ගිවිසුමක පදනමක් මත විය යුතු අතර, බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින්, බෙදා හැරීමේ බලපත්‍රයට අයත් බල ප්‍රදේශය ඇතුළත සියලු පාරිභෝගිකයන් වෙත (දැනට සිටින පාරිභෝගිකයන් හෝ සැපයුමක් ඉල්ලන තැනැත්තන්) විදුලිබල සැපයුමක් ලබා ගැනීම සඳහා පාරිභෝගිකයකු විසින් සපුරාලිය යුතු, මේ කොටසේ හා බෙදා හැරීමේ බලපත්‍රයේ දක්වා ඇති නියමයන් පිළිබඳව දැනුම් දිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි, එවැනි විදුලිබල සැපයුමක් යම් තැනැත්තකුට අවශ්‍ය වන්නාවූ අවස්ථාවක, ඔහු හෝ ඇය විසින්—

(අ) සැපයීම අවශ්‍ය වන්නා වූ පරිශ්‍රය ;

(ආ) ඒ පරිශ්‍රවල විදුලි බලය භාවිත කළ යුතු කාර්ය ;

(ඇ) සැපයුම ආරම්භ කිරීමට අවශ්‍ය වන (තැනැත්තකුගේ අවශ්‍යතාවක් පිළිබඳව බෙදා හැරීමේ බලපත්‍රලාභියා වෙත දැනුම් දීමෙන් පසු සාධාරණ කාලයකට කලින් නොවන) දිනය;

(ඈ) යම් වේලාවක දී අවශ්‍ය විය හැකි උපරිම බලය ; සහ

(ඉ) සැපයුම ලබා දීමට අවම කාල පරිච්ඡේදය,

පිළිබඳව බෙදා හැරීමේ බලපත්‍රලාභියා වෙත දැනුම් දී, සැපයුමක් ඉල්ලුම් කරනු ලැබිය යුතු අතර, නියෝග මගින් කලින් කල නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු ද බෙදා හැරීමේ බලපත්‍රලාභියා වෙත සැපයිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසුව හැකි පහසු ඉක්මණින් බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්—

(අ) ඒ පරිශ්‍රයට විදුලිබල සැපයීමක් කලින් දී නොමැති නම් ; හෝ

(ආ) සැපයීම කිරීමට විදුලි මාර්ග හෝ විදුලි පිරියත හෝ දෙකම සැපයීම අවශ්‍ය වේ නම් ; හෝ

(ඇ) බලපත්‍රලාභියා විසින් එසේ කිරීම සඳහා අවශ්‍ය වෙනත් අවස්ථානුගත කරුණු තිබේ නම්,

බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්, ඉල්ලීමක් කරන තැනැත්තා වෙත (7) වන උපවගන්තිය යටතේ දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය.

(7) මේ උපවගන්තිය යටතේ වූ දැන්වීමක—

(අ) (5) වන උපවගන්තිය යටතේ අපේක්ෂිත පාරිභෝගිකයාගේ ඉල්ලීමෙහි සඳහන් යෝජනා බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් කොතෙක් දුරට පිළිගනු ලැබේ ද යන බව ප්‍රකාශ විය යුතු අතර, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් කරන ලද යම් ප්‍රතියෝජනා කිසිවක් ද එහි සඳහන් විය යුතු ය ;

(ආ) ගෙවිය යුතු අය ක්‍රමය සඳහන් විය යුතු ය ;

(ඇ) 27 වන හෝ 28 වන වගන්ති යටතේ ඒ තැනැත්තා විසින් කළ යුතු යම් ගෙවීමක් සඳහන් විය යුතු ය ; තව ද,

(ඈ) ඒ තැනැත්තා විසින් පිළිගත යුතු යයි නියම කරනු ලැබිය හැකි වෙනත් යම් නියම හා කොන්දේසි සඳහන් විය යුතු ය:

කෙසේ වුව ද, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් යෝජනා, ප්‍රතියෝජනා, නියම හා කොන්දේසි, මේ පනතට මේ පනත යටතේ සාදන ලද

නියෝගවලට හා බෙදා හැරීමේ බලපත්‍රයේ කොන්දේසිවලට අනුකූලව බලපත්‍රලාභියා විසින් ඒ තැනැත්තාට පැනවීමට හිමිකම් ලබා ඇති නියම හා කොන්දේසි විය යුතු ය.

(8) මේ වගන්තියේ—

(අ) විදුලි බලය සැපයීමක් දීම සම්බන්ධයෙන් වූ යම් සඳහන් කිරීමකට, එවැනි සැපයීමක් දීම අඛණ්ඩව කර ගෙන යාම සම්බන්ධයෙන් වූ යොමු කිරීමක් ඇතුළත් වේ ;

(ආ) විදුලි බලය සැපයීමක අවශ්‍යතාවය සම්බන්ධයෙන් වූ යම් සඳහන් කිරීමකට, එවැනි සැපයීමක් අඛණ්ඩව කරගෙන යාමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් වූ යොමු කිරීමක් ඇතුළත් වේ ; සහ

(ඇ) විදුලි මාර්ගයක් හෝ පිරියත කොටසක් සැපයීම සම්බන්ධයෙන් වූ යම් සඳහන් කිරීමකට, අලුත් විදුලි මාර්ගයෙන් හෝ කොටසක් නැතහොත්, පවත්නා විදුලි මාර්ගයක හෝ කොටසක් සම්බන්ධයෙන් වූ යොමු කිරීමක් ඇතුළත් වේ.

සන්ධිකිරීමේ සහ සැපයීමේ කාර්යයෙන් නිදහස් කිරීම.

**26**. 25 වන වගන්තිය යටතේ යම් පරිශ්‍රයකට විදුලි බලය සැපයීමක් සන්ධි කිරීම හා දීම සඳහා, සැපයීම සන්ධි කිරීම හා දීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේ පනතේ මේ කොටස යටතේ වූ නියෝග හෝ 54 වන වගන්තිය හෝ විදුලි බලය සැපයීම් සංග්‍රහය (මේ පනතේ II වන උපලේඛනයේ දක්වා ඇති පරිදි) බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් කඩ කර ඇත්නම් හා ඒ කඩ කර ඇති ප්‍රමාණයට හා කඩ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති විය හැකි අවස්ථානුගත කරුණු වළක්වාලීමට ගත හැකි සියලු යුක්තිසහගත පියවර බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් ගනු ලැබ ඇත්නම්, එබඳු අවශ්‍යතාවක් ඇති බවට මේ පනතේ කිසිවක් සලකනු නොලැබිය යුතු ය.

වියදම් ආපසු අය කර ගැනීමේ බලය.

**27**. (1) 25 වන වගන්තිය යටතේ විදුලි බලය සැපයීමක් අවශ්‍ය වන තැනැත්තකුට බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් සපයනු ලැබ ඇති අවස්ථාවක, ඒ මාර්ගය හෝ පිරියත සැපයීමේ දී සාධාරණ ලෙස දරන ලද වියදම් කිසිවක්, බෙදා හැරීමේ බලපත්‍රයේ කොන්දේසි මගින් අවකාශ දී ඇත්තා වූ යම් ප්‍රමාණයක් ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු යයි ඒ බලපත්‍රලාභියා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගෙන් 25 වන වගන්තිය යටතේ විදුලි බලය සැපයීමක් අවශ්‍ය වන තැනැත්තකුට, ඒ සැපයීම දීමේ කාර්යය සඳහා පාවිච්චි කරන ලද යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් සැපයීමේ දී සාධාරණ ලෙස දරන ලද වියදම් කිසිවක් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් සියලු අවස්ථාගත කරුණු අනුව සාධාරණ වන යම් මුදලක් බලපත්‍රලාභියාට ගෙවිය යුතු යයි කොමිෂන් සභාව විසින් විධාන කරනු ලැබිය හැකි ය:—

(අ) බෙදා හැරීමේ රැහැන් දැමීම හා සන්ධි කිරීම අතර කාලපරිච්ඡේද ;

(ආ) මේ වියදම් සම්බන්ධයෙන් වෙනත් යම් තැනැත්තකු විසින් ඒ බලපත්‍රලාභියා වෙත කලින් කරන ලද යම් ගෙවීමක් ; සහ

(ඇ) ඒ බලපත්‍රලාභියා විසින් බලපත්‍රලාභියාගේ වියදම් එවකටත් සම්පූර්ණයෙන් අය කර ගෙන ඇති ප්‍රමාණය.

(3) (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් දෙන ලද විධාන මගින්, යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් සැපයීමේ දී සාධාරණ ලෙස දරන ලද වියදම් සම්බන්ධයෙන් වූ මුදල් ප්‍රමාණයක් ආපසු අය කර ගනු ලැබූ බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට, එසේ ආපසු අයකර ගනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක් හෝ ඉන් කොටසක්, ඒ වියදම්වලට කලින් දායක වූ තැනැත්තන්ගේ වියදම් ප්‍රතිපූරණය කිරීමෙහි ලා උචිත විය හැකි ගෙවීම් කිරීමෙහි ලා යෙදවිය යුතු යයි නියම කරනු ලැබිය හැකි ය.

(4) විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් සැපයීමේ දී සාධාරණ ලෙස දරන ලද වියදම් කිසිවක් සම්බන්ධයෙන් මේ වගන්තියේ වූ යම් සඳහන් කිරීමකට, එහි මාර්ග හෝ පිරියත නඩත්තු කිරීමෙහි ලා දැරීමට සිදු විය හැකි වියදම් කිසිවක ප්‍රාග්ධනයට හැර වූ අගය සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක්, ඒ වියදම් විදුලි බලය සැපයීම සම්බන්ධයෙන් බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් කරන ලද අය කිරීම්වල කොටසක් වශයෙන් ආපසු අය කර ගත නොහැකි තාක් දුරට ඇතුළත් වේ.

ඇප නියම කිරීමේ බලය.

28. (1) මේ වගන්තියේ පහත දැක්වෙන විධිවිධානවලට යටත් ව, 26 වන වගන්තිය යටතේ විදුලි බලය සන්ධි කිරීමක් සහ සැපයීමක් අවශ්‍ය වන යම් තැනැත්තකුට—

(අ) සැපයීම සම්බන්ධයෙන් ; හෝ

(ආ) ඒ සැපයීම සඳහා යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් සැපයීම අවශ්‍ය වන්නා වූ අවස්ථාවක, ඒ මාර්ගය හෝ පිරියත සැපයීම සම්බන්ධයෙන්,

බලපත්‍රලාභියාට අය විය හැකි සියලු මුදල් ගෙවීම වෙනුවෙන් සාධාරණ ඇපයක් තබන ලෙස ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් නියම කරනු ලැබිය හැකි අතර, ඒ ඇපය තැබීමට ඒ තැනැත්තා අපොහොසත් වුවහොත්, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් සැපයීම, දීම හෝ අපොහොසත් වීම පවත්නා තාක් කල් මාර්ගය හෝ පිරියත සැපයීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමිත පරිදි, යම් තැනැත්තකු ඒ ඇප මුදලක් තැන්පත් කර නොමැති හෝ ඒ තැනැත්තා විසින් තැන්පත් ඇප මුදල ප්‍රමාණවත් නොවූ අවස්ථාවක—

(අ) බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්, දැන්වීමක් මගින්, දැන්වීම භාර දීමෙන් පසු දින හතක් ඇතුළත සැපයීම සම්බන්ධයෙන් බලපත්‍රලාභියාට අය විය යුතු සියලු මුදල් ගෙවීම වෙනුවෙන් සාධාරණ ඇප මුදලක් තැන්පත් කරන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය ; තව ද

(ආ) ඒ ඇප මුදල තැන්පත් කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබුවහොත්, පැහැර හැරීම පවත්නා තාක් කල්, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභියා විසින් සන්ධි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. නැතහොත්, සැපයීම විසන්ධි කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය අනුව, ඇප මුදලක් වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් බෙදා හැරීමේ බලපත්‍රලාභියකු වෙත තැන්පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ මුදල ඒ බලපත්‍රලාභියා සතුව පවත්නා කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ අනුමතය ඇතිව බලපත්‍රලාභියා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි යම් අනුපාතයකට අනුව බලපත්‍රලාභියා විසින් ඒ මුදල් ප්‍රමාණය මත පොලියක් ගෙවනු ලැබිය යුතු ය.

**29.** 25 වන වගන්තිය යටතේ විදුලිය සැපයීමක් අවශ්‍ය වන යම් තැනැත්තකුට, සැපයීම සම්බන්ධයෙන් පහත දැක්වෙන නියමයන් පිළිගත යුතු බවට බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් නියම කරනු ලැබිය හැකි ය :— අතිරේක නියමයන්.

(අ) අවම කාල පරිච්ඡේදයක් සඳහා අවම පරිභෝජන අවශ්‍යතාවලට යටත්ව, විදුලිය සැපයීම ලබා ගැනීම හා ඒ සඳහා ගෙවීම අඛණ්ඩව කළ යුතු බවට ඒ තැනැත්තාට නියම කෙරෙන නියමයන් කිසිවක් ;

(ආ) මේ පනතේ මේ කොටස යටතේ වූ නියෝගවලට හෝ 54 වන වගන්තිය හෝ විදුලි බලය සැපයීම් සංග්‍රහයට (මේ පනතේ II වන උපලේඛනයේ දක්වා ඇති පරිදි,) කටයුතු කිරීමට බලපත්‍රලාභියාට හැකි කරවීමේ කාර්ය සඳහා පැනවිය යුතු යයි නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් කිසිවක් ; සහ

(ඇ) සියලු අවස්ථානුගත කරුණු අනුව ඒ තැනැත්තා විසින් සාධාරණ යයි පිළිගතයුතු, කෙසේ හෝ උද්ගත විය හැකි, ඒ තැනැත්තාට සිදු වන යම් ආර්ථික, ආනුෂංගික හෝ වෙනත් අනියම් පාඩුවක් සම්බන්ධයෙන් බලපත්‍රලාභියාගේ යම් වගකීමක් සීමා කෙරෙන නියමයන් කිසිවක්.

අයකුම.

**30.** (1) මේ වගන්තිය—

(අ) (මෙහි මින් මතු "සම්ප්‍රේෂණය කිරීමේ හා තොග විකිණීමේ අයකුම" යනුවෙන් සඳහන් කරනු ලබන) විදුලි බලය සම්ප්‍රේෂණය කිරීම හා තොග විකිණීම සඳහා සම්ප්‍රේෂණය කිරීමේ බලපත්‍රලාභියා විසින් අය කරනු ලබන අයකුම හෝ ගාස්තු ; සහ

(ආ) (මෙහි මින් මතු "බෙදා හැරීමේ හා සැපයීමේ අයකුම" යනුවෙන් සඳහන් කරනු ලබන) විදුලි බලය බෙදා හැරීම හා සැපයීම හෝ බෙදා හැරීම, නැතහොත්, සැපයීම සඳහා බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් අය කරනු ලබන අයකුම හෝ ගාස්තු,

සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, සම්ප්‍රේෂණය කිරීමේ හා තොග විකිණීමේ අයකුම සහ බෙදා හැරීමේ හා සැපයීමේ අයකුම අදාළ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව—

(අ) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පිරිවැය ප්‍රත්‍යවේක්ෂක ක්‍රමවේදයකට අනුකූලව අදාළ බලපත්‍රලාභියා විසින් සකස් කරනු ලැබිය යුතු ය ;

(ආ) කාර්යක්ෂම පදනමක් මත, එහි බලපත්‍රය මගින් බලය දී ඇති ක්‍රියාකාරකම් කරගෙන යාමේ දී දරන ලද සියලු සාධාරණ වියදම්, ආපසු අය කර ගැනීම සඳහා අදාළ බලපත්‍රලාභියාට අවසර දෙනු ලැබිය යුතු ය ;

(ඇ) 5 වන වගන්තිය යටතේ කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ප්‍රකාර කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය යුතුය ; තවද

(ඈ) මහජනතාවගේ දැනගැනීම සහතික කිරීම උදෙසා කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට ප්‍රකාශයට පත් කළ යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, සම්ප්‍රේෂණය කිරීමේ බලපත්‍රයක හෝ බෙදා හැරීමේ බලපත්‍රයක සම්ප්‍රේෂණය කිරීමේ හා තොග විකිණීමේ අයකුම හෝ බෙදා හැරීමේ හා සැපයීමේ අයකුම සමාලෝචනයට යටත් කළ යුතු විධිවිධාන ඇතුළත් වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් (ඒ අයකුම සමාලෝචනය කිරීම සඳහා වූ කාර්ය පටිපාටියක් අදාළ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇත්නම් මිස) පහත සඳහන් දේවල් ඇතුළත් විය යුතු, සමාලෝචනය කිරීම සඳහා වූ කාර්ය පටිපාටියක් නියම කරනු ලැබිය යුතු ය :—

(අ) කොමිෂන් සභාව විසින් අයකුම සමාලෝචනය කිරීම සඳහා වූ කාල සටහනක් ; සහ

(ආ) පාරිභෝගිකයින් සහ සමාලෝචනය කිරීම සඳහා වූ ක්‍රියාවලියට උනන්දුවක් දක්වන වෙනත් පාර්ශ්වයන් සහභාගි වීම සඳහා වූ ක්‍රියා පටිපාටිය.

(4) මේ පනතේ වෙනත් යම් විධානයක කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින්—

(අ) පාරිභෝගිකයන්ට සහන සැලසීම සඳහා රජය විසින් අනුමත කරන ලද යම් සහනාධාරයක පිරිවැය දැරීම සඳහා භාණ්ඩාගාරය විසින් සපයන ලද අරමුදල්වල ප්‍රමාණවත්භාවය පිළිබඳව සෑහීමට පත් වීමෙන් පසු ; සහ

(ආ) එය විසින් නිශ්චය කරනු ලබන යම් පාරිභෝගික කණ්ඩායම්වලින් නැවත අය කර ගනු ලැබිය හැකි යම් ප්‍රතිසහනාධාර සැලකිල්ලට ගැනීමෙන් පසු,

බලපත්‍රලාභියා විසින් අය කළ යුතු එවැනි සහනාධාර පිළිබිඹු වන අයකිරීම් සහ ගාස්තු නියම කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ "අදාළ බලපත්‍රලාභියා" යන්නෙන්, සම්ප්‍රේෂණය කිරීමේ හා තොග විකිණීමේ අයකුම සම්බන්ධයෙන් සම්ප්‍රේෂණය කිරීමේ බලපත්‍රලාභියකු සහ බෙදා හැරීමේ හා සැපයීමේ අයකුම සම්බන්ධයෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභියකු අදහස් වේ.

උපලේඛනවල විධිවිධාන බලපත්‍රවලට අදාළ විය යුතු බව.

**31**. (අ) මේ පනතේ I වන උපලේඛනයෙහි (බලපත්‍රලාභීන්ගේ වෙනත් බලතල) ;

(ආ) මේ පනතේ II වන උපලේඛනයෙහි (විදුලි බලය සැපයීම් සංග්‍රහය) ;

(ඇ) මේ පනතේ III වන උපලේඛනයෙහි (විදුලිබල මීටර පාවිච්චි කිරීම) ; සහ

(ඈ) මේ පනතේ IV වන උපලේඛනයෙහි (ප්‍රරක්ෂණය),

ඇතුළත් විධිවිධාන, ඒ උපලේඛනවල සඳහන් ඒ ඒ බලපත්‍රවලට සහ බලපත්‍රලාභීන්ට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## III වන කොටස

## බලපත්‍ර විකරණය කිරීම සහ බලාත්මක කිරීම

ගිවිස ගැනීමෙන් විකරණය කිරීම.

**32**. (1) කොමිෂන් සභාව විසින් මේ වගන්තියේ පහත දැක්වෙන විධිවිධානවලට යටත්ව, උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ බලපත්‍රයක කොන්දේසි විකරණය කිරීම, වෙනස් කිරීම සඳහා බලපත්‍රලාභියා කැමැත්ත දක්වන්නේ නම්, කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ විකරණය කිරීම්වලට පෙරාතුව, කොමිෂන් සභාව විසින්—

(අ) යෝජිත විකරණ මගින් බලපෑමට ලක් විය හැකි තැනැත්තන්ගේ අවධානයට යෝජිත විකරණය යොමු කිරීම සඳහා උචිත යයි කොමිෂන් සභාව සලකන යම් ආකාරයකින් දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය ;

(ආ) දැන්වීමේ පිටපතක් බලපත්‍රලාභියා වෙත භාර දිය යුතු ය ;

(ඇ) දැන්වීමේ පිටපතක් අමාත්‍යවරයා වෙත, ඔහුගේ හෝ ඇයගේ දැනගැනීම සඳහා යැවිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීම මගින්—

(අ) කොමිෂන් සභාව විසින් කිරීමට යෝජනා කරනු ලබන විකරණ, දැන්වීමෙහි නිශ්චිතව සඳහන් විය යුතු අතර, යෝජිත විකරණවල බලපෑම හා යෝජිත විකරණවලට හේතු ද ප්‍රකාශ විය යුතු ය ; තව ද,

(ආ) යෝජිත විකරණ සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නියෝජන හෝ විරෝධතා ඉදිරිපත් කරනු ලැබිය හැකි, (දැන්වීම පළ කරන ලද දිනයෙන් ආරම්භ වී දින විසි අටක් පසු නොවන) කාල පරිච්ඡේදය ප්‍රකාශ විය යුතු ය.

(4) දැන්වීමෙහි යෝජිත විකරණ කිසිවක් කිරීමට පෙරාතුව, (3) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් කරන ලද නියෝජන හා විරෝධතා කිසිවක් කොමිෂන් සභාව විසින් සලකා බැලිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ විකරණ කිසිවක් කිරීමෙන් පසුව, හැකි පහසු ඉක්මණින්, විකරණවල පිටපතක් බලපත්‍රලාභියා වෙත සහ අමාත්‍යවරයා වෙත ඔහුගේ හෝ ඇයගේ දැන ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් යවනු ලැබිය යුතු ය.

ගිවිසගැනීමක් නොමැතිව විකරණය කිරීම.

**33**. (1) මේ වගන්තියේ පහත දැක්වෙන විධිවිධානවලට යටත්ව, විකරණවලට බලපත්‍රලාභියා කැමැත්තක් නොදක්වන්නේ නම්, උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ බලපත්‍රයක කොන්දේසි කොමිෂන් සභාව විසින් විකරණය කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ යම් විකරණ කිසිවක් කිරීමට පෙරාතුව, කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ප්‍රශ්න විමර්ශනය කරනු ලැබිය යුතු ය:—

(අ) බලපත්‍රයක් යටතේ විදුලි බලය උත්පාදනය කිරීමට, සම්ප්‍රේෂණය කිරීමට (විදුලි බලය තොග වශයෙන් ලබා දීම හා විකිණීම ද ඇතුළුව) බෙදා හැරීමට සහ සැපයීමට අදාළ කාරණා කිසිවක් මහජන යහපතට එරෙහිව ක්‍රියාත්මක වන්නේ ද නැතහොත්, ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන්නේ ද ; සහ

(ආ) එසේ නම්, ඒ කාරණාවලට පිළියම් යෙදිය හැකි ද නැතහොත්, අදාළ බලපත්‍රයේ කොන්දේසි විකරණය කිරීමෙන් ඒ කාරණා වළක්වා ලිය හැකි ද,

ඉක්බිතිව, විමර්ශනය පිළිබඳ ලිඛිත වාර්තාවක් අමාත්‍යවරයා වෙත සපයනු ලැබිය යුතු ය. තමා වෙත ලැබුනු ඒ වාර්තාව සහ යම් තොරතුරක් යෝජිත විකරණය බලාත්මක කළ යුතු ද නැද්ද යන්න පිළිබඳව කොමිෂන් සභාවට උපදෙස් දීම සඳහා ඔහු හෝ ඇය විසින් සලකා බැලිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයා වෙත සපයන ලද සිය වාර්තාවෙහි පහත දැක්වෙන කාරණා දැක්විය යුතු ය :—

(අ) වාර්තාවෙහි සඳහන් වී ඇත්තාවූ හෝ එසේ සඳහන් වී ඇතැයි බලාපොරොත්තු විය හැකි යයි සිතන කාරණා සම්බන්ධයෙන් මහජන යහපතට අහිතකර බලපෑම් ; සහ

(ආ) ස්වකීය මතය අනුව, ඒ බලපෑම්වලට පිළියම් යෙදිය හැකි වූ හෝ ඒවා වළක්වාලිය හැකි වූ, අදාළ බලපත්‍රයේ කොන්දේසි සම්බන්ධයෙන් යෝජිත විකරණ.

(4) අමාත්‍යවරයා වෙත කරනු ලබන දැන්වීමක් මගින්, මේ වගන්තිය යටතේ සපයන ලද වාර්තාවට යම් කාරණා එකතු කිරීමෙන් හෝ එයින් කාරණා බැහැර කිරීමෙන්, කොමිෂන් සභාව විසින් යම් අවස්ථාවක දී ඒ වාර්තාව ප්‍රතිශෝධනය කරනු ලැබිය හැකි ය.

(5) වාර්තාව සලකා බැලීමේ දී අමාත්‍යවරයාට සහාය වීම සඳහා කොමිෂන් සභාව විසින්—

(අ) එය විසින් පවත්වනු ලබන විමර්ශනයේ විෂය පථය ඇතුළත අමාත්‍යවරයාට අවශ්‍යවන්නා වූ හෝ අමාත්‍යවරයා වෙත තිබීම උචිත යයි කොමිෂන් සභාව සිතන කාරණාවලට අදාළ, කොමිෂන් සභාව සතු යම් තොරතුරක් ; සහ

(ආ) ඒ විමර්ශනයේ විෂය පථය ඇතුළත කාරණාවලට අදාළව, අමාත්‍යවරයා විසින් ඉල්ලනු ලැබූ, කොමිෂන් සභාව විසින් දෙනු ලැබිය හැකි වෙනත් යම් සහායක්,

අමාත්‍යවරයාට දෙනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වාර්තාවක් පිළියෙල කිරීමෙන් පසුව, හැකි පහසු ඉක්මනින්, කොමිෂන් සභාව විසින්—

(අ) වාර්තාවේ පිටපතක් අදාළ බලපත්‍රලාභියා වෙත භාර දෙනු ලැබිය යුතු ය ; තව ද

(ආ) වාර්තාවේ විස්තර, ඒවායින් බලපෑමක් සිදු විය හැකි තැනැත්තන්ගේ අවධානයට යොමු කිරීම සඳහා උචිත යයි කොමිෂන් සභාව සලකන යම් ආකාරයකින් පළ කරනු ලැබිය යුතු ය.

(7) වාර්තාවේ පිටපතක් බලපත්‍රලාභියා වෙත භාර දීමෙන් දින විස්සක් ඇතුළත, බලපත්‍රලාභියකු විසින් අමාත්‍යවරයා වෙත නියෝජන ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින්, ඔහුගේ හෝ ඇයගේ තීරණය ගැනීමේ දී ඒ නියෝජන සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(8) (2) වන උපවගන්තිය යටතේ වාර්තාව ලැබීමෙන් දින තිස්පහක් ඇතුළත, යෝජිත විකරණ බලාත්මක කළ යුතු බවට හෝ අවස්ථාවෝචිත පරිදි, යෝජිත විකරණ බලාත්මක නොකළ යුතු බවට, අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව වෙත ලිඛිතව උපදෙස් දෙනු ලැබිය යුතු ය. යෝජිත විකරණ බලාත්මක කළ යුතු යයි අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව වෙත උපදෙස් දෙන්නා වූ අවස්ථාවක, වාර්තාවෙහි හඳුනා ගනු ලැබූ මහජන යහපතට අහිතකර බලපෑම්වලට පිළියම් යෙදීමේ හෝ ඒවා වළක්වාලීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාවට පෙනී යන පරිදි, අදාළ බලපත්‍රයේ කොන්දේසිවලට, කොමිෂන් සභාව විසින් ඒ වි කරණ කරනු ලැබිය යුතු ය.

(9) අමාත්‍යවරයා විසින්, (8) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත උපදෙස් දෙනු ලබන විටෙක, ඔහුගේ හෝ ඇයගේ උපදේශය සඳහා හේතු දැක්විය යුතු අතර, 4 වන වගන්තියෙහි දක්වා ඇති අරමුණු කෙරෙහි සැලකිල්ලක් දැක්විය යුතු ය.

(10) අමාත්‍යවරයාගේ උපදේශයේ පිටපතක්, එය අදාළ වන්නා වූ බලපත්‍රලාභියා වෙත කොමිෂන් සභාව විසින් යවනු ලැබිය යුතු අතර, උපදේශය මගින් බලපෑම් ඇති විය හැකි තැනැත්තන්ගේ අවධානයට උපදේශය යොමු කිරීම සඳහා උචිත යයි සලකන යම් ආකාරයකින් උපදේශය ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ විකරණ කිරීමෙන් පසුව, හැකි පහසු ඉක්මණින්, කොමිෂන් සභාව විසින් විකරණවල පිටපතක් බලපත්‍රලාභියා වෙත හා අමාත්‍යවරයා වෙත යවනු ලැබිය යුතු ය.

(11) (අ) මේ වගන්තිය යටතේ කරන ලද විකරණ කිසිවකට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනා කිරීමේ අයිතිය බලපත්‍රලාභියකුට තිබිය යුතු ය;

(ආ) අභියාචනාධිකරණයෙන් හෝ වෙනත් අධිකරණයකින් හෝ විනිශ්චය අධිකාරයකින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරනු ලබන අභියාචනාවලට අදාළ ශ්‍රේෂ්ඨාධිකරණ රීති (1990 ශ්‍රේෂ්ඨාධිකරණ රීතිවල 28 වන රීතිය හෝ ඒ රීතියට අනුරූපී වන නීතියක යම් විධිවිධානයක්) අවශ්‍ය

වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයක් ගොනු කිරීම, විභාග කිරීම හා බැහැර කිරීම හා සම්බන්ධ සියලු කාරණාවල දී හා ඒ සම්බන්ධව අදාළ විය යුතු ය.

බලාත්මක කිරීමේ නියමයන්.

**34**. (1) උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් බලපත්‍රයක යම් කොන්දේසියක් හෝ යම් ව්‍යවස්ථාපිත නියමයක් කඩ කරන බවට හෝ කඩ කිරීමට හැකි බවට කොමිෂන් සභාව සෑහීමට පත්වුවහොත්, බලපත්‍රලාභියා විසින් යම් කොන්දේසියකට හෝ නියමයකට, අනුකූලව කටයුතු කිරීම ස්ථිර කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි යයි සලකනු ලබන යම් විධිවිධානයක් ඇතුළත් බලාත්මක කිරීමේ නියමයක් කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුතු ය.

(2) බලාත්මක කිරීමේ නියමයක් මගින්—

(අ) නියමයෙහි නිශ්චිතව සඳහන් යම් දේවල් කිරීම සඳහා හෝ කිරීම වළක්වාලීම සඳහා එය අදාළ වන බලපත්‍රලාභියාට නියම කරනු ලැබිය යුතු ය ;

(ආ) නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාල පරිච්ඡේදයක් සඳහා බලාත්මක විය යුතු ය ;

(ඇ) කොමිෂන් සභාව විසින් කවර වූ හෝ විටෙක, ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය ; නැතහොත්, විකරණය කරනු ලැබිය හැකි ය. එහෙත් කවර වූ හෝ විටෙක නියමයෙහි නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය අවසානයේ දී බලාත්මක වීම නතර විය යුතු ය.

බලාත්මක කිරීමේ නියමයන් කිරීම සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය.

**35**. (1) 34 වන වගන්තිය යටතේ බලාත්මක කිරීමේ නියමයක් කිරීමට පෙරාතුව, කොමිෂන් සභාව විසින්—

(අ) එවැනි නියමයක් කිරීමට කොමිෂන් සභාව යෝජනා කරන බව ප්‍රකාශ කරමින්, බලාත්මක කිරීමේ නියමය මගින් බලපෑම් සිදුවිය හැකි තැනැත්තන්ගේ අවධානයට කරුණු යොමු කිරීම සඳහා උචිත යයි සිතන යම් ආකාරයකින් දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය ;

(ආ) දැන්වීමේ පිටපතක් සහ යෝජිත නියමයේ පිටපතක් බලපත්‍රලාභියා වෙත භාර දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීමක—

(අ) යෝජිත නියමයට අනුකූලව ස්ථිර වශයෙන්ම කටයුතු කරවීමට අදහස් කෙරෙන අදාළ බලපත්‍ර, කොන්දේසි හෝ ව්‍යවස්ථාපිත නියමයක් ;

(ආ) කොමිෂන් සභාවේ මතය අනුව, ඒ කොන්දේසිය හෝ නියමය කඩ කිරීමක් සංස්ථාපනය කෙරෙන ක්‍රියා හෝ නොකර හැරීම්;

(ඇ) කොමිෂන් සභාවේ මතය අනුව, යෝජිත නියමය කිරීම සාධාරණීකරණය කෙරෙන වෙනත් යම් කාරණා ;

(ඈ) යෝජිත නියමයේ බලපෑම් ; සහ

(ඉ) බලපත්‍රලාභියා විසින්, යෝජිත නියමය සම්බන්ධයෙන් නියෝජන හෝ විරෝධතා ඉදිරිපත් කරනු ලැබිය හැකි, දැන්වීමේ දින සිට දින විසි අටකට අඩු නොවන කාල පරිච්ඡේදය,

දැක්විය යුතු ය.

(3) 34 වන වගන්තිය යටතේ බලාත්මක කිරීමේ නියමයක් කිරීමට පෙරාතුව, (2) වන උපවගන්තිය යටතේ කරන ලද නියෝජන සහ විරෝධතා කිසිවක් කොමිෂන් සභාව විසින් සලකා බැලිය යුතු ය.

(4) (අ) ප්‍රශ්නයට අදාළ කොන්දේසියට හෝ නියමයට අනුකූලව ස්ථිර වශයෙන්ම කටයුතු කිරීම සඳහා බලපත්‍රලාභියා විසින් ගත යුතු යයි කොමිෂන් සභාව සලකන සියලු පියවර ගැනීමට හා ගනු ලබන්නේ යයි බලපත්‍රලාභියකු එකඟ වී ඇති බවට ; හෝ

(ආ) 4 වන වගන්තිය මගින් කොමිෂන් සභාව වෙත පනවනු ලැබ ඇති අරමුණු එසේ කිරීමෙන් වළක්වාලන බවට ; හෝ

(ඇ) කඩ කිරීම් හෝ අපේක්ෂිත කඩ කිරීම් නොවැදගත් බවට,

කොමිෂන් සභාව සෑහීමට පත්වුවහොත්, කොමිෂන් සභාව විසින් බලාත්මක කිරීමේ නියමයක් කරනු නොලැබිය යුතු ය.

(5) බලාත්මක කිරීමේ නියමයක් කිරීමෙන් පසුව හැකි පහසු ඉක්මණින්, කොමිෂන් සභාව විසින්—

(අ) නියමය අදාළ වන බලපත්‍රලාභියා වෙත නියමයේ පිටපතක් භාර දිය යුතු ය; තව ද

(ආ) නියමය මගින් බලපෑම් ඇති විය හැකි තැනැත්තන්ගේ අවධානයට යොමු කිරීම සඳහා උචිත යයි සලකන යම් ආකාරයකින් නියමය පළ කරනු ලැබිය යුතු ය.

(6) බලාත්මක කිරීමේ නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට පෙරාතුව, කොමිෂන් සභාව විසින්—

(අ) යෝජිත ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ නියමය, ඒ මගින් බලපෑම් සිදු විය හැකි තැනැත්තන්ගේ අවධානයට යොමු කිරීම සඳහා උචිත යයි සිතන යම් ආකාරයකින් දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය ;

(ආ) යෝජිත ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ නියමයේ පිටපතක් බලපත්‍රලාභියා වෙත භාර දිය යුතු ය ; තව ද

(ඇ) දැන්වීමට පිළිතුරු වශයෙන් ඉදිරිපත් කරන ලද නියෝජන සහ විරෝධතා කිසිවක් සලකා බැලිය යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ පළ කරන ලද සෑම දැන්වීමකම—

(අ) දැන්වීමෙහි සඳහන් නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා කොමිෂන් සභාව යෝජනා කරන බව සහ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ බලපෑම ප්‍රකාශ විය යුතු ය ; තව ද

(ආ) යෝජිත ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ නියමය සම්බන්ධයෙන් නියෝජන හෝ විරෝධතා කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබිය හැකි, දැන්වීම පළ කිරීමේ දින පටන් දින විසි අටක් පසු නොවන කාල පරිච්ඡේදයක් සඳහන් විය යුතු ය.

(8) (6) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමකට පිළිතුරු වශයෙන් කරන ලද නියෝජන හා විරෝධතා කිසිවක් සැලකිල්ලට ගැනීමෙන් පසුව, දැන්වීම අදාළ වන බලාත්මක කිරීමේ නියමය ප්‍රත්‍යාදිෂ්ට නොකිරීමට කොමිෂන් සභාව තීරණය කරනහොත්, බලපෑමට ලක් වූ තැනැත්තන් වෙත එකී තීරණය පිළිබඳව දැනුම් දිය යුතු ය.

**36.** (1) බලාත්මක කිරීමේ නියමයක් අදාළ වන බලපත්‍රලාභියකුගේ කාර්යය විය යුත්තේ— බලාත්මක කිරීමේ නියමයේ බලපෑම.

(අ) ඒ නියමයට අනුකූලව කටයුතු කිරීම ; හා

(ආ) බලාත්මක කිරීමේ නියමයේ වලංගුභාවය යම් අධිකරණයක දී අභියෝගයට ලක් කිරීමට බලපත්‍රලාභියා තීරණය කරන්නේ නම්, ඒ අභියෝගය නිස්සාර හෝ පීඩාකාරී නොවන බව සහතික කිරීම සඳහා කොමිෂන් සභාව විසින් සාධාරණ යයි සලකන යම් ප්‍රමාණයක ඇපයක් ගාස්තු සම්බන්ධයෙන් කොමිෂන් සභාවට සැපයීම.

(2) බලාත්මක කිරීමේ නියමය කඩ කිරීමක් මගින් බලපෑමට ලක් විය හැකි යම් තැනැත්තකුට බලපත්‍රලාභියා විසින් කාර්යයක් ඉටු කළ යුතුව ඇති අතර, එය කඩකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් පාඩුවක් හෝ අලාභයක් සිදු වන එවැනි යම් තැනැත්තකු විසින්, ඒ පාඩුව හෝ අලාභය සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීම සඳහා, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක බලපත්‍රලාභියාට එරෙහිව නඩුවක් පවරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ බලපත්‍රලාභියකුට එරෙහිව ඉදිරිපත් කරන ලද නීති කෘත්‍යවල දී බලාත්මක කිරීමේ නියමය කඩකිරීම වළක්වාලීම සඳහා බලපත්‍රලාභියා විසින් සියලු සාධාරණ පියවර ගෙන ඇති බවට සහ අවශ්‍ය සියලු උද්යෝගය යෙදූ බවට ඔප්පු කිරීම බලපත්‍රලාභියා සතු විත්තිවාචකයක් වන්නේ ය.

**37.** (1) බලාත්මක කිරීමේ නියමයක් අදාළ වන බලපත්‍රලාභියකු විසින්, ඒ බලාත්මක කිරීමේ නියමයට අනුකූලව කටයුතු කිරීම සම්පූර්ණ වශයෙන් හෝ අඩ වශයෙන් පැහැර හරිනු ලැබුවහොත්, බලපත්‍රලාභියා මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන එකකට නොඅඩු සහ රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට සහ වරදකරු කිරීමෙන් පසු, ඒ කඩකිරීම අඛණ්ඩව කෙරෙන සෑම දිනයක් සඳහා ම, රුපියල් ලක්ෂ පහක වැඩිදුර දඩයකට ද ඔහු යටත් විය යුතු ය. වැරදි.

(2) මේ කොටස යටතේ බලාත්මක කිරීමේ නියමයක් කිරීමේ දී, ඒ නියමයෙහි සඳහන් කඩකිරීමෙන් පීඩාවට පත් යම් තැනැත්තකුට, බලාත්මක කිරීමේ නියමය අදාළ වන බලපත්‍රලාභියා විසින් වන්දි ගෙවිය යුතු යයි විධාන කිරීමට කොමිෂන් සභාවට හිමිකම ඇත්තේ ය.

(3) මේ වගන්තිය යටතේ පනවනු ලැබිය හැකි දඩ සහ වන්දි මාර්ගයෙන් කරනු ලබන අයකිරීම්, අනුකූලව කටයුතු නොකිරීම පිළිබඳව වරදකරු වූ තැනැත්තාගේ වෙත යම් බැඳීමක් හීන කිරීමට නොව, ඊට අතිරේකව විය යුතු ය.

(4) යම් බලාත්මක කිරීමේ නියමයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් යම් බලපත්‍රලාභියකුට එරෙහිව කොමිෂන් සභාව විසින් නඩු පැවරීමක් කරනු ලැබ ඇත්තේ වුව ද, එය නොතකා බලපත්‍රලාභියකු විසින් බලාත්මක කිරීමේ නියමයකට අනුකූලව කටයුතු කිරීම ස්ථිර කිරීමේ ඉන්ජන්ෂන් තහනමක් හෝ පිළියමක් ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් අධිකරණයක් වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

බලපත්‍රලාභියාගේ ව්‍යාපාරයේ කළමනාකරණය සහ පාලනය වෙනත් අධිකාරයක් හෝ තැනැත්තකු වෙත පැවරීමේ කොමිෂන් සභාව සතු බලය.

**38**. (1) (අ) කොමිෂන් සභාව විසින් කරන ලද බලාත්මක කිරීමේ නියමයකට යටත් වූ ; හෝ

(ආ) වස්තු භංගත්ව අවස්ථාවකට යටත් වූ,

බලපත්‍රලාභියකු විසින්, බලපත්‍රය යටතේ කරගෙන යාමට බලය දී ඇති කටයුතු නිසියාකාරව කරගෙන නොයන බවට සහ පාරිභෝගිකයන්ට විදුලිය සැපයීම කාර්යක්ෂමව, සහතිකව ම හා සුරක්ෂිතව නොකරන බවට හෝ කරනු ලබන්නේ යයි සිතිය නොහැකි බවට කොමිෂන් සභාව සෑහීමට පත් වී ඇති අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් බලපත්‍රලාභියාගේ සම්පූර්ණ ව්‍යාපාරයේ හෝ ඉන් කොටසක කළමනාකරණය හා පාලනය නියමයෙහි සඳහන් වෙනත් යම් අධිකාරියක් වෙත හෝ තැනැත්තකු වෙත පවරනු ලැබිය හැකි අතර, ව්‍යාපාරය කරගෙන යාම සඳහා අවශ්‍ය සියලු බලතල ඒ අධිකාරියට හෝ තැනැත්තාට තිබිය යුතු ය :

එසේ වුව ද, බලාත්මක කිරීමේ නියමයකට යටත්ව සිටින බලපත්‍රලාභියා නීතියක් මගින් පිහිටුවන ලද තැනැත්තකු වන සහ එකී බලාත්මක කිරීමේ නියමයට අනුකූලවීමට එම නීතියේ විධිවිධාන ඒ තැනැත්තාට අවසර නොදෙන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් මේ වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම වෙනුවට, එකී බලාත්මක කිරීමේ නියමයට එකඟව ක්‍රියා කිරීම සුරක්ෂිත කිරීම සඳහා, එකී තැනැත්තාගේ ක්‍රියාකාරකම් පිළිබඳ සොයා බැලීම පවරා දී ඇති අමාත්‍යවරයා වෙත, කොමිෂන් සභාවට උචිත ලෙස පෙනී යන නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ව්‍යාපාරයක කළමනාකරණය හා පාලනය පවරනු ලැබ ඇති යම් තැනැත්තකු හෝ අධිකාරියක්, බලපත්‍රලාභියාගේ ව්‍යාපාරයේ කළමනාකරණය හා පාලනය අඛණ්ඩව කරගෙන යාමේ හේතුව මත, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ වංචනික වරණයක් ලෙස සැලකෙන පැවැත්මක වගකීමට යටත් නොවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ කිසිම නියමයක් යෝජිත නියමය පිළිබඳ ලිඛිත දැනුම්දීමක් සහ කරුණු ඉදිරිපත් කිරීමේ සාධාරණ අවස්ථාවක් අදාළ බලපත්‍රලාභියාට ලබාදීමකින් තොරව කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ නියමයක් බලාත්මකව පවත්නා යම් කාල පරිච්ඡේදයක් තුළ දී—

(අ) කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව, බලපත්‍රලාභියාට (අවස්ථාවෝචිත පරිදි) ස්වේච්ඡාවෙන් හෝ අනිවාර්යයෙන් ගණන් බේරා වසා දැමීමකට හෝ එවැනි ගණන් බේරා වසා දැමීමක් අඛණ්ඩව කරගෙන යාමට හෝ භාජනය නොකළ යුතු ය ;

(ආ) කොමිෂන් සභාව වෙත ලියවිල්ලකින් වූ දින දහයක පූර්ව දැනුම් දීමක් නොමැතිව, බලපත්‍රලාභියාගේ දේපළ සම්බන්ධයෙන් නඩු තීන්දුවක් හෝ ඇපයක් බලාත්මක කිරීම හෝ ක්‍රියාවේ යෙදවීම සඳහා යම් තැනැත්තකු විසින් කිසිදු පියවරක් ගනු නොලැබිය යුතු ය ; සහ

(ඇ) ව්‍යාපාරය හෝ එහි යම් කොටසකට අදාළව, බලපත්‍රය යටතේ වූ ස්වකීය අයිතිවාසිකම් කිසිවක් බලපත්‍රලාභියා විසින් ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ වස්තු භංගත්ව අවස්ථාව යන්නෙන්—

(අ) ඒකාබද්ධ කිරීමේ හෝ ප්‍රතිනිර්මාණය කිරීමේ කාර්යය සඳහා නොවන, බලපත්‍රලාභියකුගේ ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් වූ යෝජනාවක් සම්මත කිරීම; හෝ

(ආ) බලපත්‍රලාභියාගේ ණය හිමියන් සමග බලපත්‍රලාභියා සමථයකට එළඹීම; හෝ

(ඇ) බලපත්‍රලාභියා විසින් ණය ගෙවීම අත්හිටුවීම හෝ බලපත්‍රලාභියාගේ ණය ගෙවීමට බලපත්‍රලාභියාට නොහැකි වීම හෝ බලපත්‍රලාභියා බුන්වත් වූ හෝ වස්තු භංගත්වයට පත් වූ බව ප්‍රකාශයට පත් කිරීම; හෝ

(ඈ) බලපත්‍රලාභියා ගණන් බේරා වසා දමනු ලැබීම සම්බන්ධයෙන් පෙත්සමක් ගොනු කිරීම,

අදහස් වේ.

ආරාවුල් නිරවුල් කිරීම.

**39**. (1) විදුලි බලය සැපයීම හෝ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පැන නගින පහත දැක්වෙන ආරාවුල්, ආරාවුලේ යම් පාර්ශ්වකරුවකු විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය යුතු ය—

(අ) මේ පනතේ 25 සිට 30 දක්වා වගන්ති යටතේ හෝ I වන, II වන හෝ III වන උපලේඛන යටතේ පැන නගින බලපත්‍රලාභියකු හා අයකුම පාරිභෝගිකයකු අතර ආරාවුලක්;

(ආ) බලපත්‍රලාභියා විසින් තම උපරිම උත්සාහයක් යොදා තිබියදීත් කොමිෂන් සභාව විසින් නියම කරන ලද යම් ආරාවුල් නිරවුල් කිරීමේ කාර්ය පටිපාටියක් මගින් නිරවුල් කර ගැනීමට පාර්ශ්වකරුවන්ට නොහැකි වූ, බලපත්‍රලාභියකු සහ—

(i) අයකුම ගනුදෙනුකරුවකු අතර;

(ii) වෙනත් බලපත්‍රලාභියකු අතර; හෝ

(iii) බලපෑමට ලක්වන වෙනත් යම් පාර්ශ්වකරුවකු අතර හෝ,

(අ ඡේදයෙහි සඳහන් ආරාවුලක් නොවන) යම් ආරාවුලක්.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වන යොමු කිරීමක් මත කොමිෂන් සභාව විසින් ආරාවුල මැදිහත් වී නිරවුල් කරනු ලැබිය යුතු අතර, (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වන යොමු කිරීමක් මත, අධිකරණය මගින් හෝ බේරුම් කිරීම මගින් ආරාවුල නිශ්චය කිරීම වඩා උචිත යයි කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන්නේ නම් මිස, ආරාවුල කොමිෂන් සභාව විසින් මැදිහත් වී නිරවුල් කරනු ලැබිය යුතු ය.

(3) එවැනි යම් ආරාවුලක් නිරවුල් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය හා කාර්යය පටිපාටිය විය යුත්තේ 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත සහ මේ පනත යටතේ සාදන ලද, කොමිෂන් සභාව මගින් දක්වා ඇති රීති අනුව විය යුතු ය.

(4) මෙම පනතේ 27 වන වගන්තිය යටතේ පැන නගින යම් ආරාවුලක් මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිරවුල් කරනු ලබන අවස්ථාවක, ආරාවුල නිරවුල් කරන තෙක් දිය යුතු ආරක්ෂාවක් (වේනොත්), ඒ පිළිබඳව කොමිෂන් සභාව විසින් විධාන දෙනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරනු ලබන නිරවුල් කිරීමකට—

(අ) යෝග්‍ය යයි කොමිෂන් සභාව සලකන (කොමිෂන් සභාව විසින් දරන ලද ගාස්තු හෝ වියදම් සම්බන්ධයෙන් කවර පාර්ශ්වකරුවකු විසින් හෝ මුදලක් ගෙවිය යුතු යයි නියම කෙරෙන විධිවිධාන ඇතුළුව) යම් අවස්ථානුගත පරිපූරක සහ ආනුෂංගික විධිවිධාන ඇතුළත් විය හැකි ය; සහ

(ආ) කොමිෂන් සභාව විසින් දරන ලද ගාස්තු හෝ වියදම් සම්බන්ධයෙන් ඒ විධිවිධාන ඇතුළත් වන තාක් දුරට, එය මුදල් ගෙවීම සඳහා කොළඹ දිසා අධිකරණය විසින් ඒ අධිකරණයේ දී කරන ලද තීන්දු ප්‍රකාශයක් වූවාක් මෙන් අවසානාත්මක හා බලාත්මක කළ හැකි විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වූ නිරවුල් කිරීමක ගාස්තු හා වියදම් පිළිබඳ විධිවිධානයක් ඇතුළත් කිරීමේ දී, පාර්ශ්වකරුවන්ගේ පැවැත්ම හා වත්කම් ද, අදාළ වෙනත් යම් අවස්ථානුගත කරුණු පිළිබඳව ද කොමිෂන් සභාව විසින් සැලකිල්ලක් දැක්විය යුතු ය.

## IV වන පරිච්ඡේදය

## පාරිභෝගික ආරක්ෂාව

40. (1) විදුලි බලය සැපයීම හා අයකුම් ගණුදෙනුකරුවන්ට විදුලි බලය සැපයීමේ විධිවිධාන සම්බන්ධයෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් අත් කරගත යුතු ඉටු කිරීමේ ප්‍රමිති නියම කරමින් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

විදුලි බලය සැපයීම සඳහා වන ඉටුකිරීමේ ප්‍රමිතිය.

(2) බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් විදුලි බලය සැපයීමේ දී හෝ අයකුම් ගණුදෙනුකරුවන්ට විදුලිබල සැපයීම් සේවා ලබා දීමේ දී බෙදාහැරීමේ බලපත්‍රලාභීන් යටත් විය යුතු යයි නියම කර ඇති විශේෂ අවස්ථානුගත කරුණු හෝ කොන්දේසි සැලකිල්ලට ගනිමින් විවිධ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් විවිධ ප්‍රමිති නියම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ සඳහන් නියෝග, ක්‍රියාවේ යෙදිය හැකිතාක් දුරට, බෙදා හැරීමේ බලපත්‍රලාභීන් හා යෝජිත නියෝග මගින් බලපෑමක් ඇති වේ යයි සිතිය හැකි පුද්ගල නියෝජිත මණ්ඩල විමසීමෙන් පසුව, සාදනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියමිත යම් ප්‍රමිතියක් සපුරාලීම පිළිබඳ බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ පැහැර හැරීම හේතුකොටගෙන නියමිත විස්තරයක වූ යම් පාඩුවක් හෝ අලාභයක් යම් තැනැත්තකුට සිදු වන අවස්ථාවක, ඒ නියෝගවල සඳහන් පරිදි, යම් ප්‍රමාණයක හෝ යම් ආකාරයකින් ගණනය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක වන්දියක්, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් ඒ තැනැත්තාට ගෙවනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියමිත ප්‍රමිතියක් සපුරාලීම, බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් පැහැර හැරීම සම්බන්ධයෙන් (4) වන උපවගන්තියේ විධිවිධානවල සලස්වා ඇති පරිදි යම් තැනැත්තකු වෙත වන්දියක් ගෙවීම, ඒ පැහැර හැරීම සංස්ථාපනය කෙරෙන ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තාට ලැබී ඇති වෙනත් යම් පිළියමකට හානියක් නොමැතිව කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ සාදන ලද නියෝග බලාත්මක කිරීමෙන් පැන නගින යම් ආරාවුලක්, බෙදාහැරීමේ බලපත්‍රලාභියකු හෝ අයකුම ගණුදෙනුකරුවකු හෝ බලපෑමට ලක් වූ වෙනත් යම් පාර්ශ්වකරුවකු විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාව විසින්, 39 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ ආරාවුල නිරවුල් කරනු ලැබිය හැකි ය.

විදුලි බලයේ සමස්ත ඉටු කිරීමේ මට්ටම හා කාර්යක්ෂම භාවිතය පිළිබඳ ප්‍රමිති.

41. (1) කොමිෂන් සභාව විසින් කලින් කලට, බෙදා හැරීමේ බලපත්‍රලාභීන් හා බලපෑමක් ඇතිවේ යයි සිතිය හැකි තැනැත්තන් නියෝජනය කරන බවට කොමිෂන් සභාවට පෙනී යන තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල විමසා බැලීමෙන් පසුව,—

(අ) කොමිෂන් සභාවේ මතය අනුව විදුලි බලය සැපයීමේ හා විදුලි බලය සැපයීම් සේවාවල තත්ත්වය සහ ඒ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් සපුරාගත යුතු පාරිභෝගිකයන් විසින් කාර්යක්ෂම ලෙස විදුලි බලය පාවිච්චි කිරීම ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධ සමස්ත ඉටු කිරීමේ මට්ටමේ ප්‍රමිති නිශ්චය කරනු ලැබිය හැකි ය ; තව ද

(ආ) එසේ නිශ්චය කරනු ලැබූ ප්‍රමිති, උචිත යයි සලකන යම් ආකෘතියකින් හා යම් ආකාරයක ප්‍රසිද්ධියට පත් කරනු ලැබීමට කටයුතු පිළියෙල කරනු ලැබිය හැකි ය.

(2) විවිධ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් සම්බන්ධයෙන්, ඒ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් විදුලි බලය සැපයීමට නියමිත හෝ ඔවුන් යටත් විය යුතු විශේෂ අවස්ථානුගත කරුණු හෝ කොන්දේසි සැලකිල්ලට ගනිමින්, මේ වගන්තිය යටතේ විවිධ ප්‍රමිති නිශ්චය කරනු ලැබිය හැකි ය.

42. (1) කොමිෂන් සභාව විසින්,— ඉටුකිරීමේ මට්ටම් සම්බන්ධයෙන් තොරතුරු.

(අ) 40 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග යටතේ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් ගෙවනු ලැබූ වන්දි (ඇතොත්) ;

(ආ) විදුලි බලය සැපයීම හා විදුලිබල සැපයීම් සේවා සම්බන්ධයෙන් ඒ බලපත්‍රලාභීන් විසින් සපුරාගනු ලැබූ සමස්ත ඉටු කිරීමේ මට්ටම් ; සහ

(ඇ) පාරිභෝගිකයන් විදුලි බලය කාර්යක්ෂම ලෙස පාවිච්චිකිරීම ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඒ බලපත්‍රලාභීන් විසින් සපුරා ගනු ලැබූ ඉටු කිරීමේ මට්ටම්,

පිළිබඳ තොරතුරු කලින් කල එක්රැස් කරගනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් දෙන ලද විධානයක සඳහන් කරනු ලැබිය හැකි එක් එක් වර්ෂයේ යම් දිනයක හෝ ඊට පෙරාතුව,—

(අ) 40 වන වගන්තිය යටතේ වූ නියෝග මගින් නියමිත එක් එක් ප්‍රමිතිය සම්බන්ධයෙන් වන්දි ගෙවනු ලැබූ අවස්ථා ගණන හා ගෙවූ වන්දියේ මුළු එකතුව හෝ අගය ; සහ

(ආ) 41 වන වගන්තිය යටතේ නිශ්චය කරනු ලැබූ එක් එක් ප්‍රමිතිය සම්බන්ධයෙන්, කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි බලපත්‍රලාභියා විසින් සපුරා ගත් ඉටු කිරීමේ මට්ටම පිළිබඳ යම් තොරතුරු,

ඇතුළුව නියම කරනු ලබන, ප්‍රමිතිවලට අදාළ යම් තොරතුරු, එක් එක් බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් කොමිෂන් සභාව වෙත සපයනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය මගින් බලපත්‍රලාභියා විසින් කිරීමට නියමිත යම් දෙයක් කිරීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින බෙදා හැරීමේ බලපත්‍රලාභියකු යම් වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, කොමිෂන් සභාවේ අරමුදලට ගෙවිය යුතු රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හා වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද තවදුරටත් කරගෙන යනු ලබන එක් එක් දවස සඳහා රුපියල් පණස් දහස බැගින් වූ අමතර දඩයකට ද යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් එක්රැස් කරන ලද්දා වූ හෝ එය වෙත සපයන ලද්දා වූ තොරතුරුවලින් බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ ගණුදෙනුකරුවන්ට හෝ විය හැකි ගණුදෙනුකරුවන්ට දීමට සුදුසු යයි පෙනී යන යම් ප්‍රමාණයකට වූ තොරතුරු උචිත යයි සලකන යම් ආකෘතියක හා යම් ආකාරයකින් 59 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සෑම වර්ෂයකම යටත් පිරිසෙයින් එක් වරක්වත් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

## V වන පරිච්ඡේදය

## නව උත්පාදන පිරියත හා ඉහළින් යන විදුලි මාර්ග

නව උත්පාදන පිරියතයක් සැපයීම හා පවත්නා පිරියත දීර්ඝ කිරීම.

**43**. (1) 8 වන වගන්තියට යටත්ව කිසිම තැනැත්තකු විසින් මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් බලය දී ඇති පරිදි හැර, යම් නව උත්පාදන පිරියතක් ක්‍රියාත්මක කිරීම හෝ සැපයීම ද, පවත්නා යම් උත්පාදන පිරියතක් දීර්ඝ කිරීම ද කරනු නොලැබිය යුතු ය.

(2) සම්ප්‍රේෂණය කිරීමේ බලපත්‍රලාභියකු විසින්, කොමිෂන් සභාවේ අනුමතයට යටත්ව, සම්ප්‍රේෂණය කිරීමේ බලපත්‍රයේ කොන්දේසිවලට හා නියෝග මගින් නියම කරනු ලැබිය හැකි සැපයීමට අදාළ යම් මාර්ගෝපදේශවලට අනුකූලව සහ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින්, දැන්වීමෙහි සඳහන් පරිදි, නව උත්පාදන පිරියතක් සැපයීම සඳහා හෝ පවත්නා උත්පාදන පිරියතක් දීර්ඝ කිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමෙහි සඳහන් නව උත්පාදන පිරියත සැපයීම සඳහා හෝ පවත්නා උත්පාදන පිරියත දීර්ඝ කිරීම සඳහා, ඒ දැන්වීමට පිළිතුරු වශයෙන් තාක්ෂණික වශයෙන් පිළිගත හැකි ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද තැනැත්තන් අතුරෙන් අඩුම පිරිවැයකින් සැපයිය හැකි තැනැත්තකු, කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව සම්ප්‍රේෂණය කිරීමේ බලපත්‍රලාභියා විසින් තෝරා ගනු ලැබිය යුතු ය.

44. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කිසිම තැනැත්තකු විසින්, කොමිෂන් සභාව විසින් දෙන ලද අනුමතියට අනුකූලව හැර, පොළවට ඉහළින් හෝ පොළව යටින් හෝ විදුලි මාර්ගයක්—

ඉහළින් යන සහ පොළව යටින් යන විදුලි මාර්ග සඳහා අවශ්‍ය අනුමතිය.

(අ) සවිකිරීම ; හෝ

(ආ) සවිකර තැබීම හෝ,

කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන,—

(අ) කිලෝවෝල්ට් තිස්තුනක් දක්වා සහ කිලෝවෝල්ට් තිස්තුනක නාමමාත්‍රික වෝල්ටීයතාවක් හෝ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබීමට සුදුසු යයි සලකනු ලබන වෙනත් යම් ඉහළ වෝල්ටීයතාවයක් ඇති විදුලි මාර්ග හෝ පොළව යටින් යන කේබල සම්බන්ධයෙන් ;

(ආ) විදුලි මාර්ගයක් සවිකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තා පදිංචිව සිටින හෝ ඔහුගේ පාලනය යටතේ වූ හෝ පරිශ්‍රය ඇතුළත දැනට තිබෙන හෝ ඉදිරියට තිබිය හැකි හෝ ප්‍රමාණයේ විදුලි මාර්ගයක් සම්බන්ධයෙන්,

අදාළ නොවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ දෙන ලද අනුමතියකට—

(අ) යෝග්‍ය යයි කොමිෂන් සභාවට පෙනී යන (විදුලි මාර්ගයේ අයිතිය හා මෙහෙය වීම පිළිබඳ කොන්දේසි ද ඇතුළුව) යම් කොන්දේසි ඇතුළත් කරනු ලැබිය හැකි ය ;

(ආ) අනුමතියෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් කාල පරිච්ඡේදයක් අවසන් වීමෙන් පසුව, යම් අවස්ථාවක දී කොමිෂන් සභාව විසින් අනුමතිය වෙනස් කරනු ලැබීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබීම කළ හැකි ය ; තව ද

(ඇ) (ආ) ඡේදයට යටත්ව, අනුමතියෙහි සඳහන් හෝ ඒ මගින් හෝ ඒ යටතේ නිශ්චය කරන ලද යම් කාල පරිච්ඡේදයක් සඳහා අඛණ්ඩව බලාත්මක විය යුතු ය.

අධි වෝල්ටීය විදුලි මාර්ග.

**45.** මේ පනතේ කාර්ය සඳහා විදුලි මාර්ගයක් "අධි වෝල්ටීය විදුලි මාර්ගයක්" යනුවෙන් නම් කළ යුතු යයි කොමිෂන් සභාව විසින් විධාන කරනු ලැබිය හැකි ය.

## VI වන පරිච්ඡේදය

## මූල්‍ය

වාර්ෂික බද්ද.

**46.** (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයකින් වූ වාර්ෂික බද්දක් පනවා සෑම බලපත්‍රලාභියකුගෙන් ම අය කර ගනු ලැබිය යුතු ය.

(2) කිසියම් වර්ෂයක් සඳහා වාර්ෂික බද්ද තීරණය කිරීමේ දී කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන කරුණු කෙරෙහි සැලකිල්ල දැක්විය යුතු ය—

(අ) ඒ වර්ෂය සඳහා කොමිෂන් සභාවේ තක්සේරු කළ වියදම ; සහ

(ආ) පසුගිය වර්ෂයෙන් අය කර නොගත් කිසියම් වියදමක්.

(3) කිසියම් වර්ෂයක් සඳහා බලපත්‍රලාභියකු මත (1) වන උපවගන්තිය යටතේ පනවන ලද බද්ද බලපත්‍රලාභියා විසින් ඒ වර්ෂයේ ජූනි මස තිස් වන දිනට කලින් කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් වර්ෂයක් සඳහා පනවන ලද බද්ද ඒ වර්ෂයේ ජූනි මස තිස් වන දිනට කලින් ගෙවීම බලපත්‍රලාභියා විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, බද්ද ගෙවීම පැහැර හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, සභාපතිවරයා විසින් බලපත්‍රලාභියාගෙන් අය විය යුතු බදු ප්‍රමාණය සහතික කළ යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද සහතිකයේ සඳහන් වන බලපත්‍රලාභියාගේ ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන්නේ කවර දිසා අධිකරණයක අධිකරණ බල සීමාව ඇතුළත ද, ඒ දිසා අධිකරණය ඉදිරියේ එකී සහතිකය ඉදිරිපත් කරනු ලැබූ විට, අධිකරණය විසින්, සහතිකයේ නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණය අය කර ගැනීම සඳහා අවශ්‍ය කරනු ලබන ඒ බලපත්‍රලාභියාගේ නිශ්චල හෝ චංචල දේපළ සියල්ලම හෝ ඉන් කිසිවක් තහනමට ගෙන විකිණීමට

පිස්කල්වරයාට බලය දෙමින් ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් පිස්කල් වරයා වෙත නිකුත් කළ යුතු අතර, ඒ රිට් ආඥාව ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා සහ ඒ තහනමට ගැනීමට හා විකිණීමට සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ සභාපතිවරයා විසින් සහතිකය නිකුත් කරන අවස්ථාවක, ඔහු හෝ ඇය විසින් සහතිකයේ නිශ්චිතව සඳහන් බලපත්‍රලාභියා වෙත ඔහු හෝ ඇය විසින් සහතිකයේ නිශ්චිතව සඳහන් මුදල ගෙවිය යුතු බවට ලිඛිතව දැන්විය යුතු නමුත්, එවැනි දැන්වීමක් නොලැබීම හේතුවෙන් මේ වගන්තිය යටතේ පවරන ලද යම් නඩු කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

(7) මේ වගන්තියේ කිසිවකින්, පැහැර හරිනු ලැබූ යම් බද්දක ප්‍රමාණය වෙනත් යම් ආකාරයකින් අය කර ගැනීම පිණිස කොමිෂන් සභාව සතු අයිතියට බලපෑමක් නොවිය යුතු ය ; නැතහොත් බලපෑමක් වන්නේ යයි නොසැලකිය යුතු ය.

47. මේ පනත යටතේ බලපත්‍රලාභියකු විසින් කොමිෂන් සභාව වෙත කරන ගෙවීම්වලින් එකතුවන සියලු මුදල්, කොමිෂන් සභාවේ අරමුදලට බැර කළ යුතු ය. කොමිෂන් සභාවේ අරමුදලට මුදල් බැර කළ යුතු බව.

## VII වන පරිච්ඡේදය

## වැරදි සහ නියෝග

48. (1) මේ පනතේ යම් විධිවිධානයක හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ මේ පනතේ යම් විධිවිධානයක් යටතේ පනවන ලද යම් නියම කිරීමක් හෝ කොමිෂන් සභාවේ යම් තීරණයක්, විධානයක්, නියමයක් හෝ නිශ්චය කිරීමක් උල්ලංඝනය කරන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මේ පනතේ අන්‍යාකාර ලෙස ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇත්තේ නම් හැර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන එකකට නොඅඩු දඩයකට යටත් විය යුතු ය ; කවර හේතුවක් නිසා වුවද වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද අඛණ්ඩව කර ගෙන යන්නේ නම්, වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද නොකඩවා කරනු ලබන එක් එක් දිනයක් සඳහා රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන තවදුරටත් වූ දඩයකට යටත් විය යුතු ය. සාමාන්‍ය දණ්ඩන.

(2) මේ පනත යටතේ යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබීමෙන් පසු, වරද සඳහා නියමිත යම් දඩුවමක් පැනවීමට අමතරව හෝ පැනවීම වෙනුවට මහේස්ත්‍රාත්වරයකු විසින්, වරද සිදු කිරීම සඳහා උපයෝගී කර ගත් යම් සවි කිරීමක් හෝ වෙනත් උපකරණයක් ආඥාවේ නිශ්චිතව සඳහන් දිනයකට පෙරාතුව ගලවා ඉවත් කරන ලෙස විධාන කරමින් මහේස්ත්‍රාත්වරයකු විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, කොමිෂන් සභාව ලිඛිතව බලය දෙන ලද නිලධරයකු විසින් මේ පනත යටතේ වූ වරදක් සඳහා මහේස්ත්‍රාත් අධිකරණයක නඩු කටයුතු ආරම්භ කරනු ලැබිය හැකි ය.

(4) මේ පනත යටතේ වූ වරදක් සඳහා වන කිසිදු අපරාධ නඩු පැවරීමක් කොමිෂන් සභාවේ ලිඛිත අනුමතය ඇතිව හැර ආරම්භ නොකළ යුතු ය.

විදුලි බලය නිස්සාරණ වරදක් බව.

49. (1) සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ —

(අ) සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ ක්‍රියාදාමය තුළ පවත්නා විදුලිබලය ; සහ

(ආ) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු හෝ වෙනත් විදුලි බලය සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ ව්‍යාපාරයක් සමඟ ඇතිකර ගන්නා ලද ගිවිසුමක් ප්‍රකාරව හැර අන්‍යාකාර ලෙස,

විදුලිය ලබා ගන්නා වූ, භාවිත කරන්නා වූ හෝ නිස්සාරණය කරන්නා වූ සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසක මුදලක් නොඉක්මවන දඩයකට අමතරව, ඒ වරද සෑදුනා වූ ක්‍රියාවේ හෝ පැහැර හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බලපත්‍රලාභියාට සිදු වූ පාඩුවේ හෝ අලාභහානියේ අගයට සමාන මුදලකින් වූ දඩයක් ඒ තැනැත්තා මත පැනවිය යුතු අතර, ඒ අමතර දඩය වශයෙන් අය කර ගනු ලබන මුදල, බලපත්‍රලාභියා විසින් අධිකරණය වෙත කරනු ලැබූ ඉල්ලීමක් මත ඒ බලපත්‍රලාභියාට ගෙවිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක් සිදු කිරීමට ආධාර හෝ අනුබල දෙන කිසියම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, ප්‍රධාන වරද සඳහා විධිවිධාන සලස්වා ඇති පරිදි ම වූ දඬුවමකට යටත් විය යුතු ය. එකම වරද සිදු කිරීම සම්බන්ධයෙන් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් ප්‍රධානයා වශයෙන් වුව ද නැතහොත් අනුබල දෙන්නා වශයෙන් වුව ද වරදකරු කරනු ලැබූ අවස්ථාවක ඒ අලාභහානියේ හෝ පාඩුවේ අගය ඒ තැනැත්තන් අතර බෙදා වෙන් කළ යුතු අතර, එසේ බෙදා වෙන් කළ ප්‍රමාණය දඩයක් වශයෙන් ඒ එක් එක් තැනැත්තා වෙත පැනවිය යුතු ය.

(3) ඊට පටහැනිව සාක්ෂි නොමැති විට, බලපත්‍රලාභියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඒ පාඩුවේ හෝ අලාභහානියේ අගය පිළිබඳ සාක්ෂියක් ලෙස පිළිගත යුතු ය. යම් ගිවිසුමක් නොමැති විට, යම් පාරිභෝගිකයකුට සපයනු ලබන විදුලි බලය සඳහා බලපත්‍රයේ විධිවිධාන සලස්වා ඇති යම් අය කිරීම් ක්‍රමයකට අනුව බලපත්‍රලාභියා විසින් අය කිරීම් කරනු ලැබිය හැකි ය.

විදුලිය අනිසි ලෙස භාවිතය වරදක් විය යුතු බව.

**50.** (1) මේ පනතේ II වන උපලේඛනයේ විධිවිධානවලට අගතියක් නොවන පරිදි —

(අ) බලපත්‍රලාභියාගේ බලයලත් නිලධරයකු නොවන්නා වූ හෝ යම් මීටරයකට, දර්ශකයට හෝ වෙනත් උපකරණයකට නැතහොත් යම් මීටරයකින්, දර්ශකයකින් හෝ වෙනත් උපකරණයකින් විදුලි බලය සපයනු ලබන්නේ හෝ සපයනු ලැබිය හැකි වන්නේ කවර විදුලි මාර්ගයක් ඔස්සේ ද ඒ විදුලි මාර්ගය සම්බන්ධ කරන හෝ විසන්ධි කරන සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) බලපත්‍රලාභියාගේ එකඟත්වය නොමැතිව බලපත්‍රලාභියාට අයිති යම් විදුලිය මාර්ගයකට, යන්ත්‍රෝපකරණයකට, උපකරණයකට හෝ කර්මාන්තයකට සම්බන්ධ කිරීමක් ඇති කිරීමේ කාර්යය සඳහා යම් විදුලි රැහැනක් අදින්නා වූ හෝ ඇදීමට සලස්වන්නා වූ නැතහොත් යම් විදුලි රැහැනක්, යන්ත්‍රෝපකරණයක්, උපකරණයක් හෝ කර්මාන්තයක් සම්බන්ධ කරන්නා වූ සෑම තැනැත්තකු ම,

මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසකට නො අඩු සහ රුපියල් පනස් දහසක මුදලක් නොඉක්මවන

දඩයකට අමතරව, ඒ වරද සැදුනා වූ ක්‍රියාවේ හෝ පැහැර හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බලපත්‍රලාභියාට සිදු වූ පාඩුවේ හෝ අලාභහානියේ අගයට සමාන මුදලකින් වූ දඩයක් ඒ තැනැත්තා මත පැනවිය යුතු අතර, ඒ අමතර දඩය වශයෙන් අය කරගනු ලබන මුදල, බලපත්‍රලාභියා විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට ඒ බලපත්‍රලාභියාට ගෙවිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක් සිදු කිරීමට ආධාර හෝ අනුබල දෙන කිසියම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, ප්‍රධාන වරද සඳහා විධිවිධාන සලස්වා ඇති පරිදි ම වූ දඬුවමකට යටත් විය යුතු ය. එකම වරද සිදු කිරීම සම්බන්ධයෙන් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක්, ප්‍රධානයා හෝ අනුබල දෙන්නා වශයෙන් වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක ඒ අලාභහානියේ හෝ පාඩුවේ අගය ඒ තැනැත්තන් අතර බෙදා වෙන් කළ යුතු අතර, එසේ බෙදා වෙන් කළ ප්‍රමාණය දඩයක් වශයෙන් ඒ එක් එක් තැනැත්තා වෙත පැනවිය යුතු ය.

(3) බලපත්‍රලාභියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඒ පාඩුවේ හෝ අලාභහානියේ අගය පිළිබඳ සාක්ෂියක් ලෙස ඊට පටහැනිව සාක්ෂි නොමැති විට පිළිගත යුතු ය. යම් ගිවිසුමක් නොමැති විට, යම් පාරිභෝගිකයකුට සපයනු ලබන විදුලි බලය සඳහා බලපත්‍රයේ විධිවිධාන සලස්වා ඇති අය කිරීමේ ක්‍රමයකට අනුව බලපත්‍රලාභියා විසින් අය කිරීම් කරනු ලැබිය හැකි ය.

(4) වරදකරු කිරීමෙන් පසු ඒ වරද අඛණ්ඩව කර ගෙන යන විට, වරදකරු කිරීමෙන් පසු ඒ වරද අඛණ්ඩව කර ගෙන යන එක් එක් දිනයක් සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන තවදුරටත් වූ දඩයක් පැනවිය යුතු ය.

(5) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් ව තිබුන ද, 49 වන වගන්තිය යටතේ හෝ මේ වගන්තිය යටතේ වූ සෑම වරදක්ම, ඒ පනතේ අර්ථානුකූලව සහ එකී කාර්ය සඳහා සංඥය වරදක් විය යුතු අතර, ඇප දිය නොහැකි වරදක්ද වේ.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

51. මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරන අවස්ථාවක —

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු සහ නිලධරයකු ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යවසායක් නම් ඒ ආයතනයේ සෑම හවුල්කරුවකු ම,

ඒ වරද සම්බන්ධයෙන් වරදකරු විය යුතු බවට සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමෙහි ලා තමා නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා හෝ ව්‍යවසායේ හවුල්කරුවකු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු හෝ ඇය ඒ වරදට වරදකරු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය සඳහා දේපළ අත් කර ගැනීම.

**52**. (1) යම් නිශ්චල දේපළක් බලශක්ති උත්පාදන ව්‍යාපෘතියක් සඳහා හෝ සම්ප්‍රේෂණ ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය බව සහ ඒ ව්‍යාපෘතිය මහජනතාවගේ පොදු සුභ සාධනය සහ ප්‍රතිලාභය පිණිස වන බව අමාත්‍යවරයා විසින් කරනු ලබන නිර්දේශයක් මත අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, ඒ නිශ්චල දේපළ ඒ කාර්යය සඳහා අවශ්‍ය බවට සහ ඒ අනුව එම නිශ්චල දේපළ, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ තත් කාර්ය සඳහා අත්පත් කරගෙන එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිත තැනැත්තාට හෝ තැනැත්තන්ට පවරා දෙන ලෙසට, ගැසට් පත්‍රයේ පළ කරන ආඥාවක් මගින් ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ 3 සිට 8 දක්වා වූ වගන්තිවල (ඒ වගන්ති දෙක ද ඇතුළුව) විධිවිධාන, (1) වන උපවගන්තිය යටතේ දේපළ අත්පත් කර ගැනීමකට සහ ඒ හා සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් නිශ්චල දේපළක් අත්පත් කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදල්, ඒ දේපළ පවරා දෙනු ලබන්නේ යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ද ඒ තැනැත්තා හෝ තැනැත්තන් විසින් ගෙවිය යුතු ය.

රීති.

**53**. (1) මේ පනත යටතේ සෑදීමට නියම කර ඇති හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින් සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක බලාත්මක විය යුතු ය.

නියෝග.

**54**. (1) කොමිෂන් සභාවේ නිර්දේශය මත නියෝග සෑදිය යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ බලය දී ඇති හෝ අවශ්‍ය විය හැකි සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක හෝ බලාත්මක විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් දින තිහක් තුළ එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

දුෂ්කරතා ඉවත් කිරීම.

**55**. (1) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද රීති, නියෝග හෝ නියම ක්‍රියාත්මක කිරීමේ දී කිසියම් දුෂ්කරතාවක් පැන නැගුනහොත් අමාත්‍යවරයා විසින් මේ පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් නීතියකට අනනුකූල නොවන්නා වූ ද ඒ දුෂ්කරතාව ඉවත් කිරීම පිණිස අවශ්‍ය වන්නේ යයි හෝ අනුචිත යයි ඔහුට හෝ ඇයට පෙනී යන්නා වූ ද විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් සාදනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම එය සෑදීමෙන් පසු ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු ය.

නියෝග සෑදිය හැක්කේ කවර කාර්ය සඳහා ද යන වග.

**56**. (1) (අ) බලපත්‍රලාභීන් අතරෙහි උචිත විදුලිබල වෙළෙඳාම් වැඩපිළිවෙලට අවසර දීම සහ සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා ;

(ආ) විදුලි බලය සැපයුම, විධිමත් සහ කාර්යක්ෂම බව සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා ;

(ඇ) විදුලි බලය උත්පාදනයෙන්, සම්ප්‍රේෂණයෙන්, බෙදා හැරීමෙන්, සැපයීමෙන් හෝ භාවිතයෙන් නැතහොත් යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් භාවිත කිරීමෙන් පැන නගින අනතුරුවලින් මහජනයා ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා ; සහ

(ඈ) (ඇ) ඡේදයේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, ඒ ඡේදයේ සඳහන් ක්‍රියාකාරකම් කිසිවකින් පැන නගින්නා වූ පුද්ගල හානිය පිළිබඳ හෝ දේපළ අලාභහානිය පිළිබඳ අවදානම හෝ භාවිතය සම්බන්ධයෙන් මැදිහත් වීම තුරන් කිරීම හෝ අඩු කිරීමේ කාර්යය සඳහා,

නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, පහත සඳහන් කාරණා සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය—

(අ) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ක්‍රමයක මාර්ගයෙන් හැර විදුලි බලය සැපයීම, සම්ප්‍රේෂණය කිරීම හෝ බෙදා හැරීම තහනම් කිරීම ;

(ආ) නියෝගවල නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අවස්ථාවල දී විදුලි බලය සැපයීමේ, සම්ප්‍රේෂණය කිරීමේ හෝ බෙදා හැරීමේ දී වන හදිසි අනතුරු සහ ඇණහිටීම් පිළිබඳව කොමිෂන් සභාව වෙත දැන්වීම අවශ්‍ය යයි නියම කරමින් විධිවිධාන සෑදීම ;

(ඇ) බලපත්‍රයක් මගින් බලය දෙන ලද හෝ බලපත්‍රයක් ලබා ගැනීම පිණිස වූ නියමයෙන් නිදහස් කරනු ලැබූ තැනැත්තන් විසින් විදුලිය සැපයීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම පිණිස,

සිතියම්, පිඹුරු සහ බණ්ඩ තබා ගැනීම උදෙසා සහ පරීක්ෂා කිරීම හෝ පිටපත් කිරීම සඳහා ඒවා ඉදිරිපත් කිරීම උදෙසා විධිවිධාන සැදීම ;

(ඇ) විදුලි බලය සැපයීම පිණිස බලපත්‍රයක් මගින් බලය දී ඇති තැනැත්තන්, ඇතැම් අවස්ථාවල දී විදුලි බලය සැපයීමට ඇති යම් බන්ධනය වීමකින් මුදවාලීම සඳහා විධිවිධාන සැදීම ;

(ඉ) (i) යම් නියෝගයක් කඩ කිරීම වැළැක්වීමේ කාර්යය සඳහා ද ;

(ii) පුද්ගල හානි හෝ දේපළවලට අලාභහානි සිදු වීමේ අවදානම නැතහොත් විදුලි බලය භාවිතය සමග මැදිහත් වීම තුරන් කිරීමේ හෝ අඩු කිරීමේ කාර්යය සඳහා ද,

පාරිභෝගිකයකුගේ පාලනය යටතේ පවත්නා යම් විදුලි මාර්ගයකට හෝ විදුලි පිරියතකට හෝ යම් විදුලි උපකරණයකට අදාළව ගත යුතු ක්‍රියා මාර්ගය නිශ්චිතව සඳහන් කරමින් කොමිෂන් සභාව විසින් දෙනු ලබන දැනුම් දීම අනුව කටයුතු කිරීමට නියම කරමින් විධිවිධාන සැදීම ;

(ඊ) යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් නිශ්චිත ප්‍රමිති හෝ නියමයන් අනුව ක්‍රියා කළ විටක නියෝගයක යම් විශේෂිත නියම අනුව ක්‍රියා කර ඇති ලෙස සලකනු ලැබීම සඳහා විධිවිධාන සැලැස්වීම ; සහ

(උ) නියෝග මගින් හෝ ඒ යටතේ නිශ්චය කරනු ලබන කාලසීමාව සඳහා නියෝගවල යම් නියම කිරීමකින් නිදහස් කිරීම් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම,

කරනු ලැබිය හැකි ය.

## VIII වන පරිච්ඡේදය

### සාමාන්‍ය

නියම කරන ලද උපමානවලට අනුකූලව අමාත්‍යවරයා ක්‍රියා කළ යුතු බව.

**57**. අමාත්‍යවරයා විසින්, මේ පනතේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 22 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 38 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියමිත පරිදි සිය එකඟතාවය ලබා දීමේ දී, ඒ එක් එක් කාර්යය සඳහා, නියම කරනු ලැබිය යුතු උපමානවලට අනුව ක්‍රියා කළ යුතු ය.

ලේඛනය.

**58**. (1) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ ආකෘතියකින් කොමිෂන් සභාව විසින් කොමිෂන් සභා කාර්යාලයෙහි ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

(2) ඒ ලේඛන —

(අ) මේ පනත යටතේ ප්‍රදානය කරන ලද සෑම බලපත්‍රයකට ම සහ නිදහස් කිරීමකට ම අදාළ තොරතුරු ;

(ආ) එවැනි යම් බලපත්‍රයක කොන්දේසිවල විකරණවලට හෝ එවැනි යම් බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට අදාළ විස්තර ;

(ඇ) සෑම නියමයක්, විධානයක් හෝ නිශ්චිතයක් ද ඇතුළුව කොමිෂන් සභාවේ සෑම තීරණයක් ම ;

(ඈ) 34 වන වගන්තිය යටතේ කරන ලද සෑම බලාත්මක කිරීමේ නියෝගයක් ම ;

(ඉ) කොමිෂන් සභාවේ මුද්‍රාව තැබීමට යෙදුනු වෙනත් යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අදාළ විස්තර,

ඇතුළත් කිරීමට සැලැස්විය යුතු ය.

(3) නියෝගය මගින් නියම කරනු ලැබිය හැකි වේලාවක් තුළ දී, සහ ගාස්තු ගෙවීමට යටත්ව ලේඛනයේ අන්තර්ගතයන් මහජනයා විසින් පරීක්ෂා කරවා බැලීම සඳහා ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

වාර වාර්තා සහ තොරතුරු.

**59**. (1) කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ තම කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීම සඳහා ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත දී, දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති සියලු වාරවාර්තා සහ තොරතුරු කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු වෙත සපයන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් මගින් කිසියම් වාරවාර්තා හෝ තොරතුරු සපයන ලෙස නියම කරනු ලැබූ සෑම තැනැත්තකු ම විසින් යම් නීතියක විධිවිධාන මගින් ඒ වාරවාර්තා හෝ තොරතුරු සැපයීම ඔහුට හෝ ඇයට තහනම් කරනු ලැබ ඇති අවස්ථාවක හැර, දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය තුළ දී දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම ඒ සෑම තැනැත්තකුගේ ම කාර්යය විය යුත්තේ ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන සෑම තැනැත්තෙක්ම, වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට සහ එසේ වරදකරු කරනු ලැබීමෙන් පසුව ද වරද කරගෙන යන එක් එක් දවස සඳහා රුපියල් පණස් දහස බැගින් වූ වැඩිපුර දඩයකට ද යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදන ලද දැන්වීමක නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමේ දී සපයන ලද කිසිදු තොරතුරක්, ඒ තොරතුර සපයන තැනැත්තාගේ එකඟත්වය ඇතිව මිස කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කිරීම හෝ හෙළිදරව් කිරීම නොකළ යුතු ය.

(5) (4) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් තොරතුරක්, ඒ තොරතුරු සැපයූ තැනැත්තාගේ එකඟත්වය නොමැතිව—

(අ) අධිකරණයක් විසින් නියම කරනු ලැබූ විට ඒ අධිකරණය වෙත ;

(ආ) මේ පනතින් ඊට පැවරී ඇති යම් කර්තව්‍යයක් ඉටු කිරීමේ කාර්යය සඳහා ;

(ඇ) මේ පනත යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක කොන්දේසියකට අනුකූලව ක්‍රියා කිරීමට හැකිකරවීමේ කාර්යය සඳහා,

කොමිෂන් සභාව විසින් හෙළිදරව් කිරීම, (3) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත අදාළ නොවන බව.

**60.** (1) 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මගින් පිහිටුවන ලද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ඒ පනත මගින් පැවරී ඇති බලතල, ක්‍රියා කිරීම හෝ කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ඒ අධිකාරිය විසින්, මේ පනතින් හෝ 2002 අංක 35 දරන

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතින් හෝ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල හා කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට අදාළව ක්‍රියාත්මක නොකළ යුතු ය.

(2) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතින් විශේෂිත ආවරණයන් නොමැති වූ විටක එවැනි අවශ්‍යතා මතු වූයේ නම්, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මගින් පිහිටුවන ලද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ඒ පනත මගින් පැවරී ඇති බලතල, ක්‍රියා කිරීම හෝ කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මෙම කොමිෂන් සභාවලට බලය පැවරෙන්නේ ය.

## IX වන පරිච්ඡේදය

## අර්ථ නිරූපණය

61. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස, පනතේ— අර්ථ නිරූපණය.

"බලය දෙන ලද" යන්නෙන්, මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මගින් හෝ ප්‍රදානය කරන ලද නිදහස් කිරීමක් මගින් හෝ බලය දීමක් අදහස් වේ ;

"බල ප්‍රදේශය" යන්නෙන්, විදුලිබලය සම්ප්‍රේෂණය කිරීමට හෝ බෙදා හැරීමට සහ සැපයීමට නැතහොත් බෙදා හැරීමට හෝ සැපයීමට බලපත්‍රයක් මගින් බලය දුන් තැනැත්තකුට අදාළ වන විට, බලපත්‍රයේ නම් කර ඇති ප්‍රදේශය අදහස් වේ ;

"තොග විකුණුම්" යන්නෙන්, විදුලිබලය විකිණීමට අදාළ වීමේ දී, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියකු විසින් එහි සම්ප්‍රේෂණ පද්ධතිය හරහා—

(i) බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට ; සහ

(ii) සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ පද්ධතියට සම්බන්ධ කරන ලද්දා වූ ද, සම්ප්‍රේෂණ බලපත්‍රයෙහි හඳුනා ගෙන ඇත්තා වූ ද, පාරිභෝගිකයන්ට,

තොග වශයෙන් විදුලි බලය විකිණීම අදහස් වේ ;

"මධ්‍යම පාරිසරික අධිකාරිය" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත මගින් පිහිටුවන ලද මධ්‍යම පාරිසරික අධිකාරිය අදහස් වේ ;

"සම්බන්ධ" යන්නෙන්, යම් පරිශ්‍රයකට අදාළ වන විට බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ බෙදා හැරීමේ මාර්ගයකට සම්බන්ධ කිරීමක් අදහස් වන අතර, "සම්බන්ධ කිරීම" යන යෙදුම ඒ අනුව තේරුම් ගත යුතු ය;

"පාරිභෝගිකයා" යන්නෙන්, ශ්‍රී ලංකාවේ විදුලිබල පාරිභෝගිකයකු අදහස් වන අතර, විදුලි බලය අපේක්ෂිතව සිටින පාරිභෝගිකයකු ද ඊට ඇතුළත් වේ;

"කඩ කිරීම" යන්නට, යම් තීරණයකට, විධානයකට, නිශ්චය කිරීමකට, බලපත්‍රයක ඇති කොන්දේසියකට, නියම කිරීමකට, නියෝගයකට, රීතියකට හෝ නියමයකට අදාළ වන විට, එය අනුව ක්‍රියා කිරීමෙහි ලා යම් පැහැර හැරීමක් ඇතුළත් වේ ;

"වරප්‍රසාද නොලත් පාරිභෝගික කණ්ඩායම" යන්නෙන්, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි මුදලකට වඩා අඩු තනි ගෘහස්ථ ආදායමක් ඇති යම් පාරිභෝගිකයන් කණ්ඩායමකට අයත් වන්නා වූ පාරිභෝගිකයන් අදහස් වේ ;

"බෙදා හරිනවා" යන්න, විදුලිය සම්බන්ධයෙන් අදාළ වන විට, අඩු වෝල්ටේජ් ධාරිතාවයෙන් යුක් මාර්ග වලින් සහ විදුලි පිරියත වලින් සැදුණු සහ යම් පරිශ්‍රයකට හෝ වෙනත් යම් බෙදා හැරීමේ ක්‍රමයකට විදුලි බලය ගෙන යාම සඳහා භාවිත කරන පද්ධතියක් මාර්ගයෙන් විදුලිය බෙදා හැරීම අදහස් වන අතර, "බෙදා හැරීම" සහ "බෙදා හැරීමේ ක්‍රමය" යන්න, ඒ අනුව තේරුම් ගත යුතු ය ;

"බෙදා හැරීමේ බලපත්‍රලාභියා" යන්නෙන්, බෙදා හැරීමේ බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබ ඇති තැනැත්තකු අදහස් වේ ;

"බෙදා හැරීමේ මාර්ගය" යන්නෙන්, බෙදා හැරීමේ බලපත්‍රලාභියකු සම්බන්ධයෙන් වන විට, බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ බල ප්‍රදේශය ඇතුළත ඇත්තා වූ ද යම් පරිශ්‍රයකට විදුලි බලය සැපයීමේ කාර්යය සඳහා භාවිත කරන්නා වූ ද බෙදා හැරීමේ මාර්ගයක් අදහස් වේ ;

"වාසස්ථානය" යන්නෙන්, පුද්ගලික වාසස්ථානයක් ලෙස පදිංචි වී සිටින (පදිංචි වී නොමැති නම්) අවසාන කාලයෙහි පදිංචිව සිටි හෝ පදිංචිය පිණිස අදහස් කළ ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් අදහස් වේ ;

"විදුලි මාර්ගය" යන්නෙන්, පොළව යටින් වුව ද නැතහොත් පොළව උඩින් වුව ද යම් කාර්යයක් සඳහා විදුලි බලය ගෙන යාම සඳහා භාවිත කරන රැහැනක් අදහස් කරනු ලබන අතර, පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

(අ) ඒ රැහැන තිබෙන්නේ, ඊට ආධාරක වන්නේ, ගෙන යන්නේ හෝ දරා සිටින්නේ නැතහොත් තිබිය හැක්කේ, ආධාරක විය හැක්කේ, ගෙන යනු ලැබිය හැක්කේ හෝ දරා සිටිය හැක්කේ කවර ඉදි කිරීමක්, කණුවක්, වෙනත් දෙයක් ඇතුළත, මත, වෙතින් හෝ තුළින් ද ඒ ඉදි කිරීම, කණුව හෝ වෙනත් දෙය ඇතුළුව, එහෙත් ඒවාට පමණක් සීමා නොවී, එවැනි රැහැනක් සඳහා වන ආධාරකයක් ද ;

(ආ) විදුලි බලය ගෙන යාමේ කාර්යය සඳහා එවැනි යම් රැහැනකට සම්බන්ධ කර ඇති යම් උපකරණයක් ද ;

(ඇ) ඒ රැහැන වට කරන්නා වූ හෝ ඊට ආධාරක වන්නා වූ නැතහොත් ඒ රැහැන වට කිරීමට යෙදුනේ හෝ ආධාරක වූයේ නැතහොත් ඒ මාර්ගයට සමීප දුරකින් සවි කරන ලද්දේ නැතහොත් ඒ සමග ආශ්‍රිතව ආධාරක පිණිස සිටින්නේ, ගෙන යන්නේ හෝ දරා සිටින්නේ කවර කම්බියක්, කේබලයක්, නලයක්, පයිප්පයක් හෝ වෙනත් සමාන දෙයක් ද (එහි කොපුව, පරිවරණය හෝ වැස්ම ඇතුළුව) ඒ කම්බිය, කේබලය, නලය, පයිප්පය හෝ වෙනත් සමාන දෙය ද,

ඇතුළත් වේ ;

"විදුලි පිරියත" යන්නෙන්—

(අ) විදුලි රැහැනක් ;

(ආ) යම් පරිශ්‍රයකට සපයන ලද විදුලිබල ප්‍රමාණය සහතික ලෙස දැනගැනීම සඳහා භාවිත කෙරෙන මීටරයක් ; හෝ

(ඇ) පාරිභෝගිකයකුගේ පාලනය යටතේ ඇති යම් විදුලි උපකරණයක්,

නොවන, විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම හෝ සැපයීම සඳහා භාවිත කරන හෝ ඒ හා සම්බන්ධිත කාර්ය සඳහා වූ යම් පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උවරණයක් අදහස් වේ ;

"විදුලිබල සැපයුම් සංග්‍රහය" යන්නෙන්, මේ පනතේ 2 වන උපලේඛනයේ විධිවිධාන අදහස් වේ ;

"විදුලිබල ව්‍යාපාරය" යන්නෙන්, මේ පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමෙන් නිදහස් කරන ලද යම් තැනැත්තකු ද ඇතුළත්ව, විදුලි බලය උත්පාදනයෙහි, සම්ප්‍රේෂණයෙහි, බෙදා හැරීමෙහි හෝ සැපයීමෙහි නිරතව සිටින යම් තැනැත්තකු අදහස් වේ ;

"බලාත්මක කිරීමේ නියමය" යන්නෙන්, කොමිෂන් සභාව විසින් 34 වන වගන්තිය යටතේ කරන ලද බලාත්මක කිරීමේ නියමයක් අදහස් වේ ;

"නිදහස් කිරීම" යන්නෙන්, 10 වන වගන්තිය යටතේ දෙන ලද නිදහස් කිරීමක් අදහස් වේ ;

"මුදල් වර්ෂය" යන්නෙන්, ලිත් වර්ෂය අදහස් වේ ;

"අරමුදල " යන්නෙන්, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව පනතේ 31 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති කොමිෂන් සභාවේ අරමුදල අදහස් වේ ;

"උත්පාදන බලපත්‍රලාභියා" යන්නෙන්, උත්පාදන බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබූ තැනැත්තකු අදහස් වේ ;

"උත්පාදකය" යන්නෙන්, උත්පාදන බලපත්‍රලාභියකු හෝ උත්පාදන බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ තැනැත්තකු අදහස් වේ ;

"අධිවෝල්ටීයතා මාර්ගය" යන්නෙන්, කිලෝවෝල්ට් 33 ට නොඅඩු සාමාන්‍ය වෝල්ටේජ් ධාරිතාවක හෝ 45 වන වගන්තියට අනුකූලව කොමිෂන් සභාව විසින් විධාන කරනු ලැබිය හැකි වෙනත් වෝල්ටේජ් ධාරිතාවක විදුලි මාර්ගයක් අදහස් කෙරෙන අතර ඒ අනුව "අඩු වෝල්ටීයතා මාර්ගය" යන්න තේරුම් ගත යුතු ය ;

"බලපත්‍රය" යන්නෙන්, 11 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අදහස් වන අතර "බලපත්‍රලාභියා" හෝ "බලපත්‍රලාභීන්" යන්න ඒ අනුව තේරුම් ගත යුතු ය ;

"ජීව සහනදායී අයකිරීම්" යන්නෙන්, සැපයුමේ සැබෑ වියදම නිරූපණය කරන අනුපාතයකට මූලික විදුලිබල අවශ්‍යතා සඳහා මුදල් ගෙවීමට මූල්‍යමය වශයෙන් හැකියාවක් නොමැති ජනගහනයෙන් කොටසකට ලබා දෙන අනුග්‍රාහක විදුලි බද්දක් අදහස් වේ ;

"රැහැන" යන්නෙන්, විදුලි බලය ප්‍රවාහනයේ දී භාවිත කිරීම සඳහා සැලසුම් කරන ලද හෝ යොදා ගනු ලැබූ (එහි කොපුව හෝ වැස්ම ඇතුළුව) යම් කේබලයක්, පයිප්පයක්, සන්නායකයක් හෝ වෙනත් සමාන දෙයක් අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් හෝ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

"විකරණය" යන්නෙන්, එකතු කිරීම්, වෙනස් කිරීම් සහ අත්හැර දැමීම් ඇතුළත් වේ ;

"අවශ්‍ය මාර්ග අවසරය" යන්නෙන්, ඉඩම මත, යට හෝ උඩින් විදුලි රැහැන් සවි කිරීම පිණිස සහ සවි කොට තැබීම පිණිස බලපත්‍රලාභියාට දෙනු ලබන කැමැත්ත සහ විදුලි රැහැන පරීක්ෂා කිරීමේ, නඩත්තු කිරීමේ, ගැලපීමේ, අලුත්වැඩියා කිරීමේ, වෙනස් කිරීමේ, ප්‍රතියෝජනය කිරීමේ හෝ ඉවත් කිරීමේ කාර්යය සඳහා ඉඩමට ප්‍රවේශය පිණිස ඉඩ දීම අදහස් වේ ;

"දැන්වීම" යන්නෙන්, ලිඛිත දැන්වීමක් අදහස් වේ ;

"පරිශ්‍රය" යන්නට, යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක් ඇතුළත් වේ ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද රීති හෝ නියෝග මගින් නියමිත බව අදහස් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, 58 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටු වන ලද පළාත් සභාවක් අදහස් වේ ;

"ලේඛනය" යන්නෙන්, 58 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන ලේඛනයක් අදහස් වේ ;

"නියෝග" යන්නෙන්, මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග අදහස් වේ ;

"අදාළ තත්ත්වය" යන්නෙන්, බලපත්‍රලාභියකු සම්බන්ධයෙන් වන විට, එකී බලපත්‍රයේ කොන්දේසියක් හෝ මේ පනතින් හෝ ඒ යටතේ ඒ මත පනවන ලද යම් බද්දක් අදහස් වේ ;

"අදාළ බලපත්‍රලාභියා" යන්නට, මේ පනතේ 30 වන වගන්තියේ (5) වන උපවගන්තියේ දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"අදාළ ක්‍රියාකාරිකයා" යන්නට, මේ පනතේ I වන උපලේඛනයේ 2 වන ඡේදයේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"රීති" යන්නෙන්, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද රීති අදහස් වේ ;

"විදුලි බලය තොග වශයෙන් විකිණීම" යන්නට, "තොග විකුණුම්" යන්නට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"සැපයුම" යන්නෙන්, විදුලි බලය සම්බන්ධයෙන් අදාළ වන විට, (බලපත්‍රලාභියකුගේ බලපත්‍රය මගින් කරගෙන යාමට බලය දී ඇති ක්‍රියාකාරකම් කරගෙන යාමේ කාර්යය සඳහා බලපත්‍රලාභියා විසින් පදිංචියට ගෙන ඇති පරිශ්‍රයක් හැර) යම් පරිශ්‍රයකට විදුලි බලය සැපයීම අදහස් වන නමුත් විදුලිබල තොග විකිණීම ඉන් බැහැර විය යුතු ය ;

"අයක්‍රම පාරිභෝගිකයා" යන්නෙන්, 25 වන වගන්තිය ප්‍රකාර බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගෙන් විදුලි බලය සැපයුමක් අවශ්‍ය කරන සහ ඒ බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් සැපයුම දෙන ලද තැනැත්තකු අදහස් වේ ;

"සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා" යන්නෙන්, මේ පනත යටතේ සම්ප්‍රේෂණ බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබූ තැනැත්තකු අදහස් වේ ; සහ

"සම්ප්‍රේෂණය" යන්නෙන්, විදුලි බලය සම්බන්ධයෙන් අදාළ වන විට, (සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන්) අධිවෝල්ටේජ් ධාරිතා මාර්ගයකින් සහ පිරියතකින් සැදුනා වූ ද, උත්පාදන මධ්‍යස්ථානයක සිට උප මධ්‍යස්ථානයකට, එක් උත්පාදන මධ්‍යස්ථානයක සිට තවත් එවැනි උප මධ්‍යස්ථානයකට ගෙන යාම සඳහා යොදා ගන්නා වූ ද, පද්ධතියක මාර්ගයෙන් විදුලි බලය ප්‍රවාහනය කිරීම අදහස් වේ. තව ද, "සම්ප්‍රේෂණය කිරීම" හා "සම්ප්‍රේෂණ පද්ධතිය" යන යෙදුම් ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**62**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවූවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## X වන පරිච්ඡේදය

## ඉවත් කිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන

ඉවත් කිරීම සහ අන්තර්කාලීන විධිවිධාන.

**63**. (1) 2002 අංක 28 දරන විදුලිබල ප්‍රතිසංස්කරණ පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) (205 වන අධිකාරය වූ) විදුලිබල පනත මෙයින් ඉවත් කරනු ලබන්නේ ය.

(3) විදුලිබල පනත ඉවත් කරනු ලැබුව ද ඒ ගැන නොතකා—

(අ) ඒ පනත යටතේ නිකුත් කරනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවති සියලු බලපත්‍ර, ඒ බලපත්‍ර මගින් පහත දැක්වෙන ක්‍රියාකාරකම්වලින් යම් කිසිවක්, එනම් විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම හෝ සැපයීම සඳහා බලය දී ඇතිනාක්

දුරට, වලංගුව පැවතිය යුතු අතර, මේ පනත බලාත්මක වන දින සිට මාස හයක කාලසීමාවක් සඳහා මේ පනතේ විධිවිධානවලට යටත්ව, අඛණ්ඩව බලාත්මකව තිබිය යුතු ය ; සහ

(ආ) ඒ පනතේ 60 වන වගන්තිය යටතේ සාදනු ලැබ, අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවති සියලු නියෝග, ඒ නියෝග මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට ඒ දිනයට පසුව ද අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු ය.

මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදනු ලබන නියෝග, ලංකා විදුලිබල මණ්ඩල පනතේ 56 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග අභිබවා බලපැවැත්විය යුතු බව.

**64**. 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනතේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුන ද, ඒ පනතේ 56 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝග සහ මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝග අතර යම් ගැටීමක් ඇති වන අවස්ථාවක, මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදනු ලබන නියෝග බලපැවැත්විය යුතු ය.

ලංකා විදුලිබල මණ්ඩලයට තාවකාලික බලපත්‍ර සහ බලපත්‍ර නිකුත් කළ යුතු බව.

**65**. (1) මේ පනතේ විධිවිධානවල හෝ 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ යම් විධිවිධානයක කුමක් සඳහන් වුව ද, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට බලපවත්වන පරිදි, විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය සහ විදුලි බලය බෙදා හැරීම සහ සැපයුම සඳහා අදාළ ක්‍රියාකාරකම් ඉටු කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකි වන පරිදි, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත සුදුසු තාවකාලික බලපත්‍ර නිකුත් කළ යුතු ය. මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සියලු තාවකාලික බලපත්‍ර මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු විය යුතු අතර, එම බලපත්‍ර කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට ද යටත්විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් මාස හයක කාලසීමාව අවසන් වීමට මාස තුනකට අඩු නොවන කාලයකට පෙරාතුව, විදුලි බලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම සහ විදුලි බලය බෙදා හැරීම සහ සැපයුම සඳහා පනතේ 7 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා මේ පනත යටතේ කොමිෂන් සභාවට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයට නියම කරනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් ඉල්ලීම කරනු ලබන දිනයේ දී තම මෙහෙයුම් කටයුතු සිදු කරමින් සිටින භූගෝලීය ප්‍රදේශ නිශ්චිතව දක්වනු ලබන සැලැස්මක් සහ මේ පනතේ 5 වන වගන්තිය යටතේ කැබිනට් අමාත්‍ය මණ්ඩලය

විසින් අනුමත කරන ලද මාර්ගෝපදේශවලට අනුව සකස් කරන ලද විදුලිබලය උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ සහ විදුලිබලය තොග සම්පාදනය කිරීම සහ බෙදා දීම මෙන්ම සැපයීම සම්බන්ධයෙන් වූ කටයුතු පුළුල් කිරීම සඳහා, එකී දින සිට ඉදිරි වසර පහළොවක කාලයක් තුළ මණ්ඩලය විසින් යෝජනා කරනු ලබන භූගෝලීය ප්‍රදේශ පෙන්නුම් කරන්නා වූ ව්‍යාප්ත කිරීමේ සැලැස්මක් නිශ්චිතව දක්වමින් තම ඉල්ලීම සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් සහ අවශ්‍ය සැලැස්මක් ලැබීමෙන් පසු, කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තියේ සඳහන් මාස හයක කාල සීමාව අවසන්වීමට පෙර සහ මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, වසර පහළොවක කාලයක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත අවශ්‍ය බලපත්‍ර නිකුත් කරනු ලැබිය යුතු ය. එසේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම එම බලපත්‍රයට අනුයුක්ත නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු අතර, නිකුත් කරන ලද බලපත්‍රයේ වලංගු කාලසීමාව අවසන්වීමට පෙරාතුව, 5 වන වගන්තිය යටතේ කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුව සකස් කරන ලද නියමිත සැලසුම් සමග, තත්කාර්ය සඳහා වූ ඉල්ලීමක් මත, එවැනි බලපත්‍රයක් කලින් කල, තවදුරටත් වූ අවුරුදු පහළොවක කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය යුතු ය.

66. (1) (මේ වගන්තියෙහි "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 32 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතට කරනු ලබන සංශෝධන.

(අ) එම පනතේ 11 වන වගන්තියේ—

(i) එම වගන්තියේ, (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් උචිත බලපත්‍රයකට අනුකූලව කාර්යක්ෂම, සම්බන්ධීකරණය වූ සහ ලාභදායී විදුලි සැපයුම් ක්‍රමයක් සකස් කොට පවත්වාගෙන යාම මණ්ඩලයේ කාර්යයක් වන්නේ ය.";

(ii) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2අ) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එහි නිශ්චිතව සඳහන් කාර්ය ඉටු කිරීමේ දී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් මණ්ඩලය වෙත නිකුත් කරන ලද බලපත්‍රයක ඇති යම් කොන්දේසියක් උල්ලංඝනය වන පරිදි මණ්ඩලය ක්‍රියා නොකළ යුතු ය.";

(ආ) එම පනතේ 12 වන වගන්තිය—

(i) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(ii) එම වගන්තියේ නැවත අංක යෙදූ (1) වන උපවගන්තියේ "මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ හැකි ය." යන වචන වෙනුවට" (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ හැකි ය.", යන වචන ආදේශ කිරීමෙන් ;

(iii) එම වගන්තියේ නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් මණ්ඩලය වෙත නිකුත් කරන ලද යම් උචිත බලපත්‍රයක ඇති නියම සහ කොන්දේසිවලට අනුකූලව, (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඌ), (ඕ) සහ (ග) යන ඡේදවල සඳහන් බලතල, මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.:"

(ඇ) එම පනතේ 14, 15 සහ 16 වන වගන්ති ඉවත් කිරීමෙන් ;

(ඇ) එම පනතේ II වන කොටස සහ V වන කොටස ඉවත් කිරීමෙන් ;

(ඉ) එම පනතේ 66 වන වගන්තියේ :—

(1) "පළාත් පාලන සේවය" යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"බලපත්‍රය" යන්නෙන්, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වේ ;"; සහ

(2) "රජයේ නිලධරයා" යන යෙදුමෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව" යන්නෙන්, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව අදහස් වේ.".

(2) පනතේ V වන කොටස ඉවත් කිරීම නොතකා, ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිබල ශක්තිය සැපයීම සඳහා එම පනතේ 52 වන වගන්තිය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් නියම කරනු ලැබූ අයකිරීම් සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයේ දී බලාත්මකව පවතින සියලු අයකිරීම්, යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ වෙනස් කරන තෙක් හෝ ප්‍රතියෝජනය කරන තෙක්, නොකඩවාම බලාත්මකව පැවතිය යුතු ය.

I වන උපලේඛනය

## බලපත්‍රලාභීන්ගේ වෙනත් බලතල

(31 වන වගන්තිය)

1. (1) මේ ඡේදයේ පහත දැක්වෙන විධිවිධානවලට යටත්ව, බලපත්‍රලාභියකුගේ බලපත්‍රය මගින් කරගෙන යාමට ඊට බලය දී ඇති ක්‍රියාකාරකම් කරගෙන යාම හා සම්බන්ධිත යම් කාර්යයක් සඳහා බලපත්‍රලාභියකු විසින්, ස්වකීය බලප්‍රදේශය ඇතුළත පහත දැක්වෙන කවර හෝ කර්මාන්තයක්, එනම් :

(අ) යම් වීථියක් යටින්, උඩින්, තුලින්, මත, දිගේ හෝ හරහා—

(i) යම් විදුලිබල මාර්ගයක් හෝ විදුලි පිරියතක් සහ ;

(ii) එවැනි යම් මාර්ගයක් හෝ පිරියතක් ගෙවැද්දීම හෝ ආවරණය කිරීම සඳහා යම් ඉදි කිරීමක්,

ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අතර වරින් වර, ඒ කිසියම් පිරියත හෝ මාර්ගය පරීක්ෂා කිරීම, නඩත්තු කිරීම, ගැලපීම, අලුත්වැඩියා කිරීම, වෙනස් කිරීම, ප්‍රතියෝජනය කිරීම හෝ ඉවත් කිරීම කරනු ලැබිය හැකි ය ; සහ

(ආ) (අ) අනුඡේදයේ සඳහන් කරන ලද පහත දැක්වෙන කාර්ය ඇතුළු යම් කර්මාන්තයක කාර්යය සඳහා අවශ්‍ය වන හෝ ආනුෂංගික වන යම් කර්මාන්තයක්—

(i) යම් වීථියක් හෝ යම් වීථියක් ඇතුළත හෝ ඒ යට තිබෙන යම් කසළ කාණු, කාණු හෝ උමං විවෘත කිරීම හෝ කඩා දැමීම ;

(ii) යම් වීථියක් යටින් උමං හෑරීම හෝ සිදුරු හෑරීම ; සහ

(iii) යම් වීථියක් තුළ හෝ යට ඇති සියලු පස් සහ ද්‍රව්‍ය ඉවත් කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම.

එහෙත් මේ අනුඡේදයේ ඇතුළත් කිසිවකින්, මහජන භාවිතය සඳහා වෙන් කරනු ලැබ නැති යම් ගොඩනැගිල්ලක් හෝ යම් ඉඩමක් තුළට හරහා හෝ එල්ලේ යම් විදුලි මාර්ගයක් ඇදීමට හෝ විදුලි පිරියතක් තැන්පත් කිරීමට බලපත්‍රලාභියකුට බලය නොපැවරෙන්නේය.

(2) කිසියම් විදුලි මාර්ගයක් හෝ පිරියතක් ගෙවැද්දීම සඳහා වීථියක් මත හෝ උඩින් කිසියම් ඉදි කිරීමක් තැනීම පිණිස (1) වන ඡේදය යටතේ බලපත්‍රලාභියකුට පැවරී ඇති බලය පළාත් පාලන ආයතනයේ හෝ වෙනත් අදාළ අධිකාරයක එකඟතාවය ඇතිව පමණක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) යම් විදුලි මාර්ගයක හෝ විදුලි පිරියතක වරදකින් පැන නගින හදිසි අවස්ථාවක දී හැර, පළාත් පාලන අධිකාරියක හෝ වෙනත් අදාළ අධිකාරයක, අධිකාරය තුළට නොවැටෙන වීථියක, (1) වන ඡේදයෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව හැර විවෘත කිරීම හෝ කැඩීම නොකළ යුතු ය.

(4) (7) වන ඡේදයේ කුමක් සඳහන් වුව ද, බලපත්‍රලාභියා විසින් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, තාවකාලික වූ ද නියමිත ප්‍රමිතිවලට අනුකූල නොවන්නා වූ ද විදුලි මාර්ග ඉදි කරනු ලැබිය හැකි ය.

(5) අත්‍යාකාරයෙන් එකඟත්වය අවශ්‍ය කරන්නේ කවර තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා වෙත ඉල්ලීම පිළිබඳ දැන්වීම බලපත්‍රලාභියා විසින් භාර දී ඇත්තේ නම් මිස, (3) වන ඡේදය යටතේ කම එකඟත්වය සඳහා වූ ඉල්ලීමක් කොමිෂන් සභාව විසින් සලකා නොබැලිය යුත්තේ ය.

(6) (1) වන ඡේදයෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී බලපත්‍රලාභියා විසින් හැකි තරම් දුරට අවම ප්‍රමාණයේ හානියක් කළ යුතු අතර, එම බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා සිදුවන යම් හානියක් සඳහා වන්දි ගෙවීම කළ යුතු ය.

(7) බලපත්‍රලාභියකු විසින් යම් වීථියක් යටින්, උඩින්, තුළ, මත, දිගේ හෝ හරහා සවි කරන හෝ සවි කර තබා ඇති කිසිවක් මහජනයාට අනතුරුදායක ප්‍රභවයක් නොවන බවට සහතික කිරීමට හැකි ආකාරයෙන් (1) වන ඡේදය මගින් පැවරී ඇති බලතල බලපත්‍රලාභියකු විසින් ක්‍රියාත්මක කළ යුතු අතර, බලපත්‍රලාභියා විසින් —

(අ) කඩන ලද හෝ විවෘත කරන ලද කොටස වටා වැට බැඳ ආරක්ෂා කිරීම පිණිස වහාම කටයුතු සැලැස්විය යුතු ය;

(ආ) ඒ කොටස කඩා දමා හෝ විවෘත කර තබන කාලය තුළ දී, ඒ කොටසට එරෙහිව හෝ ඒ අසල එතනින් යන එන්නන්ට අනතුරු හැඟවීම පිණිස ප්‍රමාණවත් ආලෝක සංඥාවක් හිරු බැසීමේ සිට හිරු උදාව තෙක් සවි කොට පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය; තව ද

(ඇ) හැකි සාධාරණ ඉක්මණින් බිම පුරවා යථා තත්ත්වයට පත් කළ යුතු අතර කඩා දමන ලද හෝ විවෘත කරන ලද බිම හෝ පදික වේදිකාව හෝ කසළ කාණුව, කාණුව හෝ උමග නිසි පරිදි සකස් කළ යුතු අතර, එය මාස තුනක කාලයක් නිසි අලුත්වැඩියා තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර යම්කිසි කිඳා බැසීමක් ඇතිවූයේ නම්, ඒ කිඳා බැසීම පවත්නා කාලය තුළ දී මාස හයක් නොඉක්මවන තවදුරටත් වූ යම් කාලයක් නිසි අලුත්වැඩියා තත්ත්වයෙන් පවත්වා ගෙන යා යුතු ය.

(8) (7) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින බලපත්‍රලාභියකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසක් නොඉක්මවන්නා වූ දඩයකට යටත් විය යුතු ය.

2. (1) 1 වන අයිතමයෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී කරනු ලබන කර්මාන්ත නිසා පහත දැක්වෙන යම් කිසිවක තාවකාලික හෝ ස්ථිර වෙනසක් කිරීමට සිදු වුව ද බලපත්‍රලාභියා විසින් ඒ කර්මාන්ත කර ගෙන යනු ලැබිය හැකි ය :—

(අ) වෙනත් බලපත්‍රලාභියකුගේ පාලනය යටතේ පවතින යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක්;

(ආ) ගෑස් ක්‍රියාකාරිකයකුගේ පාලනය යටතේ පවතින ගෑස් ප්‍රවාහනය සඳහා භාවිත කරන යම් පයිප්පයක් ද ඇතුළුව, (එය ඇත්තේ වීථියක් තුළ හෝ

නොවුව ද) ජල ක්‍රියාකාරිකයකුගේ, සහල නාලිකා ක්‍රියාකාරිකයකුගේ හෝ ව්‍යවස්ථාපිත බලතල ක්‍රියාත්මක කරමින් ජලය සපයන තැනැත්තකුගේ පාලනය යටතේ වූ යම් පයිප්පයක් ;

(ඇ) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ බලපත්‍රලත් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරන විදුලි සංදේශ පද්ධතියක කාර්යය සඳහා භාවිත කරනු ලබන කිසියම් විදුලි සංදේශ උපකරණයක ;

(ඈ) දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් මෙහෙයවනු ලබන විදුලි පණිවිඩ යැවීමේ පද්ධතියක කාර්යය සඳහා භාවිත කරනු ලබන කිසියම් විදුලි සංදේශ උපකරණයක් ;

(ඉ) 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත අදාළ වන කේබල් රූපවාහිනී පද්ධතියක කාර්ය සඳහා භාවිත කරනු ලබන කිසියම් විදුලි සංදේශ උපකරණයක්,

(2) (1) (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඉ) අනුඡේදවල සඳහන් කරන ලද එවැනි යම් වෙනස් කිරීමක් සිදු වන හෝ සිදු විය හැකි කර්මාන්ත 1 වන අයිතමයෙන් පවරන ලද බලය ක්‍රියාත්මක කිරීමේ දී බලපත්‍රලාභියකු විසින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන අවස්ථාවක, මේ ඡේදයේ අනුප්‍රාප්තික විධිවිධාන අදාළ විය යුතු අතර ඒ විධිවිධානවල "ක්‍රියාකාරිකයා" යන සඳහන් කිරීමක්, (1) (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඉ) අනුඡේදවල සඳහන් කර ඇති "ක්‍රියාකාරිකයකු" සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් ලෙස සැලකිය යුතු ය.

(3) යම් විදුලි මාර්ගයක හෝ විදුලි පිරියත සම්බන්ධයෙන් වෙනස් කිරීම් කරන ලෙස එවැනි කර්මාන්ත (1) (අ) අනුඡේදය තුළට අඩංගු වුව ද ඒ බව නොසලකා මහජනයාගෙන් අයකු විසින් අදාළ බලපත්‍රලාභියකුගෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(4) (5) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව බලපත්‍රලාභියකු විසින්, කර්මාන්තය ආරම්භ කිරීමට පෙරාතුව එක් මසකට නොඅඩු, බලපත්‍රලාභියා විසින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනු ලබන කර්මාන්තවල ස්වභාවය, සිදු වන හෝ සිදු වීමට ඉඩ ඇති වෙනස් වීම සහ කර්මාන්තය ආරම්භ කිරීමට යෙදෙන වේලාව සහ ස්ථානය නිශ්චිතව සඳහන් කෙරෙන දැන්වීමක් අදාළ ක්‍රියාකාරිකයා වෙත දිය යුතු ය.

(5) කර්මාන්තය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමෙන් පසු ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් අදාල ක්‍රියාකාරිකයාට බලපත්‍රලාභියා විසින් දැනුම් දීම කෙරෙන්නා වූ යම් හදිසි කර්මාන්ත සම්බන්ධයෙන් (4) වන ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(6) (4) වන ඡේදය යටතේ බලපත්‍රලාභියා විසින් අදාළ ක්‍රියාකාරිකයාට දැන්වීම දී ඇති අවස්ථාවක, දැන්වීමේ දිනයේ සිට දින හතක කාලයක් තුළ දී ක්‍රියාකාරිකයා විසින්—

(අ) බලපත්‍රලාභියා විසින් කරගෙන යාමට යෝජනා කරනු ලබන කර්මාන්තවලින් අවශ්‍ය කෙරෙන්නා වූ හෝ උචිත වන්නා වූ යම් වෙනස් කිරීමක් ක්‍රියාකාරිකයා විසින්ම කිරීමට අදහස් කරන බව; හෝ

(ආ) ක්‍රියාකාරිකයාගේ අධීක්ෂණය යටතේ සහ ඔහු හෝ ඇය සෑහීමට පත් වන ආකාරයට එවැනි යම් වෙනස් කිරීමක් බලපත්‍රලාභියා විසින් ම කිරීම ඔහු හෝ ඇය විසින් නියම කරන බව,

යන දෙකින් කවරක් හෝ සඳහන් කරන ප්‍රති දැන්වීමක් බලපත්‍රලාභියා වෙත දිය හැකි ය.

(7) (6) වන ඡේදය යටතේ දෙන ලද ප්‍රති දැන්වීමක යම් වෙනස් කිරීමක් ඔහු විසින් හෝ ඇය විසින්ම කිරීමට අදාළ ක්‍රියාකාරිකයා අදහස් කරන බව සඳහන් කර ඇති අවස්ථාවක—

(අ) ඒ වෙනස් කිරීම කිරීමේ කාර්යය සඳහා යම් කර්මාන්තයක් ක්‍රියාත්මක කිරීම පිණිස, බලපත්‍රලාභියා වෙනුවට ක්‍රියාකාරිකයාට අයිතිය තිබිය යුතු ය; තව ද

(ආ) එම කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේ දී ක්‍රියාකාරිකයා විසින් දරන්නට යෙදුනු යම් සාධාරණ වියදම් සහ ඒ වෙනස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රියාකාරිකයාට විඳින්නට සිදු වූ යම් පාඩුවක හෝ අලාභහානියක ප්‍රමාණය ක්‍රියාකාරිකයා විසින් බලපත්‍රලාභියාගෙන් අය කරගනු ලැබිය යුතු ය.

(8) (6) වන ඡේදය යටතේ දෙන ලද ප්‍රති දැන්වීමක අදාළ ක්‍රියාකාරිකයාගේ අධීක්ෂණය යටතේ සහ ඔහු සෑහීමට පත් වන ආකාරයෙන් යම් වෙනස් කිරීමක් කළ යුතු බව සඳහන් වන අවස්ථාවක—

(අ) බලපත්‍රලාභියා විසින්, ඒ ප්‍රති දැන්වීමේ නියමයන් අනුව ක්‍රියා කිරීමක් හැර වෙනස් කිරීම නොකළ යුතු ය; තව ද

(ආ) ඒ අධීක්ෂණය කිරීමේ දී හෝ ඒ හා සම්බන්ධිතව ක්‍රියාකාරිකයා විසින් දරන ලද යම් සාධාරණ වියදම් සහ ඒ වෙනස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රියාකාරිකයාට විඳින්නට සිදු වූ යම් පාඩුවක හෝ අලාභහානියක ප්‍රමාණය ක්‍රියාකාරිකයා විසින් බලපත්‍රලාභියාගෙන් නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක දී අය කර ගනු ලැබිය යුතු ය.

(9) (අ) (6) වන ඡේදය යටතේ ප්‍රති දැන්වීමක් දී නොමැති අවස්ථාවක; හෝ

(ආ) ඒ ඡේදය යටතේ ප්‍රති දැන්වීමක් දීමෙන් පසු, බලපත්‍රලාභියා විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත කර්මාන්ත මගින් අවශ්‍ය කරන්නා වූ හෝ උචිත වන්නා වූ යම් වෙනස් කිරීමක්, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභියා විසින් දැන්වීම මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන (පැය හතලිස්අටකට නොඅඩු වන) යම් කාලසීමාවක් තුළ දී සිදු කිරීම අදාළ ක්‍රියාකාරිකයා විසින් පැහැර හරිනු ලැබූ හෝ අවශ්‍ය අධීක්ෂණය සැපයීමට සාධාරණ හේතු රහිතව අපොහොසත් වූ අවස්ථාවක,

වෙනස් කිරීම කිරීමේ කාර්ය සඳහා අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභියා විසින් ඒ කර්මාන්ත ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාකාරිකයාගේ අධීක්ෂණය නොමැතිව ඒ කර්මාන්ත ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය හැකි ය : එහෙත් ඒ අවස්ථා දෙකෙන් කවර අවස්ථාවක වුව ද ඒ කර්මාන්ත ක්‍රියාකාරිකයා සෑහීමට පත් වන ආකාරයට ක්‍රියාත්මක කළ යුතු ය.

(10) (අ) (4) වන ඡේදය මගින් නියම කර ඇති දැන්වීම දීමෙන් තොරව යම් කර්මාන්තයක් ක්‍රියාත්මක කරන්නා වූ ; හෝ

(ආ) මේ ඡේදය යටතේ අදාළ ක්‍රියාකාරිකයකු විසින් දෙන ලද යම් සාධාරණ නියමයක් අනුව ක්‍රියා කිරීමට සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින,

බලපත්‍රලාභියකු හෝ ඔහුගේ හෝ ඇයගේ යම් නියෝජිතයකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

3. (1) (අ) බලපත්‍රලාභියකුගේ බලපත්‍රයක් මගින් කර ගෙන යාම පිණිස බලපත්‍රලාභියාට බලය දී ඇති කටයුතු කරගෙන යාමට සම්බන්ධිත යම් කාර්යයක් සඳහා බලපත්‍රලාභියකුට යම් ඉඩමක් මත, යටින් හෝ උඩින් විදුලි මාර්ගයක් සවි කිරීම හෝ සවි කොට පවත්වා ගැනීම අවශ්‍ය කරන්නා වූ හෝ උචිත වන්නා වූ අවස්ථාවක; සහ

(ආ) ඉඩමේ අයිතිකරුට හෝ පදිංචිකරුට, දැන්වීමේ නිශ්චිතව සඳහන් (දින විසි එකකට අඩු නොවිය යුතු) කාලසීමාවක් තුළ දී අවශ්‍ය මාර්ග අවසරය දෙන ලෙස නියම කරමින් දැන්වීමක් දීමෙන් පසු, ඔහු හෝ ඇය විසින්—

(i) ඒ කාලසීමාව අවසාන වීමට ප්‍රථම මාර්ග අවසරය දීම පැහැර හරින ලද; හෝ

(ii) බලපත්‍රලාභියාට පිළිගත නොහැකි නියම සහ කොන්දේසිවලට යටත්ව මාර්ග අවසරය දී ඇති අවස්ථාවක,

මේ අයිතමය අදාළ විය යුතු ය.

(2) තවද—

(අ) තම බලපත්‍රය මගින් කර ගෙන යාම පිණිස බලපත්‍රලාභියකුට බලය දී ඇති කටයුතු කර ගෙන යාම හා සම්බන්ධිත කිසියම් කාර්යයක් සඳහා යම් ඉඩමක් මත, යටින් හෝ උඩින් විදුලි මාර්ගයක් සවිකර තබා ගැනීමට බලපත්‍රලාභියකුට අවශ්‍ය වන්නා වූ හෝ උචිත වන්නා වූ අවස්ථාවක; සහ

(ආ) ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් 5(2) ඡේදය යටතේ විදුලි මාර්ගය ඉවත් කරන ලෙස ඉල්ලමින් බලපත්‍රලාභියා වෙත දැන්වීමක් දී ඇති අවස්ථාවක,

මේ අයිතමය අදාළ විය යුතු ය.

(3) (1) වන හෝ (2) වන ඡේද අදාළ වන සහ කොමිෂන් සභාව—

(අ) මාර්ග අවසරයක් ලබා ගැනීම සුරක්ෂිත කර ගැනීම පිණිස බලපත්‍රලාභියකු විසින් සියලු සාධාරණ ප්‍රයත්න රැගෙන ඇති බවට; සහ

(ආ) එම ප්‍රයත්න අසාර්ථක වී ඇති බවට; සහ

(ඇ) බලපත්‍රලාභියාගේ බලපත්‍රය මගින් බලය දී ඇති කටයුතු කර ගෙන යාම සඳහා එම මාර්ග අවසරය අත් කර ගැනීම අවශ්‍ය වී තිබෙන බවට,

සෑහීමට පත් වූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, බලපත්‍රලාභියා විසින් කරන ලද ඉල්ලීමකින් පසු සති හයක් තුළ දී මාර්ග අවසරය අත් කර ගැනීම

අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය යුතු ය. ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් යෝජිත අත් කර ගැනීම අනුමත කරනු ලැබූ අවස්ථාවක, මාර්ග අවසරය පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය වී ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබ බලපත්‍රලාභියා වෙත පවරා දිය හැකි ය.

(4) එසේ වුව ද, (3) වන ඡේදය යටතේ මාර්ග අවසරයක් අත්කර ගැනීම—

(අ) ඉඩම වාසස්ථානයකින් ආවරණය වී තිබෙන හෝ ඒ ඉඩමෙහි වාසස්ථානයක් ඉදි කිරීම සඳහා අදාළ නීති යටතේ සැලසුම් අවසරය ප්‍රදානය කර ඇති අවස්ථාවක දී; සහ

(ආ) විදුලි මාර්ගය සවි කිරීමට ඇත්තේ ඉඩම මත හෝ උඩින් වන අවස්ථාවක දී,

කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු නොලැබිය යුතු ය.

(5) (3) වන ඡේදය යටතේ නිර්දේශයක් කිරීමට ප්‍රථමයෙන්—

(අ) ඉඩමේ පදිංචිකරුට; සහ

(ආ) පදිංචිකරු ඒ ඉඩමේ අයිතිකරු නොවන අවස්ථාවක, අයිතිකරුට කොමිෂන් සභාව විසින් පත් කරන ලද තැනැත්තකු විසින් කරනු ලබන කරුණු විමසීමක දී සවන් දෙනු ලැබීමේ අවස්ථාවක් ලබා දිය යුතු ය.

(6) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ මාර්ග අවසරයක් අත්කර ගනු ලැබ බලපත්‍රලාභියා වෙත එය පවරා දෙනු ලැබූ අවස්ථාවක, ඒ මාර්ග අවසරය—

(අ) ඉඩම කෙරෙහි වූ සම්බන්ධතා හෝ ඒ මත තාවකාලික බැඳීම් හෝ ඊට බලපාන වෙනත් බැඳීම් ලියාපදිංචි කිරීමට නියම කෙරෙන්නා වූ යම් නීති ප්‍රඥප්තියක විධිවිධානවලට යටත් නොවිය යුතු ය;

(ආ) ඉඩමේ කවර හෝ වේලාවක අයිතිකරු හෝ පදිංචිකරු වන කවර හෝ තැනැත්තකු කෙරෙහි බන්ධනය විය යුතු ය.

4. (1) 3 වන අයිතමය යටතේ බලපත්‍රලාභියකුට මාර්ග අවසරයක් ප්‍රදානය කර ඇති අවස්ථාවක—

(අ) ඉඩමේ පදිංචිකරු විසින්; හෝ

(ආ) පදිංචිකරු ඉඩමේ අයිතිකරු ද නොවන අවස්ථාවක, ඉඩමේ අයිතිකරු විසින්,

කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි, ඒ ප්‍රදානය වෙනුවෙන් සාධාරණ වන්දියක් බලපත්‍රලාභියාගෙන් අයකර ගනු ලැබිය හැකි ය.

(2) එවැනි මාර්ග අවසරයකින් පවරන ලද යම් අයිතියක් ක්‍රියාත්මක කිරීමේ දී ඉඩමට හෝ චංචල දේපළවලට යම් හානියක් සිදු වූ අවස්ථාවක, ඉඩම කෙරෙහි හෝ චංචල දේපළ කෙරෙහි සම්බන්ධතාව ඇති යම් තැනැත්තකු විසින් ඒ අලාභහානිය සම්බන්ධයෙන් බලපත්‍රලාභියාගෙන් සාධාරණ වන්දි අය කර ගනු ලැබිය හැකි ය:

තව ද එවැනි අයිතියක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, තැනැත්තකුට යම් ඉඩමක් හෝ චංචල දේපළක් ඔහු හෝ ඇය විසින් භුක්ති විඳීමේ දී බාධා කිරීමක් සිදු වූ අවස්ථාවක, ඒ බාධා වීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි වූ මුදලකින් බලපත්‍රලාභියාගෙන් වන්දි අය කර ගනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් ස්වකීය පෙළඹීමෙන්ම හෝ බලපෑමට ලක් වූ තැනැත්තකුගේ ඉල්ලීම මත, (1) වන සහ (2) වන ඡේද යටතේ බලපත්‍රලාභියකු යම් තැනැත්තකුට යම් වන්දියක් ගෙවීමට යටත්ව සිටින්නේ දැයි තීරණය කිරීම පිණිස අවශ්‍ය විය හැකි විමසීම් සිදු කරනු ලැබිය හැකි ය.

(4) (3) වන ඡේදය යටතේ වූ යම් තීරණයක් කොමිෂන් සභාව විසින් බලපත්‍රලාභියාට සහ වන්දි ඉල්ලා ඇති යම් තැනැත්තකුට හෝ වන්දි ප්‍රදානය කරනු ලැබූ තැනැත්තකුට දන්වා සිටිය යුතු ය.

(5) (1) වන හෝ (2) වන ඡේද යටතේ වන්දි ගෙවීමට නොමැති බවට වූ කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් තැනැත්තකු විසින් හෝ කොමිෂන් සභාව විසින් ගෙවීමට තීරණය කරන ලද වන්දියේ ප්‍රමාණය කෙරෙහි සෑහීමට පත් නොවූනු තැනැත්තකු විසින්, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක, වන්දි ඉල්ලා සිටිනු ලබන බලපත්‍රලාභියාට විරුද්ධව ඒ තැනැත්තා ඉල්ලා සිටින වන්දි මුදල හෝ ඒ තැනැත්තා ඉල්ලා සිටින වන්දි මුදල සහ ඒ තැනැත්තාට ගෙවීමට කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති වන්දි මුදල අතර වෙනස අය කර ගැනීම සඳහා නඩු පවරනු ලැබිය හැකි ය.

(6) (5) වන ඡේදය යටතේ යම් තැනැත්තකු විසින් ගෙනෙනු ලබන යම් නඩුවක්—

(අ) (4) වන ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් එවනු ලබන සංදේශනයක් ඒ තැනැත්තාට ලැබුනු දිනයේ සිට;

(ආ) කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද වන්දියේ ප්‍රමාණය (7) වන ඡේදය යටතේ ඒ තැනැත්තාට ගෙවූ දිනයේ සිට; හෝ

(ඇ) (7) වන ඡේදය යටතේ ඒ මුදල අධිකරණයට ගෙවීම පිළිබඳ දැන්වීම දුන් හෝ පළමුවන වතාවට ප්‍රදර්ශනය කළ දිනයේ සිට,

මාස දෙකක කාලයක් තුළ දී පවරනු ලැබිය යුතු ය.

(7) (1) වන් හෝ (2) වන ඡේද යටතේ ඒ ඉඩමේ අයිතිකරුට වන්දි මුදලක් ගෙවීමට යටත්ව සිටින බලපත්‍රලාභියකු විසින් ඒ මුදල, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත දී ඒ තැනැත්තා වෙත ගෙවිය යුතු ය. අයිතිකරු කවරෙක් දැයි නොදන්නා විට හෝ ඉඩමේ අයිතිය ආරාවුලකට යටත්ව තිබෙන විට බලපත්‍රලාභියා විසින්—

(අ) ඒ මුදල ඉඩම පිහිටි ස්ථානය අරභයා නිසි අධිකරණ බලය ඇති දිසා අධිකරණයෙන්, හිමිකම ඔප්පු කිරීම මත ඒ තැනැත්තා විසින් ලබා ගනු පිණිස කොමිෂන් සභාව තීරණය කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත දී ඒ අධිකරණය වෙත ගෙවිය යුතු ය; තව ද

(ආ) කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද කාලය ඇතුළත ඒ මුදල අධිකරණය වෙත ගෙවීම පිළිබඳ ලිඛිත දැන්වීම ඉඩමේ පදිංචිකරු වෙත දිය යුතු අතර, පදිංචිකරුවකු නොසිටී නම්, ඒ දැන්වීම ඒ ඉඩමේ හොඳින් පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

5. (1) (3) වන අයිතමයේ සඳහන් කරන ලද පරිදි වූ (ඒ අයිතමය යටතේ ප්‍රදානය කරන ලද්දේ හෝ පාර්ශ්වයන් අතර එකඟත්වයෙන් දෙන ලද්දේ වුවද) මාර්ග අවසරයක් කිසියම් අවස්ථාවක—

(අ) මාර්ග අවසරයේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඉකුත්ව යාමෙන් තීරණය කරනු ලබන අවස්ථාවක;

(ආ) මාර්ග අවසරයේ අන්තර්ගත නියමයකට අනුකූලව ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් අවසන් කරනු ලැබූ අවස්ථාවක; හෝ

(ඇ) මාර්ග අවසරය දීමෙන් පසු ඉඩමේ අයිතිය හෝ පදිංචිය වෙනස්වීමේ හේතුවෙන්, එය ඉඩමේ අයිතිකරු කෙරෙහි හෝ පදිංචිකරු කෙරෙහි බන්ධනය වීම අවසන් වන අවස්ථාවක,

මේ ඡේදය අදාළ විය යුතු ය.

(2) (1) වන ඡේදය තුළට වැටෙන කාරණයක දී ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින්—

(අ) මාර්ග අවසරයේ නිශ්චිතව සඳහන් කාලසීමාව අවසාන වීමට ප්‍රථමයෙන් මාස තුනකට පසුව හෝ ඇතුළත ඕනෑම අවස්ථාවක දී;

(ආ) ඔහු හෝ ඇය විසින් මාර්ග අවසරය අවසන් කරන ලද ඕනෑම අවස්ථාවක දී; නැතහොත්

(ඇ) ඒ ඡේදයේ සඳහන් කර ඇති පරිදි ඉඩමේ අයිතියෙහි හෝ පදිංචියෙහි සිදුවන වෙනස්වීමක් ප්‍රකාර ඉඩමේ අයිතිකරුගේ පදිංචිකරු බවට පත් වීමෙන් පසු ඕනෑම අවස්ථාවක දී ඉඩමෙන් විදුලි මාර්ගය ඉවත් කරන ලෙස බලපත්‍රලාභියාට නියම කරමින් බලපත්‍රලාභියා වෙත දැන්වීමක් දෙනු ලැබිය හැකි ය: එහෙත් මේ ඡේදයේ පහත දැක්වෙන විධිවිධානවලින් ඉඩ සලස්වා ඇති අවස්ථාගත කරුණුවල දී සහ ප්‍රමාණයට හැර, එවැනි දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීමට බලපත්‍රලාභියා බැඳී නොසිටින්නේ ය.

(3) (2) වන ඡේදය යටතේ වූ දැන්වීමේ දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලයක් තුළ දී, බලපත්‍රලාභියා—

(අ) 3 වන අයිතමය යටතේ අවශ්‍ය මාර්ග අවසරය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමට අපොහොසත් වන අවස්ථාවක;

(ආ) 3 වන අයිතමය යටතේ අවශ්‍ය කරන මාර්ග අවසරය ලබා ගැනීම පිණිස ඉල්ලීමක් කරනු ලැබ ඒ ඉල්ලීම කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක;

(ඇ) මේ උපලේඛනයේ 7 වන අයිතමය යටතේ ඉඩම අනිවාර්යයෙන් මිලට ගැනීමට බලය දෙමින් වූ නියමයක් ලබා ගැනීමට අසමත් වූ අවස්ථාවක,

බලපත්‍රලාභියා විසින්, කාලසීමාව අවසානයේ දී නැතහොත් (ආ) අනුඡේදය සම්බන්ධයෙන් වන විට, කොමිෂන් සභාවේ තීරණයේ දිනයෙන් ආරම්භ වන මාසයක කාලසීමාව හෝ කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ඊට වඩා දීර්ඝ කාලයක් අවසානයේ දී දැන්වීමට අනුව ක්‍රියා කළ යුතු ය.

(4) මේ උපලේඛනයෙහි ඉඩමකට අදාළව මාර්ග අවසරය යන්නෙන්, ඒ ඉඩම මත, යට හෝ උඩින් විදුලි මාර්ගයක් සවි කිරීම පිණිස සහ සවි කර තැබීම පිණිස ද ඒ විදුලි මාර්ගය පරීක්ෂා කිරීමේ, නඩත්තු කිරීමේ, වෙනස් කිරීමේ, අළුත්වැඩියා කිරීමේ, ඉවත් කිරීමේ හෝ ප්‍රතියෝජනය කිරීමේ කාර්යය සඳහා ඒ ඉඩමට ප්‍රවේශය ලැබීම පිණිස බලපත්‍රලාභියාට අයිතියක් සැලසෙන පරිදි ඉඩම කෙරෙහි වූ සම්බන්ධතාව අදහස් වේ.

6. (1) බලපත්‍රලාභියා විසින් සවි කර ඇත්තා වූ හෝ සවි කරනු ලබන්නා වූ හෝ සවිකිරීමට ඇත්තා වූ හෝ විදුලි මාර්ගයකට හෝ විදුලි පිරියතකට—

(අ) ඒ විදුලි මාර්ගය හෝ විදුලි පිරියත සවි කිරීම, නඩත්තුව හෝ ක්‍රියාකාරීත්වයට බාධා කෙරෙන හෝ මැදිහත් වන පරිදි; හෝ

(ආ) පිළිගත නොහැකි, (ළමයින්ට හෝ වෙනත් තැනැත්තන්ට) අනතුරු ඇති කරන ප්‍රභවයක් සැලසෙන පරිදි,

යම් ගසක් සමීප ස්ථානගතව තිබෙන හෝ මතු තිබිය හැකි අවස්ථාවක මේ අයිතමය අදාළ විය යුතු අතර මේ අයිතමයේ "ඉඩම" යන්නෙන් ගස වැඩෙමින් පවතින්නා වූ ඉඩම අදහස් වේ.

(2) (1) (අ) හෝ (ආ) අනුඡේදවල සඳහන් කරන ලද බලපෑම්වලින් වැළකීමට හැකි වන පරිදි, ගස කපා දැමීමට හෝ අතු කපා දැමීමට නැතහොත් එහි මුල් කපා දැමීමට ඉඩමේ පදිංචිකරුට නියම කරමින් වූ දැන්වීමක්, ඒ දැන්වීමේ නියමයන් අනුව කටයුතු කිරීමේ දී ඔහු හෝ ඇය විසින් සාධාරණ ලෙස දරන ලද වියදම් බලපත්‍රලාභියා විසින් ඔහුට හෝ ඇයට ගෙවීමට යටත්ව, බලපත්‍රලාභියා විසින් ඔහුට හෝ ඇයට දිය හැකි ය.

(3) පදිංචිකරු ඉඩමේ අයිතිකරු ද නොවන අවස්ථාවක (2) ඡේදය යටතේ වූ යම් දැන්වීමක පිටපතක් අයිතිකරු වෙත ද භාර දෙනු ලැබිය යුතු ය.

(4) (2) වන ඡේදය යටතේ දැන්වීමක් දීමෙන් පසු දින විසි එකක් ඇතුළත දී—

(අ) දැන්වීමේ නියමයන් ඉටු කර නොමැත්තේ නම්; සහ

(ආ) ඉඩමේ අයිතකරු හෝ පදිංචිකරු යන දෙදෙනාම විසින් (5) වන ඡේදය යටතේ ප්‍රති දැන්වීමක් දී නොමැත්තේ නම්,

බලපත්‍රලාභියා විසින්, (1) (අ) හෝ (ආ) අනුඡේදවල සඳහන් කරන ලද බලපෑමෙන් වළක්වාලීමට හැකි වන පරිදි ඒ ගස කපා දැමීමට හෝ අතු කපා දැමීමට හෝ එහි මුල් ගලවා දැමීමට කටයුතු සැලැස්විය යුතු ය.

(5) (2) ඡේදය යටතේ දැන්වීමක් දීමෙන් දින විසි එකක් ඇතුළත දී ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින්, දැන්වීමේ නියමයන්ට විරෝධය ප්‍රකාශ කරමින් ප්‍රති දැන්වීමක් බලපත්‍රලාභියාට දෙන්නේ නම්, කාරණය කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(6) (5) වන ඡේදය යටතේ කොමිෂන් සභාව වෙත යොමු කිරීමෙන් පසු, කොමිෂන් සභාව විසින් පත් කරන ලද තැනැත්තකු විසින් කරුණු විමසා බැලීම පිණිස පාර්ශ්වකරුවන්ට අවස්ථාවක් දීමෙන් පසු, කොමිෂන් සභාව විසින් යුක්ති සහගත යයි අවස්ථානුකූල කරුණු අනුව සලකනු කරන නියමයක් කරනු ලැබිය හැකි ය ; එම නියමය මගින්—

(අ) (නියමය මගින් විධාන කෙරෙන පරිදි) කර්මාන්තය ආරම්භ කිරීම පිළිබඳව වූ දැන්වීම, ප්‍රති දැන්වීමක් දී ඇති තැනැත්තකු වෙත දීමෙන් පසු 1 (අ) හෝ

(ආ) අනුච්ඡේදයේ සඳහන් බලපෑමක් වැළැක්වීමට හැකිවනු පිණිස ඒ ගස කපා දැමීමට හෝ අතු කපා දැමීමට සැලැස්වීම පිණිස බලපත්‍රලාභියාට ඉඩ දිය හැකි ය ; සහ

(ආ) අයිතිකරු හෝ පදිංචිකරු විසින් බලපත්‍රලාභියාට ගෙවිය යුතු වියදම් (කිසිවක් වේ නම්) කවරේද යන්න පිළිබඳ යම් ප්‍රශ්නයක් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(7) (4) වන ඡේදයට හෝ (6) වන ඡේදය යටතේ කරන ලද නියමයකට අනුව බලපත්‍රලාභියා ක්‍රියා කරන අවස්ථාවක, බලපත්‍රලාභියා විසින්—

(අ) ගස් කපා බිම හෙළීමට හෝ අතු පැහීමට නැතහොත්, සුදුසු වෘක්ෂ වගා පිළිවෙතකට අනුකූලව සහ ගස්වලට, වැටවලට, බඩවැටිවලට සහ වැවෙන ඵලදාවලට හැකිතාක් අඩුවෙන් හානි සිදු විය හැකි පරිද්දෙන් ඒවායේ මුල් කැපීමට සැලැස්වීම;

(ආ) ගස් කපා බිම හෙළූ ගස් පාහින ලද අතු හෝ කැපූ ගස් මුල්. අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ විධානවලට අනුකූලව ඉවත් කිරීමට සැලැස්වීම; සහ

(ඇ) ඉඩමට කරන ලද යම් හානියක් සපුරාලීම කරනු ලැබිය යුතු ය.

(8) මේ විෂයාංකයේ "ගස" යන්නට, යම් පඳුරක් ඇතුළත් වන අතර, "කපා බිම හෙළීම" සහ "අතු පැහීම" සම්බන්ධයෙන් වූ යොමු කිරීම්, ඒ අනුව තේරුම් ගත යුතු ය.

7. (1) බලපත්‍රලාභියකුගේ බලපත්‍රයක් මගින් කර ගෙන යාමට ඔහුට හෝ ඇයට බලය දී ඇති කටයුතු කර ගෙන යාමේ කාර්යය සඳහා හෝ ඒ බලපත්‍රලාභියාට මේ පනතින් පවත් කර දී ඇති යම් කර්තව්‍යයක් ඉටු කිරීමේ කාර්යය සඳහා යම් නිශ්චල දේපළක් අවශ්‍ය කරන බවට කොමිෂන් සභාව සෑහීමට පත් වූ අවස්ථාවක සහ—

(අ) ඒ දේපළ අත් කර ගැනීම සාකච්ඡා කිරීම පිණිස දේපළේ අයිතිකරු සමග බලපත්‍රලාභියා විසින් සියලු සාධාරණ උත්සාහ දරා ඇති ; සහ

(ආ) එම උත්සාහයන් අසාර්ථක වී ඇති අවස්ථාවක,

නිශ්චල දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගන්නා ලෙසත් එය බලපත්‍රලාභියාට පවරා දෙන ලෙසත් කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන ඡේදය යටතේ කරන ලද කොමිෂන් සභාවේ නිර්දේශයෙහි නිශ්චිතව සඳහන් නිශ්චල දේපළේ යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, ඒ නිශ්චල දේපළ පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන බලපත්‍රලාභියා වෙත පැවරිය යුතු ය.

(3) බලපත්‍රලාභියකු සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතු ය.

(4) ඒ නියවල දේපළ, එය අයිති වෙනත් බලපත්‍රලාභියකු විසින්, ඔහුගේ හෝ ඇයගේ බලපත්‍රයෙන් බලපත්‍රලාභියාට බලය දී ඇති කටයුතු කර ගෙන යාම සඳහා අවශ්‍ය කරන සවි කිරීමක කාර්යය සඳහා භාවිත කරනු ලබන්නේ නම්, හෝ එවැනි සවි කිරීමක කාර්යය සඳහා ඒ වෙනත් බලපත්‍රලාභියා විසින් අවුරුදු පහක කාලයක් ඇතුළත භාවිත කිරීමට යෝජනා කර ඇත්තේ නම්, කොමිෂන් සභාව විසින් (1) වන ඡේදය යටතේ යම් නියවල දේපළක් අත්කර ගැනීම නිර්දේශ කරනු නොලැබිය යුතු ය.

II වන උපලේඛනය

විදුලි බලය සැපයීම් සංග්‍රහය

(31 වන වගන්තිය)

1. (1) (2) වන ඡේදයට යටත්ව, විදුලි බලය සැපයීම සම්බන්ධයෙන් හෝ යම් විදුලි මීටරයක්, විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් සැපයීම සම්බන්ධයෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් ගාස්තු ක්‍රම පාරිභෝගියකුගෙන් බලපත්‍රලාභියාට ලැබිය යුතු යම් ගාස්තුවක් අයකර ගනු ලැබිය යුතු ය.

(2) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් ගාස්තු ක්‍රම පාරිභෝගිකයකුට විදුලිය සැපයූ යම් පරිශ්‍රයක් ඔහු හෝ ඇය විසින් බෙදා හැරීමේ බලපත්‍රලාභියාට යටත් පිරියෙයින් වැඩ කරන දින දෙකකවත් දැනුම්දීමක් නොකර ඉවත් වී ගියහොත් ඔහු හෝ ඇය, පරිශ්‍රයට සපයන ලද විදුලිය වෙනුවෙන්—

(අ) පරිශ්‍රයට සාධාරණ ප්‍රවේශය දීමට යටත්ව, ඔහු හෝ ඇය ඒ දැන්වීම දීමෙන් පසු දෙවන වැඩ කරන දිනයට කලින් දින තෙක් ;

(ආ) යම් මීටරයක සලකුණු වී ඇති සංඛ්‍යාව ස්ථිර ලෙස සහතික කර ගත් දිනයට පසු දිනයට කලින් දින තෙක් ; සහ

(ඇ) අනතුරුව එම පරිශ්‍රයේ පදිංචි වන යම් තැනැත්තකු විසින් පරිශ්‍රයට විදුලිය සපයන ලෙස සැපයුම්කරුගෙන් ඉල්ලා සිටින දිනයට කලින් දින තෙක්,

එකතුවී ඇති සියලු ගාස්තු ගෙවීමට යටත් විය යුතු ය.

(3) ගාස්තු ක්‍රම පාරිභෝගිකයකු විසින් බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට ගෙවිය යුතු විදුලිය ගාස්තු සඳහා වූ සැම ඉල්ලීම් පත්‍රිකාවක් මතම (2) වන ඡේදයේ විධිවිධාන හෝ එම විධිවිධාන සඳහන් කෙරෙන ප්‍රකාශයක් පිටපත් කරනු ලැබිය යුතු ය.

(4) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් ගාස්තු ක්‍රම පාරිභෝගිකයකුට විදුලිබලය සැපයූ යම් පරිශ්‍රයක් ඔහු හෝ ඇය විසින්, සපයන ලද විදුලි බලය වෙනුවෙන් ඔහුගෙන් හෝ ඇයගෙන් අයවිය යුතු සියලු ගාස්තු හෝ සැපයුමේ කාර්ය සඳහා වූ යම් විදුලි මීටරයක්, විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් සැපයීමේ වියදම් නොගෙවා ඉවත්ව ගියහොත්, බලපත්‍රලාභියා විසින්—

(අ) අය විය යුතු ගාස්තු ඔහු හෝ ඇය විසින් ගෙවන තෙක් ඔහුට හෝ ඇයට වෙනත් යම් පරිශ්‍රයක විදුලි බලය සැපයීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය ; එහෙත්

(ආ) එකී බලපත්‍රලාභියාට පරිශ්‍රයේ ඊළඟ පදිංචිකරුට එම ගාස්තු ගෙවන ලෙස නියම කිරීමට හිමිකමක් නොමැත්තේ ය.

(5) ගාස්තු ක්‍රම පාරිභෝගිකයකු විසින්—

(අ) යම් පරිශ්‍රයකට සපයන ලද විදුලි බලය වෙනුවෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට අය විය යුතු සියලු ගාස්තු හෝ සැපයුමේ කාර්ය සඳහා වූ යම් විදුලි මීටරයක්, විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් සැපයීමේ වියදම් නියමිත කාලසීමාව තුළ දී නොගෙවුවහොත් ; හෝ

(ආ) බලපත්‍රලාභියා විසින් වෙනත් යම් පාරිභෝගිකයකුට දී ඇති සැපයුමට අනිසි ලෙස හෝ අනුචිත ලෙස මැදිහත් වන යම් මෙවලමක් භාවිත කිරීම නවත්වන ලෙස නියම කරමින් බලපත්‍රලාභියාගෙන් ලත් දැන්වීමක් අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් නියමිත කාලසීමාව අවසානයේ දී ඒ පරිශ්‍රයට දී ඇති සැපයුම හෝ පාරිභෝගිකයා පදංචිව සිටින වෙනත් යම් පරිශ්‍රයකට වූ සැපයුම බලපත්‍රලාභියා යෝග්‍ය යයි කල්පනා කරන මාර්ගයකින් කපා හැර එසේ කිරීමේ යම් වියදමක් පාරිභෝගිකයාගෙන් අය කර ගත යුතු ය.

(6) (5) වන ඡේදයේ සඳහන් වන "නියමිත කාලසීමාව" යන්නෙන්—

(අ) පූර්ණ ලෙස හා ප්‍රධාන ලෙස ගෘහ කාර්ය සඳහා භාවිත කරන පරිශ්‍ර සම්බන්ධයෙන් වන විට, අය විය යුතු ගාස්තු ගෙවීම සඳහා ලියවිල්ලකින් වූ ඉල්ලීමක් බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් කිරීම හෝ වෙනත් පාරිභෝගිකයකුට දෙන ලද විදුලිය සැපයුම සමඟ මැදිහත් වන මෙවලම් භාවිතය නවත්වන ලෙස ගාස්තු ක්‍රම පාරිභෝගිකයකුට නියම කරමින් බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් දැන්වීමක් කිරීම යන දෙකින් කවරකට හෝ පසු දින දහයකට අඩු නොවන කාලසීමාවක් ; සහ

(ආ) වෙනත් යම් පරිශ්‍රයක් සම්බන්ධයෙන් වන විට, එවැනි ඉල්ලීමක් කිරීමෙන් පසු දින දහයක කාලසීමාවක්,

අදහස්වේ.

(7) අය විය යුතු ගාස්තු පිළිබඳව අවභාජ ආරාවුලක් ඇත්තේ නම් (5) වන ඡේදය මගින් බලපත්‍රලාභියකුට පවරා දී ඇති බලතල බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් ක්‍රියාත්මක නොකළ යුතු ය.

(8) මේ අයිතමයෙහි යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක ධාරකයක් පිළිබඳ සැපයීමක් සම්බන්ධයෙන් කර ඇති සඳහනකට, එවැන්නක් අළුතින් සවි කිරීමෙන්, හෝ දැනට තිබෙන්නක් විකරණයෙන් එවැනි විදුලි මාර්ගයක් දරකයට හෝ සැපයීම පිළිබඳ සඳහනක් ද ඇතුළත් විය යුතු ය.

2. (1) අයක්‍රම පාරිභෝගිකයකුගේ යම් පැහැර හැරීමක ප්‍රතිඵලයක් වශයෙන් යම් පරිශ්‍රයක විදුලිය සැපයුම බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් කපාහරිනු ලැබූ අවස්ථාවක, (2) වන ඡේදයේ නියමයන් සම්පූර්ණ කරනු ලැබූ විට, වැඩකරන දින දෙකක් ඇතුළත විදුලිය සැපයුම නැවත යථා තත්ත්වයට පත් කිරීම පිණිස වූ බැඳීමකට බලපත්‍රලාභියා යටත් යන්නේ ය.

(2) මේ ඡේදයේ නියමයන් නම්, පැහැර හරිනු ලැබූ පාරිභෝගිකයා විසින්—

(අ) පැහැර හැරීම යථා තත්ත්වයට පත් කිරීම ;

(ආ) සැපයුම විසන්ධි කිරීමේ සහ යළි සම්බන්ධ කිරීමේ සාධාරණ වියදම් ගෙවීම ; සහ

(ඇ) පනතේ 26 වන වගන්තියේ සඳහන් කර ඇති පරිදි ඇප සපයා දීම.

වේ.

(3) (1) වන ඡේදයෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභියකු වෙත පනවන ලද බැඳීම, ඒ බැඳීම අනුව කටයුතු කිරීම පැහැර හැරීමෙන් බලපෑමක් ඇති විය හැකි යම් තැනැත්තකු කෙරෙහි බෙදා හැරීමේ බලපත්‍රලාභියාගෙන් ඉටුවිය යුතු යුතුකමක් විය යුත්තේ ය.

(4) (3) වන ඡේදය ප්‍රකාරව, යම් තැනැත්තකුට බලපත්‍රලාභියා විසින් ඉටු කළ යුතුව ඇති කාර්යයන් කඩ කරනු ලැබ ඇති අවස්ථාවක සහ එසේ කඩ කිරීමෙන් ඒ තැනැත්තාට පාඩු සහ අලාභහානි සිදු වන අවස්ථාවක, එය සිවිල් නඩුවක දී හෝ ඒ තැනැත්තාගේ ඉල්ලීම මත හෝ නඩු පැවරිය හැක්කේ ය.

(5) (4) වන ඡේදය ප්‍රකාරව බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට එරෙහිව ගෙනෙන ලද යම් නඩු කටයුත්තක දී, (1) වන ඡේදයෙන් බලපත්‍රලාභියා මත පැනවී ඇති බැඳීම අනුව ක්‍රියා කිරීමට නොහැකිවීම මගහැරවීම පිණිස තමා විසින් සියලු සාධාරණ පියවර ගන්නා ලද බවත්, සියලු නිසි උද්‍යෝගය ඇතිව ක්‍රියා කළ බවත් ඔප්පු කිරීම බෙදා හැරීමේ බලපත්‍රලාභියා වෙනුවෙන් විත්තිවාචකයක් විය යුතු ය.

(6) (1) වන ඡේදයෙන් බලපත්‍රලාභියකු මත පැනවී ඇති බැඳීමක් අනුව කටයුතු කිරීම පැහැර හැරීමක් සම්බන්ධයෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට විරුද්ධව සිවිල් නඩු කටයුතු ගෙන ඒමට (4) වන ඡේදයේ බලය ප්‍රකාරව යම් තැනැත්තකුට ඇති යම් අයිතියකට අගතියක් නොවන පරිදි, ඒ බැඳීම අනුව කටයුතු කිරීමට සැලැස්වීම, සිවිල් අධිකරණ බලය ඇති අධිකරණයක උචිත නඩු කටයුතු පැවරීම මගින් කොමිෂන් සභාව විසින් බලාත්මක කරනු ලැබිය හැක්කේ ය.

3. (1) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින්, යම් පරිශ්‍රයක විදුලි සැපයුම කපා හරිනු ලැබූ අවස්ථාවක, ඒ බලපත්‍රලාභියා හැරෙන්නට වෙනත් කිසිදු තැනැත්තකු විසින් එහි විදුලි බලය සැපයීම නැවත ලබා නොදිය යුතු ය.

(2) යම් තැනැත්තෙක් (1) වන ඡේදය උල්ලංඝනය කරමින් ක්‍රියා කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් ලුහු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර බෙදා හැරීමේ බලපත්‍රලාභී විදුලිය සැපයීම නැවැත්විය යුතු ය.

4. (1) චේතනාන්විතව හෝ නොසැලකිලිමත්කම නිසා හෝ යම් තැනැත්තකු විසින්—

(අ) (i) බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට ;

(ii) විදුලිබල උත්පාදන බලපත්‍රලාභියකුට ; හෝ

(iii) ප්‍රේෂණ බලපත්‍රලාභියකුට,

අයිති හෝ මවුන් විසින් ක්‍රියාත්මක කරන යම් විදුලි පිරියතකට හෝ විදුලි මාර්ගයකට ; හෝ

(ආ) බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ දේපළ මත පිහිටි ඒ බලපත්‍රලාභියාට අයිති හෝ ඔහු හෝ ඇය විසින් ක්‍රියාත්මක කරන යම් ගෘහ විදුලිය සම්පාදන උපකරණයකට හෝ ඉන් කොටසකට,

අලාභහානි කරන්නේ නම් හෝ අලාභහානි කිරීමට සලස්වන්නේ නම්, ඔහු හෝ ඇය මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) මේ ඡේදයේ "ගෘහ විදුලිබල සැපයීම් උපකරණය" යන්නට, පාරිභෝගිකයකුගේ දේපළ තුළ පිහිටි මීටරය තෙක් හා දක්වා සහ මීටරය ද ඇතුළුව සියලු විදුලි මාර්ග සහ පිරියත ඇතුළත් වේ.

(3) බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ විදුලි මාර්ගය හෝ විදුලි පිරියත සම්බන්ධයෙන් (1) (අ) අනුඡේදය යටතේ වරදක් සිදු කර ඇති අවස්ථාවක, එලෙස වරද කරන තැනැත්තා විසින් පිරියතට හෝ මාර්ගයට අලාභ හානි කිරීම නවත්වන තෙක් ඔහුගේ හෝ ඇයගේ විදුලි සැපයුම බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් විසන්ධි කරනු ලැබිය හැක්කේ ය.

(4) යම් ගෘහ විදුලි සැපයීම් උපකරණයක් සම්බන්ධයෙන් (1) (ආ) අනුඡේදය යටතේ වරදක් සිදු කර ඇති අවස්ථාවක, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්—

(අ) ඒ උපකරණවලට අලාභහානි කිරීම නවත්වනු ලබන තෙක් එලෙස වරද කරන තැනැත්තාගේ විදුලිය සැපයුම විසන්ධි කරනු ලැබිය හැක්කේ ය ; තව ද

(ආ) වරද සිදු කිරීමට සම්බන්ධ මීටරය ගලවා ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන ඡේදය යටතේ වූ බලතල ක්‍රියාත්මක කරමින් බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් මීටරයක් ගලවා ඉවත් කරනු ලැබූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් එය විනාශ කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට බලය දෙන තුරු බලපත්‍රලාභියා විසින් එය ආරක්ෂා සහිතව තබා ගත යුතු ය.

5. (1) 8 වන අයිතමයේ විධිවිධානවලට යටත්ව, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් බලය දෙන ලද යම් නිලධරයකු, පහත දැක්වෙන කාර්යවලින් කවරක් හෝ සඳහා, බෙදා හැරීමේ බලපත්‍රලාභියාට අයිති හෝ එය විසින් ක්‍රියාත්මක කරනු ලබන විදුලි මාර්ගය හා විදුලි පිරියත හරහා බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් විදුලි සැපයුම ලබා දෙන ඕනෑම පරිශ්‍රයකට ඇතුල් විය හැකි ය :—

(අ) බෙදා හැරීමේ බලපත්‍රලාභියාට අයත් හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් ක්‍රියාත්මක කරන යම් විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් පරීක්ෂා කිරීම ;

(ආ) යම් විදුලි මීටරයක සටහන් වී ඇති සංඛ්‍යාවන් සහතික ලෙස දැනගැනීම සහ ගාස්තු කලින් ගෙවීමේ මීටරයක් පිළිබඳ කරුණක් වන විට හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියාට අයිති යම් මුදලක් හෝ එය විසින් ක්‍රියාත්මක කරන ටෝකන ඉවත් කර ගෙන යාම ;

(ඇ) යම් විදුලි මීටරයක් ඉවත් කර ගැනීම, පරීක්ෂා කර බැලීම හෝ නැවත සවි කිරීම නැතහොත් යම් ආදේශිත මීටරයක් හෝ ආශ්‍රිත උපකරණයක් නැවත සවි කිරීම.

(2) (1) (අ) හා (ආ) අනුඡේදවලින් පවරා දුන් බලතල—

(අ) බලපත්‍රලාභියා විසින් පරිශ්‍රයට විදුලි සැපයුම නතර කරන ලෙස පාරිභෝගිකයා විසින් ලිඛිතව බෙදා හැරීමේ බලපත්‍රලාභියාගෙන් ඉල්ලා ඇති ;

(ආ) සාධාරණ කාලයක් තුළ දී එසේ කිරීමට බලපත්‍රලාභියාට නොහැකි වී ඇති,

පරිශ්‍රයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොකළ යුතු ය.

6. (1) මේ උපලේඛනයේ 4(3) හෝ 4(4) ඡේදවලින් බෙදාහැරීමේ බලපත්‍රලාභියාට—

(අ) යම් පරිශ්‍රයකට දී ඇති විදුලි සැපයුම විසන්ධි කිරීම පිණිස ; හෝ

(ආ) ඒ ඡේදය යටතේ වරද සිදු කිරීමට යොදාගත් විදුලි මීටරය ඉවත් කිරීම පිණිස,

බලය දී ඇති අවස්ථාවක, 8 වන අයිතමයට යටත්ව, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් බලය දී ඇති යම් නිලධරයකු විසින්, විදුලි සැපයුම විසන්ධි කිරීමේ කාර්ය සඳහා හෝ විදුලිය බෙදා හැරීම හෝ සැපයීම හා සම්බන්ධ කාර්ය සඳහා භාවිත කරන ලද මීටරය හෝ යම් ආශ්‍රිත විදුලි පිරියතයක් ඉවත් කර ගැනීමේ කාර්ය සඳහා හෝ පරිශ්‍රයට ඇතුල් විය හැකි ය.

(2) (අ) යම් පරිශ්‍රයක විදුලිය සැපයුම කපා හැරීම හෝ විසන්ධි කිරීම පිණිස මේ පනතේ වෙනත් යම් විධිවිධානවලින් හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලින් බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට බලය දී ඇති අවස්ථාවක ;

(ආ) බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් විදුලිය සපයනු ලැබූ යම් පරිශ්‍රයක පදිංචිව සිටින තැනැත්තාට එවැනි විදුලි සැපයුමක් අවශ්‍යවීම අවසන් වූ අවස්ථාවක ;

(ඇ) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් කලින් විදුලිය සැපයුමක් දී තිබුණු යම් පරිශ්‍රයක පදිංචියට පැමිණෙන තැනැත්තකුට එවැනි සැපයුමක් අවශ්‍ය නොවන අවස්ථාවක ;

(ඈ) බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට අයත් හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් ක්‍රියාත්මක කරන ලද මීටරයක් හරහා කලින් සිදු කළ විදුලිය සැපයුමක් යම් පරිශ්‍රයක පදිංචියට පැමිණෙන තැනැත්තාට ඒ මීටරය කුලියට ගැනීමට හෝ ණයට ගැනීමට අවශ්‍ය නොවූ අවස්ථාවක,

බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් බලය දුන් යම් නිලධරයකු විසින් 8 වන අයිතමයට යටත්ව, සැපයුම විසන්ධි කිරීමේ හෝ යම් විදුලි පිරියතක්, විදුලි මාර්ගයක් හෝ විදුලි මීටරයක් ඉවත් කිරීමේ කාර්ය සඳහා පරිශ්‍රයට ඇතුල් විය හැකි ය.

7. (1) අවස්ථාවෝචිත පරිදි බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින්, විදුලි උත්පාදන බලපත්‍රලාභියකු විසින්, හෝ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියකු විසින් බලය දී ඇති යම් නිලධරයකු, 8 වන අයිතමයට යටත්ව—

(අ) දැනටමත් නීත්‍යානුකූල ලෙස සවි කොට පවතින විදුලි මාර්ගය හෝ පිරියතක් වෙනුවට හෝ ඊට අමතරව අළුත් විදුලි මාර්ගයක් හෝ අළුත් විදුලි පිරියතක් ස්ථාපනය කිරීමේ ;

(ආ) දැනට පවත්නා යම් විදුලි මාර්ගයක් හෝ පිරියතක් අළුත්වැඩියා කිරීමේ හෝ වෙනස් කිරීමේ,

කාර්ය සඳහා යම් පරිශ්‍රයකට ඇතුල් විය හැකි ය.

(2) යම් විදුලි මාර්ගයක හෝ විදුලි පිරියතක වරදක් හේතුවෙන් පැන නගින හදිසි අවස්ථාවන් පිළිබඳ කරුණක දී 8 වන අයිතමයෙන් දිය යුතු බවට නියම කර ඇති දැන්වීම නොකර (1) වන ඡේදය යටතේ යම් පරිශ්‍රයකට ඇතුල් විය හැකි නමුත් ඒ දැන්වීම හැකි තරම් ඉක්මණින් එවිට දෙනු ලැබිය යුතු ය.

8 (1) මේ පනත යටතේ යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුල්වීමට බලය දී ඇති විදුලි පරීක්ෂකයකු හෝ බලපත්‍රලාභියකු (හෝ බලපත්‍රලාභියාගේ නිලධරයකු) විසින්, පහත දැක්වෙන අවස්ථාවල දී මිස, එසේ කිරීමට අයිතියක් ලෙස ඉල්ලා නොසිටිය යුතු ය :—

(අ) කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාවල ස්වභාවය සහ ප්‍රමාණය හැකිතාක් දුරට සම්පූර්ණයෙන් සහ නිවැරදි ලෙස සඳහන් කරමින් විදුලි පරීක්ෂකවරයා විසින් හෝ බලපත්‍රලාභියා විසින් හෝ බලපත්‍රලාභියාගේ නිලධරයකු විසින් අදහස් කර ඇති ඇතුල්වීම සම්බන්ධයෙන් දින තුනක දැන්වීමක් කර තිබීම ;

(ආ) එසේ කිරීමට නියම කර ඇතහොත්, ඔහු හෝ ඇය විසින් ඔහුගේ හෝ ඇයගේ බලතල පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කර තිබීම ;

(ඇ) ඇතුල්වීම ප්‍රකාරව සිදු විය හැකි යම් අවහිරවීමක්, අබලතාවක් හෝ අලාභහානියක් සඳහා ඉඩමේ හෝ පරිශ්‍රයේ අයිතිකරුට සාධාරණ වන්දියක් ගෙවීම.

(2) (1) (අ) අනුඡේදයේ සඳහන් කරන ලද යම් දැන්වීමක්—

(අ) ඉඩමෙහි පදිංචි වී සිටින අවස්ථාවක පදිංචිකරුට දිය යුතු ය :

(ආ) ඉඩමෙහි පදිංචි වී නැති අවස්ථාවක ඉඩමේ අයිතිකරුගේ නම සහ ලිපිනය දන්නේ නම් හෝ සාධාරණ උනන්දුවකින් පහසුක ලෙස දැනගැනීමට හැකි නම් ඔහුට හෝ ඇයට දිය යුතු ය ;

(ඇ) ඉඩමෙහි පදිංචි වී නැති විට සහ සාධාරණ උනන්දුවකින් අයිතිකරුගේ නම සහ ලිපිනය දැනගත නොහැකි අවස්ථාවක, ඉඩමේ හොඳින් පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය ;

(ඈ) ඉඩම යම් පොදු කටයුත්තක් සඳහා භාවිත කරන අවස්ථාවක හෝ ඒ සඳහා වෙන් කර ඇති අවස්ථාවක, ඒ කාර්යය ක්‍රියාත්මක කිරීම භාරව සිටින නිලධරයාට හෝ වෙනත් තැනැත්තාට දිය යුතු ය.

(3) විදුලි පරීක්ෂකවරයාට හෝ බලපත්‍රලාභියාට හෝ තත් කාර්යය සඳහා බලපත්‍රලාභියා විසින් ලියවිල්ලකින් බලය දී ඇති තැනැත්තාට, (1) (අ) අනුච්ඡේදයේ සඳහන් කරන ලද දැන්වීම දීමේ කාර්යය සඳහා ඉඩමට ඇතුල්වීමට හිමිකම් තිබිය යුතු ය.

(4) මේ අධිනියමයෙන් පැවරී ඇති කිසියම් බලතල යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරන අවස්ථාවක ඔහුට හෝ ඇයට ලිඛිතව බලය දෙනු ලැබූ බලපත්‍රලාභියා විසින්, එලෙස ඉඩමට ඇතුල්වීමේ ප්‍රතිඵලයක් ලෙස කර ඇති යම් හානියක් යථා තත්ත්වයට පත් කළ යුතු ය.

(5) මේ පනතින් හෝ ඒ යටතේ පැවරී ඇති කිසියම් බලතල ක්‍රියාත්මක කිරීමේ දී යම් ඉඩමකට හෝ යම් චංචල දේපළකට යම් හානියක් සිදුවූ අවස්ථාවක, ඉඩම කෙරෙහි හෝ චංචල දේපළ කෙරෙහි යම් සම්බන්ධතාවක් දක්වන යම් තැනැත්තකු විසින්, ඒ බලතල ක්‍රියාත්මක කරන ලද්දේ කවර බලපත්‍රලාභියකු වෙනුවෙන් ද ඒ බලපත්‍රලාභියාගෙන් ඒ හානිය සම්බන්ධයෙන් වන්දි අය කර ගනු ලැබිය හැකි ය ; තව ද එවැනි බලයක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් ඉඩමක හෝ චංචල දේපළක ඔහුගේ හෝ ඇයගේ භුක්ති විඳීම කෙරෙහි යම් අවහිරයක් හෝ බාධාවක් සිදුවූ අවස්ථාවක ඒ අවහිරවීම හෝ බාධාව වෙනුවෙන් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි වූ සාධාරණ වන්දියක් ඔහු හෝ ඇය විසින් ඒ බලපත්‍රලාභියාගෙන් අය කර ගනු ලැබිය හැකි ය.

9. (1) මේ උපලේඛනය මඟින් පවරා දෙන ලද ඇතුල්වීමේ බලතල වලින් කිසිවක් ක්‍රියාත්මක කිරීමට ගන්නා වෑයමක දී, බෙදා හැරීම් බලපත්‍රලාභියා විසින් පරිශ්‍රයට ඇතුල්වීම සඳහා, බලය පාවිච්චි කිරීමෙන් හැර අන්‍යාකාරයෙන් සියලු සාධාරණ උත්සාහ ගෙන තිබේ නම් සහ ඒ සියලු උත්සාහ අසාර්ථක වූයේ නම් බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්, පරිශ්‍රය පිහිටි ස්ථානය අරභයා නිසි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත, එකී පරිශ්‍රයට බලෙන් ඇතුල්වීම පිණිස බලපත්‍රලාභියාට හෝ බලපත්‍රලාභියා විසින් බලය දෙන ලද නිලධරයකුට බලය දෙන්නා වූ ආඥාවක් ලබාගැනීම පිණිස ඒකපාක්ෂික ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) ඡේදය යටතේ දෙන ලද ආඥාවක, බලපත්‍රලාභියා විසින් හෝ බලපත්‍රලාභියා විසින් බලය දෙන ලද නිලධරයා විසින් බලෙන් ඇතුල්වීම ක්‍රියාත්මක කිරීමට ගතයුතු ක්‍රියා මාර්ගය නිශ්චිතව සඳහන් විය යුතු අතර එහි, එසේ ඇතුල්වීමෙන් පසු බලපත්‍රලාභියා හෝ ඒ නිලධරයා විසින් පිළිපැදිය යුතු කොන්දේසි නියම කරනු ලැබිය හැකි ය.

(3) බලපත්‍රලාභියා හෝ බලපත්‍රලාභියා විසින් බලය දෙන ලද නිලධරයකු විසින්, බලෙන් ඇතුල්වීම සම්බන්ධයෙන් කවර හෝ තැනැත්තකුට වගකීමක් නොදැරිය යුත්තේ ය ; එසේ වුවද ඔහු හෝ ඇය විසින්—

(අ) ආඥාවේ නිශ්චිතව සඳහන් ක්‍රියා මාර්ගය හැර ඇතුළුවීම ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් ක්‍රියා මාර්ගයක් නොගත යුතු ය ;

(ආ) ආඥාවෙන් නියම කරනු ලැබ ඇති යම් කොන්දේසියක් අනුගමනය කළ යුතු ය ;

(ඇ) නිශ්චිත ක්‍රියා මාර්ගය ගැනීමේ දී සහ නියම කර ඇති යම් කොන්දේසියක් නිරීක්ෂණය කිරීමේ දී සාධාරණ ලෙස ප්‍රායෝගික අවම ප්‍රමාණයේ හානියක් පමණක් කළ යුතු ය.

(4) (අ) (1) වන ඡේදය යටතේ ආඥාවක් කිරීමට හෝ නොකිරීමට ; නැතහොත්

(ආ) එවැනි ආඥාවක නියම කරනු ලැබ ඇති නියමයන් හා කොන්දේසි පිළිබඳව,

මහෙස්ත්‍රාත් අධිකරණයේ තීරණයකට එරෙහිව අභියාචනයක් නොතිබිය යුත්තේ ය.

(5) (1) වන ඡේදය යටතේ වූ ආඥාවක් ලබා ගැනීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී බලපත්‍රලාභියකු විසින් දරන ලද යම් වියදමක්, ආඥාව අදාළ වන පරිශ්‍රයේ අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් සිවිල් ණයක් ලෙස අය කර ගනු ලැබිය යුතු ය.

10. (1) මේ උපලේඛනයෙන් පැවරුණු ඇතුල්වීම පිළිබඳ කිසියම් බලතල ප්‍රකාරව බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් බලය දුන් නිලධරයකු විසින් යම් පරිශ්‍රයකට ඇතුල්වීමක් සිදු කළ අවස්ථාවක—

(අ) ඇතුල්වීම හේතුවෙන් පරිශ්‍රය වඩා අඩු ආරක්ෂාවෙන් යුතුව නොතබන බව නිලධරයා විසින් සහතික කළ යුතු ය ;

(ආ) පරිශ්‍රයට ඇතුල්වීමේ දී හෝ මේ උපලේඛනයෙන් බලය දී ඇති යම් ක්‍රියා මාර්ගයක් ගැනීමේ දී හෝ පරිශ්‍රය සුරක්ෂිත කිරීමේ දී නිලධරයා විසින් හෝ ඔහු හෝ ඇය කැටුව යන වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් අලාභහානියක් බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් යථා තත්ත්වයට පත් කළ යුතු ය ; නැතහොත් වන්දි ගෙවිය යුතු ය.

(2) මේ උපවගන්තියෙන් පවරා දෙන ලද ඇතුළුවීමේ බලතල ක්‍රියාත්මක කරන ලද නිලධරයකු විසින්, ඇතුල්වීම කරනු ලබන්නේ කවර කාර්යයක් සඳහා ද ඒ කාර්යය සඳහා හෝ (1) වන ඡේදයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි හෝ යෝග්‍ය තැනැත්තන් කැටුව යා හැකි ය.

(3) මේ උපලේඛනය මගින් පවරා දී ඇති ඇතුල්වීමේ බලතල ක්‍රියාත්මක කරන යම් නිලධරයකුට යම් තැනැත්තෙක් හිතාමතාම විරුද්ධ වන්නේ නම් හෝ අවහිර කරන්නේ නම්, ඔහු හෝ ඇය මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුත්තේ ය.

11. බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට අයත් හෝ ඒ බලපත්‍රලාභියා විසින් පාරිභෝගිකයකුට කුලියට දී ඇති හෝ ණයට දී ඇත්තා වූ ද එහි අයිතිකරු බෙදා හැරීමේ බලපත්‍රලාභියා බව නිරූපණය කරමින් එහි ප්‍රමාණවත් සලකුණක් හෝ ලකුණක් ලකුණු කර හෝ ඔබ්බවා හෝ ඇත්තා වූ ද යම් විදුලි පිරියතක්, විදුලි මාර්ගයක් හෝ විදුලි මීටරයක්—

(අ) ඒවා පිහිටුවනු ලැබ ඇති පරිශ්‍රයේ යම් කොටසකට සවි කර හෝ තදින් යා කර තිබුණේ වී වුවද ඉඩම්හිමියාගේ සවි කිරීම් ලෙස නොසැලකිය යුතු ය ; තවද

(ආ) ඒවා තිබෙන්නේ කවර තැනැත්තකුගේ සන්තකයේ ද ඒ තැනැත්තාට එරෙහිව වූ යම් අධිකරණ ක්‍රියාවලියක් යටතේ හෝ බංකොළොත් බව ප්‍රකාශ කිරීමේ යම් නීති කෘත්‍යයක් යටතේ තහනමට ගැනීමට හෝ ඇස්කිසි කරනු ලැබීමට යටත් නොවිය යුතු ය.

III වන උපලේඛනය (31 වන වගන්තිය)

## විදුලිබල මීටර පාවිච්චි කිරීම

1. (1) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් සපයනු ලබන විදුලි බලය පරිභෝජනය කරන පාරිභෝගිකයකුගේ විදුලිය, සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් සපයන ලද විදුලිය ප්‍රමාණය සම්බන්ධයෙන් අය කරනු ලැබීමට ඇති අවස්ථාවක, පාරිභෝගිකයා සහ බෙදා හැරීමේ බලපත්‍රලාභියා අතර අන්‍යාකාරයෙන් එකඟ වී ඇත්තේ නම් මිස, අවස්ථාවෝචිත පරිදි, උචිත මීටරයක් හෝ මීටර් හරහා දිය යුතු ය ; එසේම විදුලිබල ප්‍රමාණය එමගින් ස්ථිරව දැනගත යුතු ය.

(2) මීටරය—

(අ) බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් සපයා දිය යුතු ය ; නැතහොත්

(ආ) නිදහස් සැපයුමකට සම්බන්ධිතව භාවිත කරන හෝ භාවිත කිරීමට අදහස් කර ඇති මීටරයක් පිළිබඳ කාරණයක දී පාර්ශ්වකරුවන් අතර එකඟ වී සිටින්නේ නම්, පාරිභෝගිකයා විසින් සපයා දිය යුතු ය.

(3) සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගැනීමේ දී මීටරය පරිශ්‍රයෙන් පිටත හෝ වෙනත් ඇතැම් ස්ථානයක ස්ථානගත කිරීම වඩා සාධාරණ නම් මිස, මීටරය පාරිභෝගිකයාගේ පරිශ්‍රයෙහි බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් තීරණය කරනු ලබන ස්ථානයක සවි කරනු ලැබිය යුතු ය. මේ පනතේ කාර්ය සඳහා බලපත්‍රලාභියකු විසින් පාරිභෝගිකයකු වෙත විදුලි බලය සැපයීමේ කාර්ය, පාර්ශ්වකරුවන් අතර අන්‍යාකාරයකින් එකඟ වී ඇත්නම් මිස විදුලි බලය සැපයීම මැනීම සඳහා භාවිත කරන මානන උපකරණයේ හෝ මානන උපකරණයෙන් පිට වී යන කම්බි කෙළවර, ආරම්භ වන්නා වූ ලෙස සැලකිය යුතු ය.

(4) (අ) මේ උපලේඛනයේ විධිවිධාන අනුව හෝ මේ පනත යටතේ සාදන ලද කිසියම් නියෝගවල විධිවිධාන අනුව කටයුතු කිරීම සහතික කිරීම පිණිස මීටරයක් ප්‍රතියෝජනය කිරීම අවශ්‍ය වන අවස්ථාවක ; හෝ

(ආ) වෙනත් සියලු අවස්ථාගත කරුණුවලට අනුව අන්‍යාකාරයෙන් සාධාරණ අවස්ථාවක,

(2) වන හා (3) වන ඡේදවලට අනුකූලව සපයන ලද සහ සවි කරන ලද යම් මීටරයක් ප්‍රතියෝජනය කරන ලෙස බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් නියම කරනු ලැබිය හැකි ය. තවද එසේ ප්‍රතියෝජනය කරන ලද යම් මීටරයක්, එම ඡේදවලට අනුකූලව සපයා සවි කරනු ලැබිය යුතු ය.

(5) (2) වන හා (3) වන ඡේදවලට අනුකූලව සපයා සවි කරන ලද උචිත මීටරයක් හරහා මහුගේ හෝ ඇයගේ විදුලි සැපයුම ලබා ගැනීමට පාරිභෝගිකයා ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ පැහැර හරින්නේ නම්, සැපයුම්කරු විසින් සැපයුම දීම ප්‍රතික්ෂේප කළ හැකි ය ; නැතහොත් සැපයුම විසන්ධි කළ හැකි ය.

(6) මේ ඡේදයේ කාර්ය සඳහා මීටරයක්, සැපයුම සම්බන්ධයෙන් අය කිරීම් කරනු ලැබිය යුත්තේ කවර නියමයන් මත ද ඒ නියමයන් කෙරෙහි සැලකිල්ල ඇතිව, එම ප්‍රයෝජනය සඳහා යෝග්‍ය ආකාරයක හෝ නිෂ්පාදනයක මීටරයක් වේ නම්, එය යම් සුවිශේෂ විදුලි සැපයුමක් සම්බන්ධයෙන් භාවිත කිරීම සඳහා උචිත මීටරයක් වේ.

(7) මේ ඡේදය යටතේ පැන නගින්නා වූ යම් ආරාවුලක් 35 වන වගන්තිය යටතේ තීරණය කරනු ලැබීමේ අපේක්ෂාවෙන්, කොමිෂන් සභාව විසින්, මීටරයක් සැපයීමට හෝ සවි කිරීමට අදාළ විධාන දෙනු ලැබිය හැකි අතර, මේ ඡේදය යටතේ වූ විධාන යම් සුවිශේෂ විස්තරයක මීටර් පිළිබඳ කාරණාවල දී හෝ සුවිශේෂ කාරණාවල දී යන දෙකෙන් කවරක් සඳහා හෝ අදාළ විය හැකි ය.

(8) මේ උපලේඛනයෙහි "නිදහස් සැපයුම" යන්නෙන්—

(අ) පරිශ්‍රය, ගෘහ කාර්ය සඳහා සම්පූර්ණ ලෙස හෝ ප්‍රධාන ලෙස භාවිත කරන පරිශ්‍රයක් නොවන අවස්ථාවක ; හෝ

(ආ) සැපයුම්කරු හෝ පාරිභෝගිකයා එම ස්ථානවලට විදුලිය සැපයීම පිණිස වූ නිදහස් කිරීමකින් බලය දෙනු ලැබ ඇති තැනැත්තකු වන අවස්ථාවක,

යම් පරිශ්‍රයකට විදුලි බලය සැපයීම අදහස් වේ.

2. (1) බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් පාරිභෝගිකයකුට සපයනු ලබන විදුලිබල ප්‍රමාණය සහතික ලෙස දැනගැනීම සඳහා—

(අ) මීටරය අනුමත ආකාරයක හෝ නිෂ්පාදනයක සහ අනුමත කරන ලද ආකාරයකින් සවි කර ඇත්තේ නම් මිස ; සහ

(ආ) (2) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව 4 වන අයිතමය යටතේ සහතික කර ඇත්තේ නම් මිස,

කිසිදු මීටරයක් භාවිත කරනු නොලැබිය යුතු ය. තව ද මෙම උපලේඛනයේ "අනුමත කරන ලද" යන්නෙන්, මෙම පනත යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව කොමිෂන් සභාව විසින් අනුමත කිරීම අදහස් වේ.

(2) බෙදා හැරීමේ බලපත්‍රලාභියා සහ පාරිභෝගිකයා (1) (ආ) අනුඡේදයේ නියමයන් අතහැර දැමීමට ලියවිල්ලකින් එකඟ වී ඇත්තේ නම්, ඒ අනුඡේදයේ විධිවිධාන නිදහස් සැපයුමක් සම්බන්ධිතව භාවිත කරනු ලබන මීටරයකට අදාළ නොවිය යුතු ය.

(3) (අ) නියෝග මගින් හෝ නියෝග යටතේ දෙනු ලබන අනුමත කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම සඳහා ;

(ආ) යම් සුවිශේෂ ආකාරයක හෝ නිෂ්පාදනයක මීටරයක් සඳහා එසේ දෙන ලද අනුමතයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා සහ සවි කරනු ලැබ ඇති ඒ ආකාරයේ හෝ නිෂ්පාදනයේ මීටර් වෙනුවට, වෙනත් අනුමත ආකාරයක හෝ නිෂ්පාදනයක මීටර් නියමිත කාලසීමාවක් තුළ දී ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ;

(ඇ) යම් සුවිශේෂ ආකාරයක සවි කිරීමකට එලෙස දෙන ලද අනුමතයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා සහ ඒ ආකාරයෙන් නම් කරන ලද මීටර්, නියෝගවල නිශ්චිතව සඳහන් කාලසීමාවක් තුළ දී අනුමත කළ වෙනත් ආකාරයකින් සවි කිරීම නියම කරමින්,

නියෝගවල විධිවිධාන සලස්වනු ලැබිය හැකි අතර, වෙනස් විස්තරවල මීටර් සඳහා හෝ වෙනස් කාර්යයන් සඳහා භාවිත කරන හෝ භාවිත කිරීමට අදහස් කරන මීටර් සඳහා වෙනස් වෙනස් විධිවිධාන සාදනු ලැබිය හැකි ය.

**3.** (1) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින්, සපයන ලද විදුලිබල ප්‍රමාණය සහතික ලෙස දැනගැනීම සඳහා භාවිත කෙරෙන මීටරයක් හරහා විදුලිය සපයන අවස්ථාවක සහ—

(අ) මීටරය අනුමත කළ ආකාරයක හෝ නිෂ්පාදනයක මීටරයක් නොවන විට හෝ එය අනුමත කළ ආකාරයකින් සවි කරනු ලැබ නැති විට ; හෝ

(ආ) 1 වන අයිතමයේ (2) (ආ) අනුඡේදයේ සඳහන් මීටරයක් පිළිබඳ කාරණයක දී හැර, එය 4 වන අයිතමය යටතේ සහතික කර නොමැති විට,

බෙදා හැරීමේ බලපත්‍රලාභියා මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු, වෙනත් යම් තැනැත්තකුගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් හේතුවෙන් මේ අයිතමය යටතේ වරදකට වරදකරු වන අවස්ථාවක, ඒ වෙනත් තැනැත්තා ද වරදට වරදකරු විය යුතු ය ; තවද පළමුවෙන් සඳහන් කළ තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පවරා ඇත්තේ වුව ද නොවුව ද මේ ඡේදයේ බලය ප්‍රකාරව ඒ වෙනත් තැනැත්තාට විරුද්ධව නඩු පවරා වරදට වරදකරු කරනු ලැබිය හැකි ය.

(3) මේ අයිතමය යටතේ වරදක් සම්බන්ධයෙන් වූ යම් නඩු කටයුත්තක දී, වරද සිදු කිරීම මග හැරීම සඳහා ඔහු හෝ ඇය විසින් සියලු සාධාරණ පියවර ගත් බව සහ සියලු නිසි උද්‍යෝගයකින් ක්‍රියා කළ බව ඔප්පු කිරීම නඩු පවරනු ලැබූ තැනැත්තා සඳහා විත්තිවාචකයක් විය යුත්තේ ය.

(4) මේ ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව වෙනුවෙන් හැර, කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

**4.** (1) මීටර්වල හරි වැරදි බලා සහතික කිරීම පිණිස කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය.

(2) (අ) යම් මීටරයක් අනුමත කළ ආකාරයේ හෝ නිෂ්පාදනයේ නම් මිස ; සහ

(ආ) නියෝගවලින් නියම කරනු ලබන පරිදි, මීටරය (ආන්තරික වැරදිවලට යොමුව සාදන ලද ප්‍රමිති ද ඇතුළුව) ඒ ප්‍රමිතිවලට අනුකූල නම් මිස,

කිසිදු මීටරයක් (1) වන ඡේදයට අනුකූලව සහතික කරනු නොලැබිය යුතු ය.

(3) වෙනස් විස්තරවල මීටර් සඳහා වෙනස් විධිවිධාන සලස්වාලමින් සහ වෙනස් වෙනස් කාර්ය සඳහා භාවිත කරන හෝ භාවිත කිරීමට අදහස් කරන මීටර් සඳහා විධිවිධාන සලස්වාලමින් නියෝග සාදනු ලැබිය හැකි අතර, පහත දැක්වෙන විධිවිධාන ද ඊට ඇතුළත් විය හැකි ය :—

(අ) නියමිත ප්‍රමිතිවලට තවදුරටත් අනුකූල නොවන මීටර් සම්බන්ධයෙන් සහතික කිරීම අවසන් කිරීම සඳහා ; සහ

(ආ) මීටර් පරීක්ෂා කිරීම, හරි වැරදි බැලීම සහ සහතික කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම සඳහා සහ ඒවා ගෙවිය යුත්තේ කවර තැනැත්තන් විසින් ද යන වගට ; සහ

(ඇ) මීටර් පරීක්ෂා කිරීමේ දී, හරි වැරදි බැලීමේ දී සහ සහතික කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය පිළිබඳව.

**5.** (1) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් සපයනු ලබන විදුලි බලය පරිභෝජනය කරන පාරිභෝගිකයකුගේ විදුලිය සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් සපයන ලද විදුලිය ප්‍රමාණයට සම්බන්ධයෙන් අය කරනු ලැබීමට ඇති අවස්ථාවක, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් එහි සාමාන්‍ය ක්‍රියාවලිය තුළ දී පාරිභෝගිකයා විසින් පරිභෝජනය කර ඇති විදුබල ප්‍රමාණය තක්සේරු කොට, තක්සේරු කළ විදුලිබල පරිභෝජනයේ ප්‍රමාණය සාධාරණ කාලසීමාවක් තුළ දී මීටර් කියවීමක් මගින් තහවුරු කරන තාක් කල් ඒ අනුව ගාස්තු අය කර ගනු ලැබිය යුතු ය.

(2) (අ) (යම් පාරිභෝගිකයකුට සපයන ලද විදුලියේ ප්‍රමාණය ගණන් බලනු ලබන) මීටරයක පරිභෝජනය වැරදි ලෙස සටහන් වන බව ඔප්පු වූ විටක දී ; හෝ

(ආ) යම් මීටරයක් ක්‍රියා විරහිත වූ විටක දී ; හෝ

(ඇ) යම් පරිශ්‍රයකට සපයනු ලබන විදුලියේ ප්‍රමාණය මැනීම සඳහා භාවිත කරන යම් මීටරයක සටහන් වන සංඛ්‍යා යම් තැනැත්තකු විසින් වෙනස් කරන විටක දී,

පරිභෝජනය තක්සේරු කර ඒ අනුව ගාස්තු අය කර ගැනීමට බෙදාහැරීමේ බලපත්‍රලාභියාට අයිතිය තිබිය යුතු ය.

(3) (1) වන හෝ (2) ඡේදවලට අනුකූලව බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් විදුලි පරිභෝජනය තක්සේරු කර ඇති අවස්ථාවක, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් සකස් කරන ලද ඇස්තමේන්තුවට අනුකූලව පරිභෝජනය කරන ලද විදුලිය සඳහා හෝ ආරවුල් විසඳීමට අදාළ විධිවිධානවලට අනුකූලව අන්‍යාකාරයෙන් තීරණය කරනු ලබන පරිදි පාරිභෝගිකයා විසින් ගෙවීම් කරනු ලැබිය යුතු ය.

**6.** (1) මේ අයිතමය යම් පරිශ්‍රයකට සපයන ලද විදුලියේ ප්‍රමාණය සහතික ලෙස දැනගැනීම සඳහා භාවිත කරන මීටර්වලට අදාළ වේ.

(2) මේ අයිතමය අදාළ වන මීටරයක සටහන්වීම ඒ මීටරය හරහා සපයන ලද විදුලියේ ප්‍රමාණය පිළිබඳ සාක්ෂියක් ලෙස අධිකරණයේ කවර හෝ නඩු කටයුත්තක දී ආවේශ විය යුතු ය.

(3) අනුමත කළ ආකාරයක හෝ නිෂ්පාදනයක වූ ද අනුමත කරන ලද ආකාරයකින් සවි කරනු ලැබ ඇත්තා වූ ද මීටරයක් හරහා කිසියම් කාලසීමාවක් සඳහා විදුලි බලය සපයනු ලැබ ඇති අවස්ථාවක, මීටරයේ සටහන්වීම, ඒ කාලසීමාව තුළ දී—

(අ) නියමිත ආන්තික වැරදි ඇතුළත ; සහ

(ආ) නිදහස් සැපයුමක් සම්බන්ධයෙන් වන විට භාවිත කරන ලද මීටරයක් පිළිබඳ කාරණයක දී එකග වූ ආන්තික වැරදි ඇතුළත,

සටහන් වී ඇති ලෙස උපකල්පනය කළ යුතු ය.

(4) මේ ඡේදය අදාළ වන මීටරයක් මගින් යම් කාලසීමාවක් සඳහා—

(අ) නියමිත ආන්තික වැරදි ඇතුළත ; සහ

(ආ) නිදහස් සැපයුමක් සම්බන්ධයෙන් වන විට, භාවිත කරන ලද මීටරයක් පිළිබඳ කාරණයක දී එකඟ වූ ආන්තික වැරදි ඇතුළත,

සටහන් වී ඇති ලෙස උපකල්පනය කරනු ලබන අවස්ථාවක, ඒ කාලසීමාව තුළ දී ඒ මීටරය හරහා සපයන ලද විදුලියේ ප්‍රමාණය මීටරයෙහි වැරදි ලෙස සටහන් වන බව ඔප්පු කිරීම පාරිභෝගිකයා මත පැවරෙන භාරයක් විය යුත්තේ ය.

7. (1) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් සපයන විදුලි බලය පරිභෝජනය කරන පාරිභෝගිකයකු විසින්, ඔහුට හෝ ඇයට සපයනු ලබන විදුලි බලයේ ප්‍රමාණය නිවැරදි ලෙස සටහන් වීමට හැකි වනු පිණිස ඔහුට හෝ ඇයට අයිති යම් මීටරයක් ඔහුගේ හෝ ඇයගේ වියදමින් සියලු කල්හිම නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු ය. ඔහු හෝ ඇය විසින් එසේ කිරීම පැහැර හරිනු ලැබුවහොත් ඒ මීටරය හරහා විදුලි බලය සැපයීම විසන්ධි කරනු ලැබිය හැකි ය.

(2) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් යම් පාරිභෝගිකයකුට බලපත්‍රලාභියාගේ වියදමින් සපයනු ලබන කුලියට හෝ ණයට දුන් යම් මීටරයක් විදුලි බලයේ ප්‍රමාණය නිවැරදි ලෙස සටහන්වීමට හැකි වනු පිණිස නිසි තත්ත්වයෙන් සියලු කල්හිම පවත්වාගෙන යා යුතු අතර, කලින් ගෙවන මීටර් සම්බන්ධයෙන් වන විට, අවශ්‍ය ගෙවීම් ලැබුණු විට නිසි ලෙස ක්‍රියාත්මක කළ යුතු ය.

(3) බලපත්‍රලාභියා විසින් පාරිභෝගිකයකුට සපයන විදුලියේ ප්‍රමාණය සටහන් වන යම් මීටරයක් ඉවත් කිරීමට, පරීක්ෂා කිරීමට සහ නැවත සවි කිරීමට බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට බලය ඇත්තේ ය. එවැනි මීටරයක් ඉවත් කරනු ලැබූ විට, ඒ ස්ථානයෙහි ආදේශිත මීටරයක් සවි කරනු ලැබිය යුතු අතර, මීටරය ඉවත්කර ගැනීමේ, පරීක්ෂා කර බැලීමේ සහ ආදේශිත මීටරය සවි කිරීමේ පිරිවැය බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් දැරිය යුතු ය.

(4) (2) වන හා (3) වන ඡේදවල විධිවිධාන, මීටරය පිළිබඳ නිසි සැලකිල්ල දැක්වීම පැහැර හැරීම වෙනුවෙන් පාරිභෝගිකයකුට විරුද්ධව බෙදා හැරීමේ බලපත්‍රලාභියාට ඇති යම් ප්‍රතිකර්මයකට හානියක් නොමැතිව විය යුතු ය.

8. (1) යම් තැනැත්තකු චේතනාන්විතව හෝ නොසැලකිලිමත්ව—

(අ) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් යම් පරිශ්‍රයකට සපයනු ලබන විදුලිබල ප්‍රමාණය මැනීම සඳහා කරන යම් මීටරයක සටහන්වීම වෙනස් කළහොත්; හෝ

(ආ) එවැනි යම් මීටරයක, ඒ මීටරය හරහා සපයනු ලබන විදුලිබල ප්‍රමාණය නිසි ලෙස සටහන්වීම වැළැක්වුවහොත්,

ඔහු හෝ ඇය මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ වූ වරදකට යම් තැනැත්තකුට විරුද්ධව අපරාධ නඩුවක් පවරන ලද අවස්ථාවක—

(අ) මීටරය ඔහුගේ හෝ ඇයගේ භාරයේ, ඔහුගේ හෝ ඇයගේ පාලනය යටතේ පවතින බවට වූ සාක්ෂිය; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, මීටරයේ සටහන්වීමෙහි වෙනස් කිරීමක් සිදු කිරීම සඳහා වූ උපක්‍රමයක් ඔහු හෝ ඇය සන්තකයේ තිබෙන බවට හෝ මීටරයෙහි නිසි ලෙස සටහන්වීම වළක්වාලීම සඳහා වූ උපක්‍රමයක් තිබෙන බවට වූ සාක්ෂිය,

ඔහු හෝ ඇය විසින් වෙනස් කිරීම හෝ වැළැක්වීම චේතනාන්විතව කර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(3) (1) වන ඡේදය යටතේ වූ වරදකට පාරිභෝගියකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් පාරිභෝගිකයාගේ පරිශ්‍රයට සපයා ඇති සැපයුම විසන්ධි කර වරද කරනු ලැබීම සම්බන්ධයෙන් මීටරය ගලවා ගෙන යා හැකි ය.

(4) බෙදාහැරීමේ බලපත්‍රලාභියකු විසින් (3) වන ඡේදය යටතේ මීටරයක් ඉවත් කරනු ලැබූ අවස්ථාවක, බලපත්‍රලාභියා විසින් ඒ මීටරය, විනාශ කිරීමට හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීමට කොමිෂන් සභාව විසින් බලය දෙන තෙක් බලපත්‍රලාභියාගේ භාරයේ තබාගත යුතු ය.

9. (1) කලින් ගෙවන මීටරයක් හරහා ඔහුගේ හෝ ඇයගේ විදුලිය සැපයුම ලබා ගන්නා, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් සපයන විදුලිය පරිභෝජනය කරන විදුලි පාරිභෝගිකයෙක්, ඒ මීටරයට ඇතුල් කරනු ලබන යම් මුදල් හෝ ටෝකන ආරක්ෂා සහිතව තැබීමට සියලු සාධාරණ පූර්වාරක්ෂණ ගැනීම පිණිස වූ වගකීමකින් බැඳී සිටිය යුතු ය.

(2) පාරිභෝගිකයාගේ අවසරය ඇතිව හැර, කලින් ගෙවන මීටරයක්, බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට පාරිභෝගිකයකුගෙන් විදුලි බලය සැපයීම වෙනුවෙන්, විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් සැපයීම වෙනුවෙන් හෝ මීටරය සැපයීම වෙනුවෙන් අයවිය යුතු මුදල් හැර අන්‍යාකාරව ලැබිය යුතුව ඇති යම් මුදලක් අය කර ගැනීම පිණිස භාවිත කරනු නොලැබිය යුතු ය.

IV වන උපලේඛනය (31 වන වගන්තිය)

## ප්‍රරක්ෂණය

1. විදුලි බලය සම්ප්‍රේෂණය කිරීමට, උත්පාදනය කිරීමට, බෙදා හැරීමට හෝ සැපයීමට බලපත්‍රයක් මගින් බලය ලැබී ඇති හෝ බලපත්‍රයක් අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබ ඇති තැනැත්තකු විසින්—

(අ) විදුලි බලය උත්පාදනයේ දී, සම්ප්‍රේෂණය කිරීමේ දී, බෙදා හැරීමේ දී හෝ සැපයීමේ දී, ස්වභාවික අලංකාරය සුරක්ෂිත කිරීමේ, වෘක්ෂලතා, වනජීවීන් හා භූවිද්‍යාත්මක හෝ භූ-රූපණ විද්‍යාත්මක විශේෂ ලක්ෂණ සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ද කෘෂිකාර්මික, ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුත් ස්ථාන, ගොඩනැගිලි හා දේපළ ආරක්ෂා කිරීම පිළිබඳව ද සැලකිල්ල දැක්විය යුතු ය; තව ද

(ආ) විදුලි බලය උත්පාදනය, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම හෝ සැපයීම කරණකොටගෙන රට තුළ පවත්නා ස්වාභාවික අලංකාරයට හෝ වෘක්ෂලතාදියට, වනජීවීන්ට, භූමි ලක්ෂණයට, දර්ශනීය ස්ථානයන්ට, ගොඩනැගිලිවලට හෝ දේවලට සිදු විය හැකි යම් බලපෑමක් හැකි තරම් අඩු කිරීම පිණිස සාධාරණ ලෙස තැනැත්තාට ගත හැකි සියලු පියවර ගත යුතු ය.

2. (1) එක ඡේදයට අගතියක් නොමැතිව, විදුලි බලය සම්ප්‍රේෂණයට, උත්පාදනයට, බෙදා හැරීමට හෝ සැපයීමට බලපත්‍රයක් මගින් බලය දී ඇති තැනැත්තකු හෝ බලපත්‍රයක් ලබාගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබ ඇති තැනැත්තකු සහ කොමිෂන් සභාව, අවස්ථාවෝචිත පරිදි විදුලි බලය උත්පාදනයේ දී, සම්ප්‍රේෂණය කිරීමේ දී, බෙදා හැරීමේ දී හෝ සැපයීමේ දී හෝ කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ දී මත්ස්‍ය කර්මාන්තයට හෝ කිසියම් ජලාශයක ඇති මත්ස්‍ය සම්පතට හෝ හානියක් වීම වැළැක්වීම පිණිස සාධාරණ ලෙස ප්‍රායෝගික වන තාක් දුරට ගත හැකි පියවර ගත යුතු ය.

3. (1) කොමිෂන් සභාව මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන අවස්ථානුගත කරුණුවල දී, අදාළ ජල අධිකාරිය විමසා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව, ජල මාර්ග සහ ජලතල මාර්ග ඉදි කිරීමට ද තම බලපත්‍රලාභියකුට හිමිකම තිබිය යුතු අතර අදාළ ජල අධිකාරිය විසින් ඒ අයිතිය අසාධාරණ ලෙසින් රීට අහිමි නොකළ යුතු ය.

(2) මේ අයිතමයේ කාර්යය සඳහා අදාළ ජල අධිකාරිය යන්නෙන්, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන පරිදි වූ අධිකාරිය අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල හැන්සාඩ් කොටස්වල සහ පත්‍රවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.